ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ ජනවාරි 04 ඉරිදා 149 වෙළුම 31 කලබ සතිපතා පත්‍රය - පිටු 28 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## සුබ නව වසරක් වේවා !



**නත්තල් සහ අවුරුදු ආසිරි පැතූ සියල්ලන්ට හද බැති තුති!**

ප්‍රධාන කතෘ ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා,
ශිරාන් මෛත්‍රී, කුමර නයනජිත්, ලියෝ එෆ්. දිසානායක,
තිළිණ අලහකෝන්, ලතා ප්‍රනාන්දු, ක්‍රිශාන්ති පෙරේරා,
සුරේෂ් දර්ශන, තිලින්ද රන්දීර්, ඩිවුලින් මිරාල් ඇතුළු
'ඥානාර්ථ ප්‍රදීපය' කාර්ය මණ්ඩලයෙන්


**සැරදේ! සිරිනි සැරදේ ! ලක් දෙරණට පා තබනා අති උදාර සසුන් පියා සැරදේ!**

# නිදහස් සහ සාධාරණ මැතිවරණයකට විනිවිද භාවයකින් ප්‍රතිපත්ති රකින්න

## කතෝලික රදගුරු සම්මේලනයෙන් ආයාචනාවක්!

**බියෙන් හා බලපෑමෙන් තොරව තම ඡන්දය ප්‍රකාශ කිරීම සෑම පුරවැසියකුටම ඇති අනන්‍යසන්තක අයිතිය හා එම අයිතිය ගරු කිරීම නැවත නැවත අවධාරණය කරමින් එකී ක්‍රියාදාමය තුළ සාධාරණත්වය ඉතා ඉහළින්ම තබා මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය සියලුම සහයෝගය අදාළ අංශ වෙත ලබා දිය යුතු බවත් මැතිවරණයට අදාළ සියලු නීති රීති ගරු කරමින් එම ක්‍රියාදාමය තුළ නිදහස් හා සාධාරණ ජනාධිපතිවරණයකට ප්‍රතිපත්තින් රකින මෙන් ජනාධිපති අපේක්ෂකයන්ගෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩලය ආයාචනාවක් කර සිටී.**

මේ වෙනුවෙන් සියලු රදගුරු හිමිපාණන්ගේ අත්සන් සහිතව විශේෂ නිවේදනයක් නිකුත් කරන රදගුරු මඬුල්ල සෑම මට්ටමකින්ම පූර්ව හා පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිටු දැකිය යුතු යැයිද තවදුරටත් අවධාරණය කරයි. (නිවේදනය මැද පිටුවේ)



**සසුන් පිය ධජ සෑම නිවසකම ඔසොවා තබන්න**

**අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියාණන්ගේ ශ්‍රී ලංකා ගමන නිමිත්තෙන් ජනවාරි 01 දා සිට සෑම කතෝලික නිවසකම කතෝලික කොඩිය සහ පාප් කොඩිය ඔසවා තබන මෙන් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සැදැහැවත් ජනතාවගෙන් ඉල්ලීමක් කරති. ඒ අතරම පොදු ආයතනවල සහ පාසල්වල ද එම කොඩි ඔසවා තබන මෙන් තවදුරටත් මතක් කර සිටී.**

# පනස් වසරක සේවාවට සමුදුන් කැමිලස් පෙරේරා මහතාට තුති මල්!



කොළඹ කතෝලික මුද්‍රණාලයේ පරිපාලන කළමනාකරු සී. එස්. කැමිලස් පෙරේරා මහතා ඉකුත් දා ඉසිඹු ලැබුවේය.

15 පිටුවට »


## නව අවුරුදු ආසිරි!



මනුසත සිත මෙත් මුදිතා කරුණා ගුණ දහමෙන් ප්‍රමුදිත වේවා
සතුට සාමයේ හසරැළි සැමගේ මුවගින් නිතරම දිස් වේවා
තමකම මත නොව සොහොයුරු පෙම තුළ බැඳී වෙළී ජීවත් වේවා
දැහැමෙන් පිරිපුන් සැබෑම වෙනසක් මේ නව වසරේ සිදු වේවා

**පමුණුගම - බෙනී ජයමාන්න**

## 50 වසරක් පූජක සිසු දරුවන්ගේ නැණස පෑදු ගුරු පියා සග සැපතට



පුරා අවුරුදු 50 ක් තුළ බොරැල්ල සා. ඇලෝසියස් දෙවිසත්හලේ පූජක සිසු දරුවන්ගේ නැණ නුවණ පෑදු කැලණිය දළුගම ප්‍රැන්සිස් පෙරේරා ගුරු පියා ස්වර්ග ස්ථ වූ බව ප්‍රදීපය සංවේගයෙන් ප්‍රකාශ කරන්නීය. එතුමන්ගේ ආත්මයට සග සුව පතා සැදැහැවතුන්ගෙන් යැදුම් අයදින්නීය.

## ගං වතුරින් පීඩාවට පත්වූවන්ට ආධාර කරන්න



ගංවතුරින් පීඩාවට පත් අනුරාධපුර, හලාවත හා බදුල්ල පදවිවල ජනතාවට හැකි විගසින් ආධාර කෙරුමට ඇඳ ඇතිරිලි, කොට්ට, මෙට්ට, තුවා ආදිය ඇතුළු වියළි සලාක ද්‍රව්‍ය මීසම් මට්ටමින් එක්රැස් කොට අගරදගුරු පදවි භාණ්ඩාගාරික පියතුමන්ට ලබා දෙන මෙන් සෙත් සරණ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා සැදැහැ සිතැති සැමගෙන් ඉල්ලා සිටී.

## 2015 නව වසර




අනතුරු සතුරු මැර බිය ජල බිය මේවා
රහසක් නොවේ අප හැමටම බල පෑවා
පසුගිය වසරේ සිදුවුන කෙනහිලි නේවා
ලක් වැසි සැමට ශුභ අවුරුද්දක් වේවා

හර බර ලිපි වලින් පුබුදන ප්‍රදීපයෙන්
හැමටම සුභ පතයි හද පිරි දයාවකින්
ප්‍රදීපයට අත හිත දුන් හැමෝම ගෙන්
ඉල්ලමු පතුරන්ට කිතු හඬ විශේෂයෙන්

**කඩවත - බෙනඩික් විජේසිංහ**

Verbum Television ප්‍රථම කතෝලික රූපවාහිනී නාලිකාව

ජනවාරි 30 දින සවස 4.30 සිට සජීවීව Peo TV සහ Dialog TV තුළින් ඔබ වෙත ගෙන එනු ලබයි.

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

## පදවියෙන් පදවියට

### රදගුරු හිමි තරුණ හමුවක

සලාපුර රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ කටුනේරිය මීසමේ තරුණ ප්‍රශ්න සාකච්චා කරමින් සුහද හමුවක් පැවැත්වූහ.

**රෙක්ස් හැරිසන්**

# දේව ආදරය ජීවමාන කරන තරමට අපට හැමදා නත්තල අත්දකින්න ලැබෙනවා

## අගරදගුරු හිමිපාණෝ කඩලානේ දී අනාවරණය කරති

**නත්තල යනු ප්‍රේමයයි. ප්‍රේමය තුළින් අපි අපේ ලෝකය පුළුල් කර ගත යුතුයි; අපි අන් අයට ප්‍රේම කරන තරමට ම දෙවියන් වහන්සේ අපට ආශිර්වාද කරනවා. විපුල වරප්‍රසාද ලබා දෙනවා. දේව ආදරය ජීවමාන කරන තරමට අපට සැමදාම නත්තල අත්විඳින්න ලැබෙන බව කඩලාන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දී මධ්‍යම රාත්‍රි නත්තල් දේව මෙහෙයේ විශේෂ දේශනය කරමින් කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

මධ්‍යම රාත්‍රි දිව්‍ය පූජාව ජාතික රූපවාහිනිය හා ගුවන් විදුලිය මගින් සජීවීව විකාශනය වූ අතර මොරටුව දිසා නායක කඩලාන මීසම් සේවක අතිගරු ලලිත් පෙරේරා පියතුමාගේ උපදෙස් පරිදි සහයක ගරු දිනේෂ් ප්‍රශාන්ත් පියතුමා පැවිදි සොයුරියන් මීසමේ සැදැහැවතුන් හා එක්ව අර්ථාන්විත ආකාරයට සංවිධානය කර තිබුණි.

**සුමිත් මාර්ක් ද සිල්වා**

### ශුභාශිංසන




ගාල්ල විශ්‍රාමික රදගුරු අතිඋතුම් එල්මෝ පෙරේරා හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය ජනවාරි 06 දාටද, කුරුණෑගල විශ්‍රාමික රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ නාම සාන්තුවර මංගල්‍යය ජනවාරි 07 දිනට ද යෙදේ. එතුමනට සමිඳු ආසිරි බහුලව ලැබේවායි ප්‍රදීපය ශුභාශිංසන පිරිනැමේ.

# දරුවා තුළ ආධ්‍යාත්මික සංවේදිතාව ගොඩනැගීම දහම් ගුරුවරයාගේ සුවිශේෂ වගකීමයි

දහම් ගුරු සේවාවේ මූලික පරමාර්ථය දරුවා ධර්මය තුළ පිහිටුවා අධ්‍යාත්මිකව පෝෂණය කිරීමයි. ධර්මය දැකීමත් සිසුවා තුළ ඇතිකිරීමත්, දේව සබඳතාවය තුළ දරුවා පිහිටුවීමට අවැසි අධ්‍යාත්මික සංවේදිතාවය ගොඩනැගීමත් දහම් ගුරුවරයාගේ සුවිශේෂි වගකීම යැයි අනුරාධපුර රදගුරු අතිඋතුම් නෝබට් එම්. අන්ද්‍රාදි නි.ම.නි හිමිපාණෝ අනුරාධපුර පදවි 2014 කතෝලික දහම් ගුරු නත්තල් හමුවේදී ප්‍රකාශ කළහ.

උන්වහන්සේ එහිදී වැඩිදුරටත් මෙසේද පැවසූහ. දේව සබඳතාවයේ දරුවන් පිහිටුවීමට නම් දහම් ගුරු ජීවිත වලින් ඒ දේව සබඳතාවය විද්‍යමාන විය යුතුයි. දරුවාගේ පරමාදර්ශි චරිතය දහම් ගුරුතුමා ගුරුතුමිය බවට පත්විය යුතුයි. ඒ සඳහා විශ්වාසයේ දේව දීමනාව දහම් ගුරුවරුන් සන්තක කරගත යුතුයි.

මේ අවස්ථාවට පදවියේ දහම් ගුරුවරු විශාල පිරිසක් එක්වූහ.

**ජෝර්ජ් අයිවන් රෙක්සි**



නාත්තන්ඩිය මීසමේ තල්ග ස්අගාර සා. ප්‍රන්සිස් සේවියර් මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය වෙනුවෙන් සැඳෑ මෙහෙය පැවැත්වීම සඳහා ගවහලක් මංඩපය ලෙස සකසන ලදි. සහයක ගරු ජූඩ් චානක පියතුමන්ගේ අනුශාසකත්වයෙන් තරුණ සමිතිය විසින් මෙය නිර්මාණය කරන ලදි.

**ශ්‍රියාංගණී ෆිලීසියා**

# පන්සලේ සිට දෙව්මැඳුරට නත්තල් බැති ගී චාරිකාවක්!

බොදුනු කිතුනු සමගිය කදිමට පෙන්නුම් කෙරෙන නත්තල් බැති ගී චාරිකාවක් හැඳල බලගල ප්‍රදේශයේදී දැකගත හැකිවිය. බලගල අශෝකාරාම විහාරස්ථානයේ සිට බලගල සදාසරණ දේවස්ථානය දක්වා ගමන් ගත් මෙම නත්තල් බැති ගී චාරිකාව සංවිධානය කරන ලද්දේ බලගල දීපාලෝක සුබසාධක සංගමය විසිනි.

දීපාලෝක සුබ සාදක සංගමයේ ඉල්ලීමක් මත නත්තල් බැති ගී චාරිකාව වෙනුවෙන් විශේෂ නත්තල් ගසක් විහාරස්ථාන භූමියේ ඉදිකර තිබිණ. නත්තල් ගසේ විදුලි ආලෝකය විවෘත කිරිම විහාරාධිපති පූජ්‍ය බටගල්ලේ පඤ්ඤාකිත්ති ස්වාමින් වහන්සේ සහ බලගල මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරින.

දීපාලෝක සුබ සාධක සංගමයේ සාමාජික සාමාජිකාවන් විහාරස්ථාන භූමියේ නත්තල් කැරොල් ගී ගායනා කිරීමෙන් අනතුරුව නත්තල් බැති ගී චාරිකාව ආරම්භ කෙරුනේ බොදු කිතුනු ආගමික නායකයින් දෙපල පෙරටු කොටගෙනය. බලගල සදාසරණ දේවස්ථාන භූමියෙන් නිමාවට පත්වූ නත්තල් බැති ගී



චාරිකාවට බලගල දීපාලෝක සුබ සාධක සංගමයේ සභාපති මෙරිල් වික්‍රමසිංහ මහතා ඇතුළු සාමාජික සාමාජිකාවෝද බොදු කිතුනු ප්‍රදේශවාසීහුද සහභාගි වුහ.

බැති ගී චාරිකාවෙන් අනතුරුව දේවස්ථාන භූමියේ නත්තල් බැති ගී සංදර්ශනයක් පැවැත්වින. මේ අවස්ථාවට නායකකන්ද සහයක ගරු ඉසිර ජයසූරිය පියතුමාද, බස්නාහිර පළාත් සභාවේ හිටපු ඇමති දීපාලෝක සාමාජික ලෝරන්ස් මාදිවල මහතාද සහභාගි විය.

**සටහන හා සේයා - නිමල් පෙරේරා**

# පන්නිපිටියේ කැරොල් ගායනා වැඩසටහනක්!

නත්තලේ එකමුතුව සහ අවබෝධය සංකේතවත් කරමින් මීසමේ දෙව්මැඳුර වල තරුණ ගායනා කණ්ඩායම් එකමුතු කැරොල් ගායනාවක් සඳහා මෙවර පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරට එක් වූහ. ගැයුමින්, යැදුමින් සහ පරිත්‍යාගයෙන් යුතුව ගරු ටිරෝන් පෙරේරා සහ ගරු තුසිත සෝලංගාරච්චි මීසම් සේවක පියවරුන් විසින් දියත් කරන ලද මෙවර නත්තල් වැඩ සටහනේ එක් අංගයක් ලෙස මෙම කැරොල් ගායනා වැඩසටහන පැවැත්විණ.

මීසමේ තරුණ කණ්ඩායම් උනන්දුවකින් යුතුව මෙවර කැරොල් ගායනාවලට එක් වූ අතර හොඳම ගායනා කණ්ඩායම තෝරා ගැනීමක්ද සිදුවිය. ඒ අනුව ප්‍රථම ස්ථානය මත්තේගොඩ තරුණ කණ්ඩායම දිනා ගත් අතර රුක්මල්ගම සහ පන්නිපිටිය කණ්ඩායම් පිළිවෙලින් ඊළඟ ස්ථාන දිනා ගත්හ. මීසමට අයත් දෙව්මැඳුරු හයක ගායනා කණ්ඩායම් ප්‍රතිසංවිධානය කිරීමට මෙවර කැරොල් ගායනා වැඩසටහන උපකාරි වූ බව මීසම් ක්‍රියාකාරි කමිටුව පවසයි.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**



දිවයිනට බලපෑ ගංවතුර උවදුරින් හලාවත පදවිය ද පීඩාවට පත්විය. විශේෂයෙන් පදවියේ හලාවත සහ පුත්තලම දිසාවන් දැඩි පීඩාවට ලක්විය. විපතට පත්වූ සහෝදර ජනතාවට සහන ලබාදීමට පදවියේ මීසම් කීපයක් ඉදිරිපත් විය. ගොඩැල්ල මීසම් සේවක පියතුමාගේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වු මීසම් ජනතාව හා වින්සන් ද පාවුලා සමිතිය මගින් පැය විසිහතරක් යෑමටත් පෙර ලක්ෂ තුනකටත් වඩා වටිනා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය තොගයක් සූදානම් කර ගෙන ගරු පියතුමා සමගින් ගොස් කරුවලගස් වැව මීසම් සේවක ගරු කිත්සිරි පියතුමාට තබ්බෝව දෙව්මැඳුරේ දී භාරදුනි. මෙදින භාර දුන් ද්‍රව්‍ය අතර ගැහැනු පිරිමි ළමා සියලුම ඇඳුම් බෙඩ්ෂිට්, තුවා ඇතුළු අලුත් ඇඳුම්, සහල් කිරිපිටි සීනි බෙහෙත් වර්ග දත් බෙහෙත් දත් බුරුසු රේසර් ඇතුළු අත්‍යවශ්‍ය සියලුම ද්‍රව්‍ය භාරදුනි. මෙම අවස්ථාව සාර්ථක කර ගැනීම සඳහා මීසම් සහයක ගරු නුවන් එමල්ක පියතුමා විශාල දායකත්වයක් ලබාදී තිබිණ.

**එච්. ඒ. සිරිල් පෙරේරා**

### පිළිකා රෝගියාට පිහිට වන්න



ජාඇල වැවල කොටේවත්ත පාරේ අංක 22 හි පදිංචි ෂර්මන් කුමාර ප්‍රනාන්දු සිව් හැවිරිදි වියේ දරුවකුගේ පියෙකි. 2001 වසරේ සිට පිළිකා රෝග තත්ත්වයෙන් පීඩා විඳින ඔහුට ඇට මිදුළු බද්ධ කිරීමේ සැත්කමක් පිටරට කිරීමට සිදුවී ඇති අතර ඒ සඳහා ලක්ෂ 20-30 මුදලක් වැයවන බව කියයි. ඒ වෙනුවෙන් ජාඇල හැටන් නැෂනල් බංකුවේ 087020106897 ගිණුම සඳහා ඔබගේ පරිත්‍යාග ලබාදෙන්නැයි ඉල්ලා සිටි. වැඩි විස්තර 0715702515

# දහම් පාසල ජීවිතය ජයගන්නට උගන්වන තෝතැන්නක් මිස ටියුෂන් පංතියක් නොවේ

මීසමේ හදවත දහම් පාසලයි. ගමේ දිවැසිවරු දිවැසිවරියන් වන්නේ දහම් ගුරුවරු ගුරුවරියන්ය. ඔවුන් ස්වෙච්ඡාවෙන් කරන සේවාව අගය කළ යුතුයි. එසේම එය විභාග සමත් වීමට උගන්වන ටියුෂන් පංතියක් නොවේ දහම් පාසල, දරුවන් ජීවිතයෙන් ජය ලබන්නට දහමින් පෝෂණය වන්නට අධ්‍යාත්මිකයෙන් පරිපූර්ණ වන්නට උගන්වන තෝතැන්නකි දහම් පාසල. ජීවිතයෙන් අසමත් වුණේ යහපත් පුද්ගලයකු නොවුණොත්, දක්ෂයකු හා උගතකු වුණත් පළක් නැහැ. එම නිසා දරුවෙනි ඔබ ජීවිතයෙන් අසමත් නොවී ජයගන්න යැයි. හලාවත පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත පියතුමා, මාදම්පේ සාන්ත සෙබස්තියන් දහම් පාසලේ වර්ෂාවසාන ත්‍යාග ප්‍රදානෝත්සවයේදී පැවසීය.

සහයක ගරු ශිරාන් ප්‍රනාන්දු පියතුමාද අදහස් දැක්වූ අතර නැටුම්, ගැයුම් හා නාට්‍ය ඉදිරිපත් කරමින් දහම් පාසල් දරු දැරියෝ පැමිණ සිටි පිරිස, ප්‍රබෝධවත් කළහ.

මීසම් සේවක ගරු සිසිර කුමාර, හලාවත පදවි සෙඩෙක් අධ්‍යක්ෂ ගරු රොන්කල්ලි සිල්වා සහ ගරු පැතුම් නිර්මාල් පියතුමන් ද මේ අවස්ථාවට සහභාගි විය.

**පී. ඒ. ඩොමිනික්**



රෝස කුසුමේ දිව්‍ය ජේසු සංසදයේ නිල ප්‍රකාශනයක් වන මිණිඋදාන ජාතික නත්තල් වාර්ෂිකයේ තෙවන වසරේ මංගල කලාපය කුරුණෑගල විශ්‍රාමික රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ට එහි ප්‍රධාන සංස්කාරක ජෝසප් ජයසිරි ප්‍රනාන්දු මහතා පිළිගැන්වූ අයුරු.

# සුදුතුම් පිය ලංකාගමනේ විශේෂ අවස්ථා

## 'කිතු තතු' පුවත් වෙබ් අඩවියෙන් සජීවීව

ශ්‍රී ලංකා කතෝලික මාධ්‍ය ජාලය විසින් පවත්වාගෙන යන ජනප්‍රියම කතෝලික පුවත් වෙබ් අඩවියක් සහ ෆේස් බුක් අඩවියක් වන 'කිතු තතු' පුවත් ජාලයේ www.kithutathu.com කතෝලික පුවත් වෙබ් අඩවියේ 'K Tv' අන්තර්ජාල වෙබ් රූපවාහිනිය මගින් සුදුතුම් පියාණන්ගේ ලංකාගමනේ විශේෂ අවස්ථා සජීවිව සිය පුවත් වෙබ් අඩවිය හා ෆේස් බුක් පිටුව හරහා දෙස් විදෙස් කතෝලිකයින් හට දැක බලා ගත හැකි අන්දමින් විකාශය කිරිමට කටයුතු සූදානම් කර ඇත. ඒ සඳහා www.kithutathu.com යන කතෝලික පුවත් වෙබ් අඩවියෙන් හෝ www.facebook.com/pages/KITHU-TATHU නම් ෆේස් බුක් පිටුව හරහා සුදුතුම් පියාණන්ගේ ලංකාගමනේ විශේෂ අවස්ථා සජීවීව නැරඹිය හැක.



කටුවපිටිය සා. සෙබස්තියන් දෙව්මැඳුරේ කල්වරි පියසේදී දහම් පාසල් උත්සවය මීසම් සේවක ගරු ශ්‍රී ලාල් පොන්සේකා පියතුමාගෙ මූලිකත්වයෙන් පවත්වන ලදි. එම දහම් පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා පැමිණි මීගමු කලාපයෙ දහම් පාසල් අධ්‍යක්ෂ ගරු සඳසිරි පෙරේරා, මීසම් සේවක ගරු ශ්‍රී ලාල් පොන්සේකා, සහයක ගරු නදික මංචනායක, කැපුචින් නිකායේ ගරු අයිවන් ද සුසා පියතුමන් උත්සව භූමියේ අසුන් ගෙන සිටින අවස්ථාවයි මේ.

**සේයා - ඇග්නස් සියඹලාපිටිය**

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා


# රජෙක් උපන්දා!



## ඡන්ද දායකයා ශීලාචාර විය යුතුයි

අලුත් අවුරුද්ද එළඹෙනවිටම ජනාධිපතිවරණයේ උත්සන්න මොහොතද එළි පත්තටම පැමිණ තිබේ. 2014 අවුරුද්ද ගෙවී ගියේ නත්තලේ අඩහැරයත්, මුරුගසන් වැසි වල ප්‍රතිඵලයේ ශෝකාලාපයත් පරයා මැතිවරණ ප්‍රචාරක කටයුතු වල ඝෝෂාකාරී වාතාවරණයෙනි. ඡන්ද දායකයින් පසෙක තබා දේශපාලනයේ නියුතු බොහෝ උදවිය එකම ප්‍රශස්ති ගීතයක නිමග්නව පුද්ගල වන්දනාවේ හා පා සිපාචාරයේ යෙදුන හෙයින් ඡන්ද දායකයින් නිහඬව ගැඹුරු මෙනෙහි කිරීමක යෙදුන බවද රහසක් නොවේ.

අද ඡන්ද දායකයා අමන තත්ත්වයකට පත්විය යුතු නැත. ඡන්දය මහා පරිමානයෙන් හෑල්ලු වූ යුගයක් නොමැති බවක් සිහිපත් කරමින් පක්ෂ මාරුව තුළ දෝලනය වුනු දේශපාලනඥයා සැබවින්ම තුෂ්නිම්භූත කළේ ඡන්ද දායකයාවමයි. හෑල්ලු කළේ ඡන්ද දායකයාවමයි. උපහාසයට ලක් කළේ ඡන්ද දායකයාවමයි. අඳබාල තත්ත්වයට පත් කළේද ඡන්ද දායකයාවමයි.

මෑත අතීතය තුළ සිවිල් සමාජයේ කොඳු නාරටිය දුර්වල බවට විවිධ මතවාද ඇතිවී තිබිණි. ඒ නිසාම විද්වත් කතිකාවකට කිසිදු ආරම්භයක් නැතැයිද, විකල්ප චින්තන ධාරාවකට කිසිදු පරිසරයක් සකස් වී නොමැති යැයිද ආඩපාලි කියූ සමාජයක ශෝකාලාපයක්ද නොතිබුණා නොවේ. ඒ නිසාම බුද්ධියට තැන නොදෙන කැලේ නීතිය රජ කරවන සමාජ පරිසරයක් බිහිවී අතලොස්සක චණ්ඩි පිරිසක්ද උත්පාදව සිටි බවක් මතකයට නැගේ. දේශපාලන ඉණිමගේ ඉහලට ගිය උදවිය එලෙස ඡන්දයේ බලයෙන් වැජඹෙන විට ඡන්දය පාවිච්චි කළ ඡන්ද දායකයා විවිධ අඩන්තේට්ටම් වලට ලක්ව ගම්වල සාමය බිඳවැටී විරසකව එකම නෑදෑ පරපුර පවා භේද බින්නව සිටි කාල වකවානුද මතකයට නැගේ. ඒ සියල්ල තුළින් දේශපාලනඥයා අවඥාවට ලක් කළේ අහිංසක ඡන්ද දායකයාවයි. භයක් හතරක් නොතේරෙන අමනයින් බවට දේශපාලනඥයා ලක්කළේ අහිංසක ඡන්ද දායකයාවයි. ඔවුන් බණ, දේශනා පැවැත් වූයේ ඡන්ද දායකයාටයි. ඒ ඡන්ද දායකයාගේ නොපනත් කම් ගැන තැන තැන කථා කළේ දේශපාලනඥයායි. කොටින්ම අශිලාචාර නොවැදගත් පුද්ගලයින් බවට ඡන්ද දායකයින්ව පත්කළේ ඡන්දයේ බලයෙන් බලයට පත්වී බලයෙන් උන්මාදයට පත් දේශපාලනඥයායි.

නමුත් තවදුරටත් ඡන්ද දායකයා අශිලාචාර, අවිනීත, අසංවර, බුද්ධි හීන, රැවටෙන තත්ත්වයට පත් විය යුතුද? මන්ද අද ඒ තැනට සම්පූර්ණයෙන්ම සුදුසුකම් කියන්නේ දේශපාලනඥයා බැවින් දැන් ඡන්ද දායකය විනීතව විසිය යුතු සමය උදා වී තිබේ. තමන්ගේ ඡන්දයෙන් බලයට පත්ව විශාල මුදල් කුට්ටි උඩ පාවෙමින් එහාට මෙහාට පක්ෂ මාරු කළ අවිනීත දේශපාලනඥයින් හමුවේ දැන් ඡන්ද දායකයා විනීතව විසිය යුතු සමය උදා වී තිබේ. එළියේ යටිගිරිය කැඩෙන තුරු එකිනෙකාට බැණ අඬගාමින් වාචික අතිසාරයෙන් පෙලෙන දේශපාලනඥයා පාර්ලිමේන්තුවේ කැන්ටිමේ එක මේසය වටා එකට හිඳ කෑම ගන්නා විට ඡන්ද දායකයා බුද්ධිමත් විය යුතු සමය උදා වී තිබේ. එය පමණක් නොසෑහේ.

උසිගන්වන වචන වලින් හැඟීම් අවුස්සා අනුනට උපහාස කරමින් තමන්ගේ විශාල වාහන වල නැගී තැනින් තැනට පියාසර කරන දේශපාලනඥයා හමුවේ ඡන්ද දායකයා සංවර විය යුතුයි. පත්තර පිටු පුරා නාමයන් කැත කොට එකිනෙකාගේ කිලිටි රෙදි සෝදන දේශපාලනඥයින් ඉදිරියෙ ඡන්ද දායකයා ශීලාචාර විය යුතුයි.

අපි මෙලෙස අවධාරණය කරමු. ඔබේ සිතට එකඟව කාට ඡන්දය දැම්මත් කම් නැත. නමුත් ඡන්ද ලබා දෙවන වටිනාකම තිබෙන්නේ ඡන්ද දායකයා තුළයි. එය වටිනාකමෙන් ඉහලට නැංවීමේ බලය ඇත්තේ ඡන්ද දායකයා තුළයි. එමනිසා කාගෙන්වත් කිසිදු බලපෑමක් හමුවේ හෘදය සාක්ෂිය ගොළු නොකර බුද්ධිමත් වී ඉතාමත් සංවරව, ශීලාචාර වෙමින් ඡන්ද දායකයින් කටයුතු කරනවා නම් දේශපාලන අතලොස්ස මොන හෙයියම්මාරුවක නිරත වූවාට ඡන්ද දායකයාගේ මහත්මා බව උදුරා ගැනීමට නොහැක. අවුරුද්ද උදාව තුළ පවුලේ සාමයට, ගමේ සංහිඳියාවට, ජාතින් අතර සමඟියට, පරිසරයේ පැවැත්මට. දේශයේ ගෞරවයට ඡන්ද දායක අපි සැම ශීලාචාර වෙමු. සංවර වෙමු. විනීත වෙමු. බුද්ධිමත් වෙමු.

[signature]

# තවදුරටත් වහලුන් නොමැත; එහෙත් සහෝදරයන් සහ සහෝදරියන් ඇත

මේ නව වසර උදාවෙද්දී මානව සංහතියට දෙවියන් වහන්සේගේ කරුණා සහගත තිළිණයන් ලැබෙද්දී සැම කෙනකුටම, ලෝකයේ සිය ජනතාවට හා රටවල් වලට, රාජ්‍ය නායකයන්ට, රජයයන්ට සහ ආගමික නායකයන් වෙත මගේ හෘදයාංගම සාම පැතුම් මම පිළිගන්වන්නෙමි. එසේ සිදුකරමින්ම යුද්ධයන් අවසන් වීමටත්, අර්බුදයන් සහ බරපතල බෙදවාචකයන් මනුෂ්‍යයන්ට සිදුකරන හානි කිරීම් වලටත්, වර්තමාන හා අතීත වසංගතයන් සහ සොබාවික ව්‍යසනයන්ගෙන් සිදුවන විනාශයන් උදෙසා මම නොකඩවා යාච්ඤා කරන්නෙමි. විශේෂයෙන් යාච්ඤා කරනුයේ දෙවියන්වහන්සේ සමඟ අපේ පොදු කැඳවීමේ මූලික කරුණු උදෙසා සහ හොඳහිත සහිත ජනතාව තුළින් ලෝකයේ සාමය හා සමෘද්ධිය වැඩි වර්ධනය වී දුර්පරීක්ෂාවන්ට එරෙහි වන්නට අවශ්‍ය ශක්තිය ලබාගැනීම උදෙසාය.

### මිනිස්කම සඳහා වූ දෙවියන් වහන්සේගේ සැලැස්මට සවන් දීම

මගේ තේමාවට මූලික කරගත්තේ සාන්ත පාවුළු තුමා පිලෙමොන්ට යැවූ හසුනයි. පාවුළු තුමා පිලෙමොන්ට ලියන්නේ කලින් ඔහුගේ වහළකු වූ නමුත් දැන් කිතුනුවකු වීම නිසාම සහෝදරයකු බවට පත්වූ ඔනේසිමුස් සහෝදරත්වයේ ලා සැලකිය යුතු බවයි. 'සමහරවිට ඔනේසිමුස් ටික කලකට ඔබෙන් වෙන් වූයේ සදහටම ඔබට අයිති වන පිණිස විය හැකිය. එහෙත් ඔබ මෙතැන් පටන් ඔහු දාසයකු නොව, දාසකම ඉක්මවූ ප්‍රේමණීය සහෝදරයෙකි. (පිලෙමොන් 1:15-16) ඔනෙසිමුස් පිලෙමොන්ගේ සහෝදරයකු වූයේ ඔහු කිතුනුවකු වූ නිසාය. ක්‍රිස්තුන් වහන්සේ වෙත හැරීමත්, ක්‍රිස්තියානි අපෝස්තලිකත්වය තුළ ජීවත් වීමත් අලුත් උපතක් වන්නේ එමගින් සහෝදරත්වය උතුරා යමින් පවුල් ජීවිතය තුළ හා සමාජයේ මූලික ඒකකය තුළ එය පැතිර යන නිසාවෙනි.

එදා සහ අද වහල්භාවයේ විවිධ මුහුණුවර මිනිස් ඉතිහාසයේ විවිධ කාල වකවානුවලදී වහල් සංස්ථාවන් සාමාන්‍යයෙන් පිළිගත්, නීතියෙන් සම්මත වූ ක්‍රියා කලාපයක් ව තිබුණි. විවිධ සමාජයන් තුළ මිනිසා තවත් මිනිසකු යටත් කර ගැනීමේ මේනියාව ඉන් ප්‍රකට විය. මේ මගින් නිදහසේ උපත ලබන තැනැත්තාට විවිධ හේතූන් මත එකී නිදහස අහිමි වී විවිධ නියමයන්ට යටත්වීමේ තත්ත්වයක් උදාවිය. වෙනත් වචනවලින් කියන්නේ නම් නීතියේ ආධිපත්‍යය තුළ එක් මිනිස් කොටසකට තවත් මිනිස් කොටසක් සිය අභිමතය පරිදි යොදා ගැනීමේ හැකියාව ලබාදී වහළා විකිණීමේ, මිළදී ගැනීමේ තබා ගැනීමේ හෝ විනාශ කිරීමේ අයිතිය ඔස්සේ ඒ මිනිස් ජීවිත වෙළෙඳ භාණ්ඩයක් බවට පත්කර තිබිණ.

අපගේ දැනුම්වත්භාවය ඉහළ යෑම නිසාම වහල්භාවය මිනිස්කමට එරෙහි අපරාධයක් බව වටහා ගැනීම නිසා එය ලෝකයෙන් තුරන් කිර දැමිනි. වහල් භාවය හෝ දාස භාවය වැලැක්වීමට ජාත්‍යන්තර නීතිය මගින්ම කටයුතු කැරුණේ එබැවිනි. ජාත්‍යන්තර ප්‍රජාව තවදුරටත් විවිධ සම්මුතින්, එකඟතාවයන් ඔස්සේ වහල් සේවය අතුගා දමන්නට කටයුතු කරන නිසාම සියලු වයස් කාණ්ඩවල දසලක්ෂ සංඛ්‍යාත ළමුන්, කාන්තාවන් හා පුරුෂයන් මේ රුදුරු උවදුරෙන් මුදා ගැනීමට සමත්ව සිටී.

බොහෝ පිරිමි හා කාන්තා කම්කරුවන් ඇතුළුව දරුවන් විවිධ ක්ෂෙත්‍රවල, විධිමත් හෝ අවිධිමත්, ගෘහාශ්‍රිත හෝ කෘෂිකාර්මික අංශවල්, පතල් කර්මාන්ත හෝ නිෂ්පාදන ක්ෂෙත්‍රවල ජාත්‍යන්තර සම්මුතීන් හා අවම තත්ත්වයන් වත් නැතිව කම්කරු නීතිරීති මුළුමනින් නොතකා හරින රටවල නූතන වහල් සේවාවන්හි නියැලී සිටින බව රහසක් නොවේ.

බොහෝ ශ්‍රම සංක්‍රමිකයන්ගේ ජීවන තත්ත්වයන්ද කුසගින්න අත්දකින, නිදහස අහිමි, සිය වත්කම් උදුරාගන්නා ශාරීරික සහ ලිංගික අපයෝජනයන්ට ලක්වන වටාපිටාවක ගතවෙමින් පවතී. බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යොදවන, බොහෝ දරුවන් ඊට යොමුකරන එමෙන්ම කාන්තාවන් මෙන් පිරිමිද ලිංගික වහලුන් ලෙස යොදා ගැනේ. කාන්තාවන් බලහත්කාරයෙන් විවාහයන්ට යොමුකරන, මුදල් හෝ වෙනත් ආර්ථික ලාබ ප්‍රයෝජන තකා විවාහයන්ට අලෙවි කරන ලෝකයක් අද පවතී.

### වහල් භාවයේ ගැඹුරු හේතූන්

එදා මෙන් අදත් මිනිසාව මේ වහල් භාවය හේතුවෙන් තවත් එක් වස්තුවක් ලෙස සැලකේ. කොතැනක හෝ මිනිස් හදවත පාපයෙන් දූෂණය කරන්නේද අපගේ මැවුම්කාරයාණන්ගෙන්ද, අසල් වැසියන්ගෙන්ද දුරස් කර තබයි.

**2015 ලෝක සාම දින සසුන් පිය පණිවුඩය**

වහල් භාවයේ ගැඹුරු හේතූන් විමසා බලද්දී දරිද්‍රතාවය එහි මුල් තැනක් ගනී. ඌන සංවර්ධනය සහ පිටමං කිරීම විශේෂයෙන් අධ්‍යාපනය ලැබීමේ අවකාශ නොමැති වීමට හෝ හිඟවීමට හේතුවී ඇත. මුල්‍යමය වාසි ලබා ගැනීම සඳහා ඕනෑම දෙයක් සිදුකිරීමට ඇති අභිලාෂයද මෙහිදී ඉදිරියෙන් සිටී. මානව කුට්ටනය (වානිජ අරමුණු සඳහා දරුවන්, කාන්තාවන්, පිරිමින් එහා මෙහා රැගෙන යෑම) විරැකියාවෙන් පෙළෙන අයට බොරු පොරොන්දු මවා රැකියා අවස්ථා සඳහා බලාපොරොත්තු ගොඩනැගීම ආදී කාරණා රැසක් තිබේ. යුද අවි පරිහරණය, භීෂණය, ත්‍රස්තවාදය සහ අපරාධ සහිත සමාජ වාතාවරණයයන්ද මේ සඳහා හේතුවේ.

### වහල් සේවය නිමාකිරීම සඳහා බෙදා හදාගත් කැපවීමක්

සංක්‍රමිකයන් නීති විරෝධි ලෙස රැගෙන යෑම, නීති විරෝධි කටයුතු සඳහා දරුවන්, කාන්තාවන් යොදාග ැනීම ආදි තත්ත්වයන් හමුවේ පැවිදි නිකායයන් ඉතා නිහඬව යෝධ කාර්ය භාරයක් වසර ගණනාවක් තිස්සේ සිදු කරමින් සිටී. විශේෂයෙන් වනිතා පැවිදි නිකායයන් මේ තත්ත්වයන්ගෙ න් පීඩාවට පත් වින්දිතයන් උදෙසා ඉතා දුෂ්කර තත්ත්වයන් මැද, භීෂණකාරි ප්‍රචණ්ඩත්වයන් මැද ජාවාරම්කරුවන්ගේ අදිසි බැමි බිඳ දමන්නට අප්‍රතිහත ධෛර්යයෙන් අනලස්ව කටයුතු කරමින් සිටී. පසුගිය වසර වලදී ශුද්ධාසනයද වින්දිතයන්ගේ වේදනාවන් සහ ඔවුන් නිදහස් කර ගැනීමට පැවිදි නිකායයන්ගේ ක්‍රියාදාමයන්ට සහය දක්වමින් ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඉල්ලීම් කරමින් සහය දැක්විය. මේ පිළිබඳ රැස්වීම් හා සම්මේලන සංවිධානය කරමින් විවිධ විද්වතුන්. වෘත්තිකයන් මෙන්ම සංවිධාන සමග අත්වැල් බැඳ ගනිමින් කරගෙන යන කටයුතු ඉදිරියේදී තව තවත් ශක්තිමත් කර ගැනීමටත්, පුළුල් කිරීමටත් බලාපොරොත්තුවේ.


### ගෝලීය සහයෝගිතාවය වහල්භාවය හෝ සමාන ලෙස නොතැකීම උදෙසා නොවේ

ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය සමාජය තුළ පතළ කර හැරීමේ සත්‍යය ප්‍රකාශ කිරීමේ සසුන් අභිමතය සාක්ෂාත් කර ගනු සඳහා දයාවේ සේවාවන්වල නියැලෙමින් ස්වකීය සහෝදරයා වෙත සමීපවීමේ මඟ ගෙනහැර දක්වයි. එමගින් සෑම අනිත් පුද්ගලයාම සහෝදරයකු හෝ සහෝදරියක ලෙස අප මානව පවුල තුළ පිළිගැනීමට ලක්කරන අතර නිදහස සහ සත්‍යයේ ගරුත්වය රැකීමට පොළඹවයි. මේ තත්ත්වය ඉතා පැහැදිලිව ජොසපින් බකිතාගේ කතාවෙන් මතුකරන අතර මේ සාන්තුවරිය සුඩානයේ ඩාර්පූර් පළාතේදී පැහැර ගෙන වහල් වෙළෙඳුන්ට විකුණන ලද්දේ වයස අවුරුදු 9 ක දැරියකව සිටියදීය. ඉතා වේදනාකාරී අත්දැකීම්වල ප්‍රතිඵලයක් වශයෙන් දෙවියන් වහන්සේගේ සාන්තුවර ගොන්නට එකතුවීමට වරම් ලැබුවාය. විසිවන සියවසේ ජීවත්වූ එතුමිය අද පවා බලාපොරොත්තුවේ සාක්ෂිය උදෙසා දිවි පිදූ වහල් සේවිකාවක වූවාය.

මේ සියල්ලේ ආලෝකයට සෑම දෙනාට මා ඇරියුම් කරන්නේ ඔහුගේ හෝ ඇයගේ සුවිශේෂි කාර්යභාරය සහ වගකීම් තුළ වහල් භාවයෙන් තොර රාජ්‍යයක් සහයෝගිතාවය තුළ ගොඩනැංවීමටය. එසේනම් අප එකිනෙකාගෙන් ද, ඒ ඒ සංඝයන්ගෙන්ද එදිනෙදා දිවි පෙවෙතේදී එල්ලවන අභියෝගයන් මැද විපතට පත්වන අය හමුවීමේදී හෝ ඔවුන් හා ගනුදෙනු කිරීමේදී අන්‍යයන් විපතට පත්කිරීමේ පරීක්ෂාවෙන් මිදී කටයුතු කරන්නට කටයුතු කරමු. වෙනස්කම් නමැති ගෝලීයකරණය තුළ අපගේම සහෝදර සහෝදරියන් බොහෝ දෙනෙකුගේ ජීවිත දැවෙමින් තිබෙන තත්ත්වයන් තුළ නව විශ්වීය සහයෝගිතාවයක් සහ සහෝදරත්වයක් ඔස්සේ ඔවුනට නව බලාපොරොත්තුවක් සහ දිරිගැන්වීමේ ආධාරයක් මගින් ප්‍රශ්න ජයගන්නට දෙවියන් වහන්සේගේ හස්තය තුළ කටයුතු කරන්නට අවකාශ සලසා දෙමු.

2014 දෙසැම්බර් 8 දින වතිකානයේදීය.

සිංහලට සකස් කළේ:
**ශිරාන් මෛත්‍රී**




Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

## මීසමෙන් මීසමට

### හාල්දඬුවන නත්තල් සත්කාරය

හාල්දඬුවන මීසමේ දේවස්ථානයට පැමිණීමට නොහැකි වයස්ගත හා රෝගී බැතිමතුන් උදෙසා විශේෂ නත්තල් සත්කාර මෙහෙයක් මීසම් සේවක ගරු සිල්වෙස්ටර් විජේ කුලසූරිය පියතුමා පැවැත්විය. ආගමික වත්පිළිවෙත් හා සංග්‍රහ කතා බහා තෑගි පිරිනැමීම් මෙහිදී සිදුවිය.

**ටෙක්ලා කල්දේරා**



තුඩැල්ල දිසා සිරිහඳ සමිති වාර්ෂික නත්තල් උත්සවය දිසා අධ්‍යක්ෂ ගරු නිහාල් රුදිගු පියතුමාගේ ප්‍රධානත්වයෙන් තුඩැල්ල දෙව්මැඳුරු ජුබිලි ශාලාවේදි පැවැති අතර සභාපති විනිතා ජයතිලක මහත්මිය හා නිලධාරි මණ්ඩලයේ සංවිධානයෙන් පැවැති උලෙළේදී මාකෙවිට සාමාජිකාවන් නත්තල් ගීතිකාව ඉදිරිපත් කළ අයුරු.

**සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි**

### ගොවි ජනතා දරුවන්ට පරිගණක අධ්‍යාපනය ලබාදීමට

# කොමර්ෂල් බැංකුවෙන් මහියංගනය පල්ලියට පරිගණකාගාරයක්




රටේ අනාගතය තොරතුරු තාක්ෂණයෙන් සවිමත් කිරීමේ අරමුණ ඇතිව කොමර්ෂල් බැංකුවේ සමාජ සත්කාරක වගකීම් මෙහෙවර යටතේ සිය 152 වන අංගසම්පූර්ණ පරිගණක අධ්‍යාපන විද්‍යාගාරය මහියංගන උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දේවස්ථානයේ මීසම් සභාව වෙත පසුගියදා පරිත්‍යාග කරන ලදී.

ලක්ෂ 10 ක මුදලක් වැය කරමින් පරිගණක 5 ක් හා මුද්‍රණ යන්ත්‍රවලින් සමන්විත අංක සම්පූර්ණ පරිගණක විද්‍යාගාරයක් කොමර්ෂල් බැංකුව විසින් පරිත්‍යාග කර ඇති අතර එය ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී ගොවි ජනතාවගේ දූවා දරුවන්ගේ පරිගණක අධ්‍යාපන දැනුම දියුණු කිරීම සඳහා මහත් පිටුවහලක් වන බව මහියංගන මීසම් සේවක ගරු ඩිලෙක්ස් ශාන්ත පියතුමා පරිගණක විද්‍යාගාරය විවෘත කිරීමෙන් පසු පැවති සුහද හමුවේදී ප්‍රකාශ කළේය.

මීසම්වාසින් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම උත්සවය පැවති අතර මහියංගන කොමර්ෂල් බැංකු ශාඛාවේ කළමණාකාර සාගර තෙන්නකෝන් මහතාගේ ආරාධනයෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොමර්ෂල් බැංකු ශාඛා ජාලයේ මධ්‍යම පළාත් ජ්‍යෙෂ්ඨ කලාපීය කළමණාකරු ඩිලක්ෂන් හෙට්ටිආරච්චි මහතා මේ අවස්ථාවට සහභාගි විය. මහියංගන කොමර්ෂල් බැංකු ශාඛාවේ සහකාර කළමණාකාර අමීන්ද්‍ර පෙරේරා මහතා ප්‍රමුඛ නිළධාරි මණ්ඩලය මෙම මෙහෙවර සඳහා පුරෝගාමීව කටයුතු කළහ.

**රංජිත් කරුණාවීර**

## පමුණුගම පොලීසියත් දිළින්දන්ට නත්තල් බෙදති



පමුණුගම පොලීසියත්. පමුණුගම පොලිස් බල ප්‍රදේශයේ පිහිටුවා ඇති ප්‍රජා සිවිල් ආරක්ෂක කමිටු සියල්ලත් ඒකාබද්ධව තුන්වන වරටත් ඇති හැකි අයගේ මුල්‍යමය පරිත්‍යාග වලින් ප්‍රදේශයේ නැතිබැරි පවුල් තුන්සීයකට පමණ අංගසම්පූර්ණ වියළි ආහාර පාර්සල් පමුණුගම පොලිස් ස්ථානයේදී බෙදා දෙන ලදී. වියලි ආහාර පාර්සල් ආසිරි ගැන්වූ පොලිස් උපදේශ කමිටුවේ සාමාජික උස්වැටකෙයියාව මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමා ආහාර පාර්සල් බෙදා දුන්නේය. පමුණුගම බෝපිටිය ශ්‍රීබෝධි විහාරාධිපති ආචාර්ය කිරින්දේ කුසලධම්ම ස්වාමින් වහන්සේද සහභාගි වූ මෙම දිසා සේවාව, සංවිධානය කිරීමට පමුණුගම පොලිස් ස්ථානාධිපති ජ්‍යෙෂ්ඨ පොලිස් පරීක්ෂක, බැතිමත් කිතුනුවකු වූ සුරේෂ් සිල්වා මහතා ඇතුළු පොලිස් ස්ථානයේ කාර්ය මණ්ඩලයද. ප්‍රදේශයේ ග්‍රාම නිලධාරින් හා ප්‍රදේශයේ ප්‍රජා සිවිල් ආරක්ෂක කමිටු සාමාජිකයන්ද ඇප කැපවී ක්‍රියාකළ අතර උත්සව සභාවට පමුණුගම රොටරි සමාජයේ ගරු සභාපති කුමාර පෙරේරා මහතාද සහභාගි විය.

**සටහන - ජෝ. සංගපාලආරච්චි ; සේයා - ඇන්ටනි ජයසූරිය**





මඩම්පැල්ල සෙත් සරණ නිවාස ලාභින් වෙත පසුගියදා මීගමු කලාපීය සිංහ සමාජයේ නිළධාරින් විසින් කොස් පැළ බෙදා දෙන ලදී. සභාපති තුමා එය සිදුකළ අයුරු.

**එච්. ඒ. කල්දේරා**

# සලාපුර පදවියේ පුත්තලම දිසා දහම් ගුරු නත්තල් හමුව

හලාවත පදවියේ පුත්තලම් දිසාවේ දහම් ගුරු නත්තල් හමුව පසුගියදා පුත්තලම භාග්‍යවන්ත ජුසේවාස් මධ්‍යස්ථානයේදී සලාපුර රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාවට පදවි පරිපාලක අතිගරු පැට්රික් විජේ සිංහ පියතුමා සහ පුත්තලම් දිසාවේ මීසම් සේවක ගරු පියතුමන්, සහයක පියවරුන්, ගරු පැවිදි සොයුරියන් ද පැවිදි සහෝදර තුමකු දහම් ගුරුවර ගුරුවරියන් ඇතුලු අති විශාල පිරිසක් සහභාගි වූහ. පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත පියතුමා සමග කතෝලික ගුරු අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු අමල්රාජ් පියතුමා සංවිධාන කටයුතු සිදු කළහ.

ප්‍රථමයෙන් දිව්‍ය පූජාව සිදුකරනු ලැබූ අතර ස්වර්ගස්ථ අතිගරු ඇලෙක්ස් දසනායක පියතුමා සිහිපත් කිරිමද මෙහි දී සිදුවිය. දිසාවේ මීසම් දහ හතරට අයත් මීසම් නියෝජිත ගුරු මහත්ම මහත්මීන්ද, දහම් පාසල් නියෝජිත ගුරු මහත්ම මහත්මීන්ද සිය නත්තල් තිළිණ ලබාගත් අතර, පරිගණක පුහුණුව ලැබූ අයට සහතිකපත් ප්‍රදානයද මෙහිදී සිදුකරනු ලැබීය.

දිසා දහම් ගුරු අධ්‍යක්ෂ ගරු කමල් ඩේමියන් පියතුමා තුති පිදීමේ කතාව පැවැත්වීමෙන් අනතුරුව රදගුරු හිමිපාණන් හා පූජක පිරිස විසින් නිළ ඇඳුමින් සැරසී ජුසේවාස් රැස්වීම් ශාලාවේ අතුරු සිදුරු නැතිව පිරි සිටි සියල්ලන් ආසිරි ගන්වන ලදී.

**ඇන්ටනි මෙරිල්**



ඒකල විශාකාවත්ත ශු. මැක්සිමිලියන් කෝල්බේ දෙව්මැඳුරට අයත් දිව්‍ය හෘද සමිතියේ සාමාජිකාවන්ට පදක්කම් පැළැඳවීම පසුගිදා විශාකාවත්ත දේවස්ථානයේදී සිදුකෙරිණි. පදක්කම් පැළැඳවීමෙන් පසු දිව්‍ය හෘද සාමාජිකාවන් සහයක ගරු ක්‍රිස්ටෝෆර් ප්‍රසන්න පෙරේරා පියතුමන් සමග ප්‍රදීප ඡායාරූපයකට මුහුණ දුන් අයුරු.

**රෂික සුරේෂ් ප්‍රියංකර**

## ගුරුබැවිල මරිය හමුදා නත්තල් ප්‍රසංගය කොස්ගමදී

ගුරුබැවිල දිසා මරිය හමුදා නත්තල් විවිධ ප්‍රසංගය දිසා මරිය හමුදා අධ්‍යක්ෂ ගරු මැක්ෂිමස් රුද්‍රිගු පුල්ලේ පියතුමා සහ ක්‍යුරියා සභාපතිනි ඕලු ගල සොයුරියගේ ප්‍රධානත්වයෙන් කොස්ගම ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයේ දෙව් විමනේදී පැවැත්විණ.

අවිස්සාවේල්ල, හංවැල්ල, තරාල, වැලිවිට, වග ප්‍රසිඩියා මෙහිදි කැරොල් ගායනා ඉදිරිපත් කළ අතර යට්ටෝවිට අවිස්සාවේල්ල ප්‍රසිඩියා ආදර්ශවත් නාට්‍යයන්ද රඟදැක්වූහ.

**ඇග්නස් විජේතුංග**

## ජීවමාන නත්තල් සීයා මුල්වරට වැලිකන්දට

පොලොන්නරුව වැලිකන්ද දිඹුලාන ප්‍රාථමික විද්‍යාලයේ කුඩා දරුවන්ගේ වසර අවසාන විවිධ ප්‍රසංගය පසුගියදා එම විදුහලේදි පැවති අතර විදුහල්පති මල් කුමාර මහතාගේ උපදෙස් පරිදි එඩ්ලි ප්‍රසන්න මහතා විසින් 'නත්තල' තේමා කරගත් නත්තල් සීයාද එදින කුඩා දරුවන් හට තෑගී බෙදා දීමට එක්විය.

ප්‍රදේශයේ බෞද්ධ ජනයා විශාල ප්‍රමාණයක් මෙම උත්සවයට පැමිණ සිටි අතර ප්‍රථම වතාවට ජීවමාන නත්තල් සීයා දැකීමෙන් ඔවුහු විමතියට පත්වූහ. මාධ්‍ය මගින් පමණක් නත්තල් සීයා දැක ඇති බවත් මෙවන් උත්සව තුළින් නත්තල් සීයා ජීවමානව දැකගන්නට ලැබීම සතුටට කරුණක් බව ප්‍රදේශවාසි ජනතාව 'ප්‍රදීපයට' පැවසුහ. මෙම උත්සවය සඳහා දිඹුලාන විහාරස්ථානයේ ස්වාමින් වහන්සේද වැඩම කළහ.

**බී. රංජිත් මැන්ඩිස්**



අඩු ආදායම් ලභී පවුල්වල දරුවන්ට නොමිලේ පාසල් පොත් හා උපකරණ බෙදාදීමේ සහ වත්තල දෙව්මැඳුරු සිගිති ළමා පාසලේ දරුවන්ට රුපියල් 500 ක් වටිනා 'රන් කැකුළු' ගිණුම් විවෘත කරදීමේ උත්සවය වත්තල සාන්ත ආනා සමිතිය මගින් පවත්වන ලද අතර වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමා ගිණුම් පොතක් පිරිනැමූ අයුරු. සාන්ත ආනා සමිතියේ ලේකම් සුනිල් විසිදාගම, හිටපු සභාපති මාලින්ග ජයවර්ධන යන මහත්වරුද ඡායාරූපයේ වෙති. සමිතියේ නව සභාපති ලසන්ත මෙන්ඩිස් ඇතුළු සාමාජිකයෝ රැසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

**නිමල් පෙරේරා**

## යක්කඩුව ප්‍රාථමික විදුහලෙන් නත්තල් කැරොල් ගී ප්‍රසංගයක්

යක්කඩුව ප්‍රාථමික විදුහල සංවිධානය කළ නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් යක්කඩුව ශාන්ත හෙලේනා දෙව්මැඳුරේදි පවත්වන ලදි. යක්කඩුව ප්‍රාථමික විද්‍යාලයේ, විද්‍යාලාධිපති හා ආචාර්ය මණ්ඩලය එක්ව පියතුමාගේ මඟ පෙන්වීම යටතේ ප්‍රසංගය සංවිධානය කරන ලදී.

විද්‍යාල ආචාර්ය මණ්ඩලයේ එක් ගුරුතුමියක් හැර විදුහල්පතිනිය ඇතුළු ගුරු මණ්ඩලය බෞද්ධයින් වන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් අති බහුතරයද බෞද්ධයින් වීම මෙහි විශේෂත්වයයි. රංගනයේදී හා ගායනයේදී මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැක්වූ දක්ෂතා කාගේත් අගැයීමට ලක්විය.

මෙහිදි සභාව දැනුම්වත් කළ ගරු ටෙරන්ස් කිත්සිරි පියතුමා විද්‍යාලය ඉදිරිපත් කළ මේ ප්‍රසංගය ගැන බෙහෙවින් සතුටට පත්වන බවත්, බොදුනු පරිසරයක් තුළින් මෙවන් ප්‍රසංගයක් ඉදිරිපත් වීම ප්‍රදේශයේ දැනට ගොඩනැගී ඇති බොදුනු කිතුනු සහෝදරත්වය තව තවත් වර්ධනය වීමට බෙහෙවින් ඉවහල් වන ලෙස මෙහෙයවමින් දිවා රෑ වෙහෙස නොබලා කටයුතු කරන විද්‍යාලාධිපතිනියගේ සේවය අගය කළ පියතුමා විද්‍යාලය හා දෙව්මැඳුර අතර ඉතා හොඳ සබඳතාවක් ගොඩනැගී ඇතැයිද පැවසීය.

නිවන්දම ජිනරාජ ජාතික විදුහලේ විදුහල්පති ටී. ඇම්. ප්‍රේමවංශ, යක්කඩුව ප්‍රාථමික විදුහලේ විදුහල්පතිනි රමණී ඇලෙක්සැන්ඩර් යන මහත්ම මහත්මීහුද සභාව ඇමතුහ.

**ආර්. එල්. හෙක්ටර් ජයතිලක**



කඳාන ආනියකන්ද රජයේ දිසා රෝහලේ කතෝලික සංගමය ප්‍රථමවරට ඉදිරිපත් කළ නත්තල් කැරොල් ගායනය හා නත්තල් නාට්‍ය රෝහල් රැස්වීම් ශාලාවේදි පැවැත්වුණි. නාගොඩ මීසම් සේවක ගරු ශ්‍රිකාන්ත ප්‍රනාන්දු පියතුමාගේ හා එම රෝහලේ අධ්‍යක්ෂ කේ. කොල්ලුරේ මහතාගේ ප්‍රධානත්වයෙන් මෙය පැවැත්වු අතර බොදුනු සහයද නොමඳව ලැබිණ.

**සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි**

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

## කතෝලික සභාවේ සමාජ ධර්ම ප්‍රවර්ධනය :

# ක්‍රිස්තුන් වහන්සේ විසින් කතෝලිකයින් වශයෙන් අප වෙත පවරා ඇති මෙම උතුම් වගකීම කොතෙක් දුරට ඔබෙන් ඉටුවේ ද?

බිලියන7 ක් පමණ වූ ලෝක ජනගහනයෙන් 20% ට ආසන්න ප්‍රමාණයක් සමස්ත ලෝක කතෝලික ජනතාවගෙන් සමන්විත වේ. ඔබත් මාත් මවු කුසයේ පිළිසිඳුනු දිනම ක්‍රිස්තුන් වහන්සේ තම අනුගාමිකයකු වශයෙන් අපව තෝරා ගෙන ඇත. අප මෙලොව ඉපදුනු දිනම උන්වහන්සේ අපව තෝරාගත් ජනතාවට අයත් කර ගත් අතර අප හැම දෙනාටම විශේෂ මෙහෙවරක් භාර කර ඇත. අපගේ ජීවිත කාලය තුළ අපගේ හැම ක්‍රියාවලියක්ම මෙම මෙහෙවර කේන්ද්‍රගත වී තිබිය යුතු අතර අප මියගිය පසු ස්වාමින් වහන්සේ විසින් කරනු ලබන විනිශ්චයේ දී අප වෙත පැවරුනු මෙම මෙහෙවර කොතෙක් දුරට ඉටු වී ඇත්ද යන්න පිළිබඳව ඇගයීමක් හා විනිශ්චයක් කැරේ.

කතෝලිකයින් වශයෙන් අප වෙත පැවරී ඇති මෙම උතුම් කාර්යය ගැන අප තුළ නිසියාකාරව අවබෝධයක් තිබේ ද? කතෝලික බැතිමතුන් ඉතා වැඩි බහුතරයක් තම ධර්ම චර්යාව සීමා කර ඇත්තේ ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වීමට පමණි. "තමාට මෙන් තම අසල්වැසියාට ද ප්‍රේම කරන්න" යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ අප වෙත දෙන ලද දෙවැනි පොදු පනත තුළින් සභාවේ සමාජ ධර්ම ප්‍රවර්ධනයේ ලා අප සතු වගකීම් හා කාර්යභාරය ගොඩ නගා ඇත. තමාට මෙන්ම තම සහෝදරයින් විශේෂයෙන් අසරණ වූවන් කෙරෙහි දයානුකම්පාවක් දැක්වීම ක්‍රිස්තු අනුගාමිකයන්ගෙන් අපේක්ෂා කෙරේ.

"ඔබ පොළොවේ ලුණුය" ඔබ පොළොවේ ආලෝකය වේ යනුවෙන් අප ස්වාමින් වහන්සේ වදාළේ අප වචනයෙන් හා ක්‍රියාවෙන් අන්‍යයන්ට ආදර්ශවත්ව හා ජීවිත වලට බලපාන අයුරින් ක්‍රියා කිරීමයි. පොළොවේ ඵලදායිත්වය සැමට භුක්ති විඳීමට මඟක් සලසා දීමට මෙන්ම සෑම මනුෂ්‍යයාට යුක්තිය, සාධාරණත්වය හා ගරුත්වයේ අයිතිය හිමිවන ලෙස ක්‍රියා කළ යුතුය යනුවෙන් අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සඳහන් කර ඇත.

කතෝලික සභාවේ සංයුතිය ගිහි පැවිදි බැතිමතුන්ගෙන් සැදී ඇති අතර මෙයින් ගිහි කතෝලික ජනතාව බහුතර ගණයට අයත් වේ. එම නිසාම කතෝලික සභාවේ සමාජ ධර්ම ප්‍රවර්ධනයේලා ගිහි කතෝලික ජනතාවට වඩා වැඩි වගකීමක් හා කාර්යභාරයක් පැවරේ. මෙම සමාජ ධර්මය ගොඩ නගා ඇත්තේ මානව උදාරත්වය මුල් කරගෙනය. දෙවියන් වහන්සේගේ සමානකමට මිනිසා මවා ඇති බැවින් අප හැම දෙනකුටම ඉතා පවිත්‍ර හා ශුද්ධවූ වගකීම වන්නේ දුගී දුප්පත් අසරණ ජනතාව වෙත අප විසින් ඉටු කළ යුතු යුතුකම් ඉටු කිරීමය. 1963 13 වන ශුද්ධවූ ජුවාම් සසුන් පියාණන්ගේ "Pacem in terries" හෙවත් "පෘතුවිය මත සාමය" යන විශ්ව ප්‍රකාශනයෙන් ද මෙම අභිමතාර්ථය වඩාත් අවධාරණය කර ඇත.

දේව රාජ්‍යය දෙසට යෑමේදී දේවාභිමතයට අනුකූලව ලෞකික ක්‍රියා පටිපාටින් නිසි අයුරු හසුරුවාලමින් ක්‍රියාශීලිවීමේ වගකීම ගිහි ජනතාව වෙත පැවරී ඇත. ක්‍රිස්තුන් වහන්සේ තුළ උත්තරීතර සාක්ෂිකරුවකු ලෙසින් දේව හසුන ප්‍රකාශයට පත් කිරීම හා ලෞකික ජීවිතයේ අප අත් දකින පවුල හා සමාජීය ශුභ සිද්ධිය කෙරෙහි යථාර්ථවාදීව ජීවත් වීමයි. හැම කිතුනුවකුම ස්වකීය විචක්ෂනභාවය හා අවබෝධය අනුව වඩා යහපත් දේ කුමක් දැයි තම හෘද සාක්ෂියට එකඟව තෝරා ගෙන ක්‍රියා කළ යුතුය.

ගිහි විශ්වාසිකයින්ට සභාවේ වැදගත් තැනක් ලබා දිය යුතුය ආධ්‍යාත්මික හා සදාචාරාත්මක දිවි පෙවෙත කතෝලික ධර්මය අනුසාරයෙන් ශක්තිමත් කර ගනිමින් වත්මන් සමාජය තුළ විවිධ ක්ෂේත්‍රයන් මඟින් දයාවේ කටයුතු සිදුකළ යුතුය. විවිධ මීසම් වලින් සමන්විත වූ දේශීය සභාවේ මෙම වගකීම මීසම් ධර්ම සේවා සභා මඟින් කළ යුතුය. මේ සඳහා මීසම් ධර්ම සේවා සභාවේ උප කමිටුව වඩාත් සවිමත් කර ඒ හරහා ශුද්ධවූ සභාවේ සමාජ ධර්මය පිළිබඳව සංඝය දැනුම්වත් කර සිය සමාජ වගකීම් ගැන නිසි අවබෝධයක් දිරිගැන්වීමක් කර ක්‍රියාකාරී ගිහි නායකත්වයක් ගොඩනැංවීමට මඟ හෙළි පෙහෙළි කළ යුතුය.

පවුල් ජීවිතයේ දී දෙවියන් වහන්සේට ප්‍රසන්න ආකාරයට දරුවන් හදාවඩා නිසි අධ්‍යාපනය ලබා දී පවුල් ජීවිතය ශක්තිමත් කළ යුතුය.

අද ශ්‍රී ලංකාවේ සාධාරණත්වය හා නීති ගරුකත්වය දැඩි අවදානමකට ලක්වී ඇත. ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, පැහැර ගැනීම්, මිනිමැරුම් සිය දිවි හානි කර ගැනීම් තුළින් සාරධර්ම දැඩි ලෙස පිරිහී ඇති බව පෙනී යයි. මිනිස් ජීවිතයේ ගෞරවය හා වටිනාකම අනපේක්ෂිත ලෙස පරිහානියට පත්ව යමින් පවතී. යහ පාලනයේ දුර්වලතා, අසමතුලිත ආර්ථික සංවර්ධනය, රාජ්‍ය අංශයේ දූෂණය හා නාස්තිය, නීතිය වල් වැදීම, යුක්තිය හා සාධාරණත්වය අභාවයට යාම නිසා මිනිස් ජීවිතය හා මනුෂ්‍යත්වය දැඩි තර්ජනයකට ලක්ව ඇත. යුක්තිගරුක සාධාරණ සමාජයක අවශ්‍යතාව දැඩිව කා හටත් දැනී ඇත. පූර්ණ මිනිස් සංවර්ධනය සඳහා ක්‍රිස්තුන් වහන්සේ ඉගැන් වූ දෙවැනි පනත ක්‍රියාත්මක කිරීම ගිහි විශ්වාසිකයන්ගේ සම්පූර්ණ වගකීම හා කාර්යභාරය වේ. මීසම්වල ක්‍රියාත්මක වන සා. වින්සෙන්ති පාවුලා සමිතිය දයාවේ දූතිකාවන් වැනි සංවිධාන මඟින් ගිහි ජනතාව විශිෂ්ට සමාජ සේවාවක නිරත වන බව පෙනී යයි. ඔබෙත් මගෙත් උපතේ දී ක්‍රිස්තුන් වහන්සේ අප වෙත පැවරූ මෙහෙවර කොතෙක් දුරට ඔබෙන් ඉටු වී ඇත්ද යන්න ඔබ විසින්ම විනිශ්චය කර ඔබෙන් අපේක්ෂිත මානව දයාව පිළිබඳව විශිෂ්ට කාර්යභාරය සම්පූර්ණ කරලීමට ක්‍රියා කිරීමෙන් මේ ලෝකය මිනිස් වාසයට සුදුසු ඉතා ප්‍රසන්න හා වාසනාවන්ත ස්ථානයක් වනවා ඇත.

**ජෝ. පෙරේරා**
දළුගම



# රජෙක් උපන්දා!

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා

## සැඟවුණ නත්තල

විදුලි පහන් දල්වලා
වීදි සියල්ලම
ආලෝකවත් කරලා
එහා මෙහා දිවයන ජනයාගෙන්
ඒ සැම පිරිලා
නත්තල් අසිරියෙන්
පිරි හදවත්
ලහි ලහියේ බඩු මිලදී ගනියි
ඒ අතර....
එකම එක පුංචි පාරක
විශාලෙට හැදූ ගවලෙනක්
ලස්සනට, පිළිවෙළට
සරසා ඇති එය තුළ
ජේසු බිළිඳුන් ඉපදිලා
එහෙත්....
තනිකම වෙලා ගත්
මහා පාළුවකින්,
අසිරිමත් නත්තල
එහි සැඟවීලා...

**නිරෝෂා වනිගසේකර**
කොච්චිකඩේ

# ඔබ දුන් ඒ හුස්ම අරන් ජීවත් වෙන්නට ආසයි

"රෑ අහසේ දිලී දිලී නිවී යන පුංචි පුංචි තරුකැට දිහා නෙත් යොමු කරමින් සිටින නිමේෂයක මුළු සිතම දෙසවනම වසා සිටි නිහැඬියාව බිඳ දමමින් මගේ හද ගැස්මේ හඬ, යාන්තමට වගේ මගේ කන වැකෙන්නට විය. හුරුපුරුදු ඒ හඬ නැසුණා සේ අහස දෙසම මා බලා සිටියේ, කුමක්දෝ අමුතු පාලුවකුත්, තනිකමකුත් දැතේ දරාගෙනය. වචනවලින් කියන්නට බැරි ඒ සාංකාව අතරේම හදවතට දැනෙන ඒ හද ගැස්ම, ඒ සමවැදීම මගේ මතකය මීට ශත වර්ෂ ගණනාවකට පෙර සිදු වූ විශේෂ සිදුවීමක් වෙතට ගෙන ගියේය.

අද ඔබ විඳින මේ නත්තලේ සිසිලස, මේ පහස එදා රෑ මරිය තුමිට ජේසු පුතුන්ට දැනුනේ පුදුමාකාර අත්දැකීමක් ලෙසටයි. සීතලට මිරිකී වෙව්ලමින් පාලු කතරක ගමන් කරමින් ජේසුස් වහන්සේගේ උපතට නවාතැනක් සොයා ගියේ බලාපොරොත්තු රැසක් පොදි බැඳගෙන නොවේ ද? ඒ මහා වාසනාවන්ත උපත ලොවටම කියා පෑවේ මුළු මහත් මිනිස් සංහතියේම ගැලවීමයි. දිනෙන් දින ඒ ගැලවීම තුළින් ඔබට මට නව හුස්මක් ලැබුණි. ඔබ දැන් සිතයි මා පවසන නව හුස්ම වන්නේ කුමක්ද? කියා. සිතන්න, ඔබට සමහර විටෙක ඒ පිළිබඳව සිතෙන්නට පුළුවනි. උත්සාහ කරන්න. බලන්න, ඔබට සිතුනෙත් මෙවැනිම වූ හුස්මක් පිළිබඳවද කියා.

එදා ජේසුස් වහන්සේගේ උපත කිතුනු අපේ ජයග්‍රහණයට මුල පිරීමකි. උන්වහන්සේ අපට ලබා දුන් නව හුස්මද කිතුනු අපේ ජයග්‍රහණයට මඟ පෑදීමකි. සෙනෙහස, ප්‍රීතිය, සමාදානය, බෙදා හදා ගැනීම, සත්‍යයට සාක්ෂි දැරීම නම් වූ ඒ නව හුස්ම ඔබේ නාස්පුඩු තුළට මේ වන විටත් ඇතුලු වී හමාරයි. මෙවර නත්තල තුළ දී ජීවත්වන්න, උන්වහන්සේ ලබා දුන් ඒ නව හුස්ම රැගෙන, කැඩෙන්න, වැයවන්න, අන් අය වෙනුවෙන් තම ජීවිතය පුදන්න, ඔබේ ජීවිතය තුළින්ම මෙවර නත්තලේ දී ජේසුස් වහන්සේට උපතක් ලබා දෙන්න. උන්වහන්සේ දුන් ඒ හුස්ම අරන් ජීවත් වෙන්නට වෙර දරන්න.



මොහොතකට ඔබ ඔබේ අතීතය දෙසට හැරී බලන්න. උන්වහන්සේ ඔබට දුන් ඒ හුස්මෙන් ඔබ ජීවත් වුණා ද? නැතිනම් ඒ ජීවිතය මරා දැමුවාද? ඔබේ හෘද සාක්ෂියට අවනත වන්න. දැන් ඇතැමෙකුගේ හදවත ඔබට පවසනවා ඇති ඔබ අතීතය තුළ කළ කී අයහපත පිළිබඳ ඔබ අන් අයව හෙළා දකින්නට ඇති. කොන්කරන්නට ඇති. අන් අය පිළිබඳව බොරු කේලම් කියන්නට ඇති. තම වාසිය තකා සත්‍ය වසන් කරන්නට ඇති. තමා පමණක් යහපත් යැයි සමාජයටම මවා පාන්නට උත්සාහ කරන්නට ඇති. නමුත් ඔබ එසේ කරන විට සිතා බැලුවා ද? දෙවියන් වහන්සේ ලබා දුන් හුස්ම ඔබ මරා දමන බව. ඔබේ අසල්වැසියාගේ සිත් අසරණ වන බව. නැහැ. ඔබට එසේ සිතුනේ නැහැ. ඒ මන්ද ඔබ එවිට කටයුතු කළේ තණ්හාව, බලයේ කෑදරකම, ඊර්ෂ්‍යාව තුළ මුල්බැසගෙන ය.

ඔබේ දෑස් ඉදිරියේ ඇති කඩතුරාව ඉරා දමන්න. නුඹේ දෙනෙත් වසා සිටින අයහපත නම් පටලය නිසාවෙන් ඔබේ සිත සැමවිටම උත්සාහ කරන්නේ සමාජය තුළ කැපී පෙනීමට පමණක් විය හැකිය. එය අර්ථශූන්‍ය ක්‍රියාවකි. මිනිසා අතර නොව දෙවියන් වහන්සේ ඉදිරියේ මහිමයට පත්වන්න. සිතන්න, මෙවර නත්තලේදීවත් ඔබට දෙව්පියාණන් ලබා දුන් ඒ හුස්ම රැගෙන ජීවත් වන්නට. ආසා කරන්න එම හුස්ම පොද ඔබටම අයිති කරගන්නට. සිතින් ඈත් කර අයහපත, ළඟා වන්න යහපතටම.

පවුල තුළ හෝ වේවා, පාසල තුළ හෝ වේවා, රැකියා ස්ථානය තුළ හෝ වේවා, මීසම තුළ හෝ වේවා, මුළු මහත් සමාජය තුළම හෝ වේවා ජීවත් වන්න ඔබට දෙවියන් වහන්සේ ලබා දී ඇති නව හුස්ම රැගෙන දෙවියන් වහන්සේ තුරුලේ හිඳ සමරන්න මෙවර නත්තල. මරන්නට එපා ඔබේ උතුම් ජීවිතය, ඔබට නොදැනුණත්, නොතේරුණත් ඔබ කරන කියන ඇතැම් ක්‍රියා නිසා ඔබේ මා හැඟි දිවිය නිකරුනේ මැරී යනු ඇත.

ඉහත දී මා සඳහන් කළ යක්ෂයාගේ ක්‍රියා මඟින් ඔබ මෙතෙක් දිනක් ඔබේ ජීවිතය විනාශ කර දැමුවා නම් තවත් අයකුගේ චරිතය, ජීවිතය කෙළෙසන්නට උත්සාහ කළා නම්, සිතට ගන්න මෙවර නත්තලේ දී ඔබට දී ඇති නව හුස්ම තුළින් දැන්වත් ජීවත් වන්නට, සමහර අයකුට ඔබ කළ සියලු අයහපත මේ මොහොතේ සිහිවනවා ඇති. නමුත් ඔබ එය වසන් කරන්නටත් දැන් සිතනවා ඇති. මේත් සමඟම ඔබ අතරම සිටින තවකෙකුට නැතිනම් ඔබට සිහියට නැගෙන්නට පුළුවනි ඔබ ඒ හුස්මෙන් ජීවත්වී තව කෙනෙකුටත් එලෙස ජීවත් වන්නට ආසාවක් ඇති කර ඇති බව. කිතුනු අපගේ අතින් විය යුත්තේ ද එයයි. ඉඩ දෙන්න. මේ මොහොතේ ඔබේ හෘද සාක්ෂියට කතා කරන්නට. ඔබේ හදවතින් වැටෙන ස්පන්දන වේගයට මොහොතකට ඇහුම්කන් දෙන්න. එවිට ඔබට දැනෙයි දෙවියන් වහන්සේ ඔබට දුන් ඒ නව හුස්ම පොද වෙනදාට වඩා ඔබේ හද ගැස්මේ වෙනසක් අද දැනෙන්නට පුළුවනි. ඒ මන්ද ඔබේ සිහියේ මේ මොහොතේ පවතින්නේ උන්වහන්සේ ලබා දුන් නව හුස්ම පිළිබඳවයි. එම නිසාවෙන්ම ඇතැම් විට ඔබේ හද ගැස්මේ වේගය මදක් වේගවත් වන්නටත් දැන් ඉඩ තිබෙනු ඇත.

කෙසේ හෝ වේවා, මෙවර නත්තල තුළ ඔබට මට ලැබෙන කැඳවීම වන්නේ දෙවියන් වහන්සේ ඔබට ලබා දුන් ඒ හුස්ම තුළින් කෲරත්වයෙන් තොර, පලිගැනීමෙන් තොර, ඊර්ෂ්‍යාවෙන් තොර, සාමකාමී, නිහතමානී, අන් අය කෙරෙහි යහපත් සිතුවිලිවලින්, ප්‍රේමය තුළ ජීවත් වීමටයි. එම නිසා සැමවිටම ක්‍රියා කරන්න මිනිසා අතර නොව දෙවියන් වහන්සේ ඉදිරියේ මහිමයට පත්වන්නට. ඔබේ මනස තුළ සෑම මොහොතෙම රඳවා ගන්න මෙන්න මේ වදන එනම් "ඔබ දුන් ඒ හුස්ම අරන් ජීවත් වන්නට ආසයි ජේසු සමිඳුනී" මෙම වදන් පෙළ ඔබේ මුවගින් පිට කරන්න. එවිට ඔබේ හුස්ම පොද ඔබට කතා කරයි යහපත පිළිබඳවම. එයයි මෙවර ඔබට මට නත්තල මඟින් කරනු ලැබූ ඇරියුම.



**කේ. ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
13 ශ්‍රේණිය, සිරිකුරුස විදුහල
ගම්පහ

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55



රජෙක් උපන්දා!

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා



රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය - 2015. 01. 04



ඉරුදින මෙනෙහි කිරීම

# පෙරදිගදී ඔවුන් දුටු තාරකාව

පළමු කියවීම :- යෙසායා 60:1-6
සුවිශේෂය :- මතෙව් 2:1-12
දෙවන කියවීම :- එපීස 3:2-3,5-6

ජේසුස් වහන්සේගේ හදවතින් මෙම ලෝකයට පැමිණෙන අප සැමට පියාණන් වහන්සේ තුළ විශේෂ සැලැස්මක් ඇත.

අද සුපුවත තුළින් දක්වන ශාස්ත්‍රවන්තයන් හට ද ජේසු බිළිඳුන් බැහැදැකීමට සැලැස්මක් තිබුණි. කෙතරම් බාධක හමුවේ වුවත් ඔවුන් ජේසු බිළිඳුන් බැහැදැක, නමස්කාර කොට ඔවුන් සතු දේ එතුමාණන් හට පුද කරන ලදි.

ශාස්ත්‍රවන්තයන්ට ජේසු බිළිඳුන් අසළට ළඟා වීමට උපකාරී වන්නේ තාරකාවක් ය. "පෙරදිගින් ඔවුන් දුටු තාරකාව, ළදරුවා සිටි තැනට අවුත් ඉහළින් නවතින තුරු ඔවුන්ට පෙරටුවෙන් ගියේ ය." (මතෙව් 2:9) මෙහිදී අද සුපුවතින් පවසන එක් පණිවුඩයක් වන්නේ අප සැම කෙනෙකුගේම ජීවිතයේ දෙවියන් වහන්සේගෙන් ලද සැලැස්ම ඉටු කිරීමට උන්වහන්සේ එක්තරා තාරකාවක් ලබා දී ඇත. එය සමහර පුද්ගලයන් හෝ සිදුවීම් විය හැකිය. කෙසේ වුවත් මෙම තාරකාව උන්වහන්සේ හමුවනතුරු උන්වහන්සේ තුළටම අප සැම ගෙන යනු ඇත. තවත් ආකාරයෙන් බලන කල එය අප ජීවිතයේ අත්දකින ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම ද වේ.

අද දේව වචනය තුළින් දන්වන අනෙක් කරුණ වනුයේ ජේසු බිළිඳුන්ට පුදන ලද ත්‍රිවිධ පඬුරු තුළින් ජේසුස් වහන්සේ තුළ ඇති සැලැස්ම හා උන්වහන්සේගේ සැබෑ ස්වරූපය පෙන්නුම් කරනු ලැබීමයි. එදා සමාජය තුළ "රන්" යනු රජෙකු බැහැදැකීමට යෑමේදී අනිවාර්යයෙන් පුද කරනු ලබන වටිනා වස්තුවකි. තවද "තුවරලා" යන පඬුර පුද කරනු ලබන්නේ එදා සමාජයේ පූජකයන්ට ය. මන්දයත් පූජකයා මැදිහත්කාරයකු ලෙස පූජා සිදුකිරීමේදී භාවිත කිරීමටය එසේම "ගන්ධරසය" නමැති පඬුර පුද කරනු ලබන්නේ කෙනෙකු මිය යෑමේදීය. එදා ගව ඔරුවක සිටින පුංචි ජේසු බිළිඳුන් බැහැදැකීමට ගිය ශාස්ත්‍රවන්තයන් සාක්ෂි දරන්නේ ජේසුස් වහන්සේ "රජුන්ගේ රජු බවත්" සැබෑම "උත්තම පූජකයා" බවත් අප සැමගේ පාපයන් උදෙසා මරණයට පත්වී ගැලවීම ලබා දෙන්නා වූ සැබෑ "ගැලවුම්කරුවා" ලෙසත්ය.



එදා ශාස්ත්‍රවන්තයන් ඔවුන් සතු වටිනාම වස්තුව උන්වහන්සේට පුද කළා සේ අප ද අප සතුව ඇති වටිනාම හෝ නැතිවම බැරි දේ උන්වහන්සේට පිදීමට අපට ආරාධනා කරනු ලබයි. තවද මගේ ජීවිතය තුළ උන්වහන්සේව රජකු කිරීමටත්, පූජකයකු කිරීමටත් හා ගැලවුම්කරුවකු කිරීමටත් උත්සාහ ගත යුතුයි. එසේ නම් අප පියාණන් වහන්සේ ජේසුස් වහන්සේ තුළ ලස්සන සැලැස්මක් ඇති කළා සේ මා තුළ ද ඇති සැලැස්ම ඉටු කිරීමට අප සැම ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩදෙමු.

**ගරු අනුර ඩයස් සහෝදරතුමා**
ගොන්සාල්වෙස් සිංහල ආයතනය

# මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා කවුද?

**ක්‍රිස්තු උත්පත්තිය පිළිබඳව ශුද්ධවූ බයිබලයේ සඳහන් වන එකම ග්‍රන්ථය වනුයේ ග්‍රීක් ජාතික ශුද්ධවර ලූක් තුමා විසින් ලියා ඇති සුභාරංචි ග්‍රන්ථය ය. එය ක්‍රි.ව. 80 ත් 90 ත් අතර කාලයේ ලියා ඇති බව සඳහන් ය.**

ශුද්ධවර ලූක් තුමා සඳහන් කරන පරිදි නත්තල් රාත්‍රියේ එඬේරුන් හා දේව දූතයන් අතර ඇති වූ සංවාදය මෙසේ ය. "තවද එම පෙදෙසෙහි එඬේරු රෑ යාමයෙහි සිය බැටළු රැළ රකිමින් පිට්ටනියෙහි සිටියහ. එවිට ස්වාමින් වහන්සේගේ දූතයෙක් ඔවුන්ට දර්ශනය විය. ස්වාමින් වහන්සේගේ තේජශ්‍රීය ඔවුන් සිසාරා බැබළීන. ඔවුන් අතිශයින් බියපත් වූහ. එහෙත් දේව දූතයා ඔවුන්ට කතා කොට බිය නොවන්න. සකල ජනයා හට ඉතා ආනන්දජනක විශාල පුවතක් මම ඔබ වෙත ගෙනෙමි. කුමක් නිසාද ස්වාමින් වන ක්‍රිස්තුස් නම් ගැලවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේ ය. රෙදි වලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේ ය. එය ඔබට ලකුණ යයි කීය. ඒ ඇසිල්ලෙහි ම දේව දූතයා සමඟ ස්වර්ග සේනා සමූහයක් දෙවියන් වහන්සේ පසසමින්,

අති උසස් තැන්හි දෙවිඳුට මහිමය ද, මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා"යි ගැයූහ. (ශු. ලූක් 2:8-14)

ක්‍රිස්තු උපත නොහොත්, කිතුනු ලෝකයම මහිමාන්විතව සමරන "නත්තල" හුදු සම්ප්‍රදායික ආනන්දජනක, විනෝදජනක තවත් "හැපිබර්ත්ඩේ" එකක් නොහොත් සුභ උපන් දිනයක් ද? ක්‍රිස්තු උපත වානිජ ව්‍යාපාරික ලෝකය බිස්නස් ඉල්ලමක් ලෙස උදුරාගෙන ඇත්තේ ය. නත්තල කුට වෙළෙඳුන්ට සන්නද්ධව ආක්‍රමණය කිරීමට ඉඩ දුන්නේ කවුද? එම ප්‍රශ්නයට උත්තර සෙවීම පසෙක තබා ක්‍රිස්තු උපත හමුවේ කිතුනු අප වර්තමානයේ පත්ව ඇති තැන ගැන ගැඹුරින් විග්‍රහ කර විමර්ශනය කර බැලිය යුතු කාලය පැමිණ ඇත්තේ ය. විශ්වය මවා වදාළ මහෝත්තම දෙවි පියාණන්ගේ පුත්‍ර ක්‍රිස්තුස් වහන්සේ ගවහලක් තුළ මෙලොව බිහි වීමට තෝරා ගත්තේ ඇයි?

අද සමස්ත කිතුනු ලෝකයටම අභියෝගයක් වී ඇති මෙම තීරණය ගැන කිතුනු සභාවත් කිතුනු අපත් විමර්ශනය කිරීම පසෙක තබා නත්තලේ බාහිර වත් පිළිවෙත් බාහිර අලංකාර, ජනප්‍රිය නත්තල තුළ පමණක් එල්බ ගෙන සිටීම ක්‍රිස්තු උපතේ සැබෑ අරුත සූක්ෂම ලෙස වසන් කර අප ඈතින් ඈතට ගොස් අවසානය.

ක්‍රිස්තුස් වහන්සේ නිර්ධන පංතිය නියෝජනය කරමින් දුගියකු ලෙස ඉපිද අප්‍රසිද්ධ වූ ශුද්ධවූ ජුසේ තුමා හා නිර්මල කන්‍යා මරිය මව්තුමිය සමඟ කිසිදු සුපිරි වරප්‍රසාද කිසිවක් නොමැතිව නාසරෙත් හි දුගී නිවසක අප්‍රසිද්ධ ලෙස දිළිඳු චාම් සරල දිවි පෙවෙතක් ගත කළ බව ශුද්ධවූ බයිබලයේ සඳහන් වන්නේ ය. උන්වහන්සේ මෙලොවට පැමිණියේ කුමක් නිසාදැයි උන්වහන්සේගේ 12 වන වියේ දේව මාළිගාවෙහි දහම් මණ්ඩපයේ දි ප්‍රකාශ කළේ මෙසේ ය.

"එවිට දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය උන්වහන්සේට දෙන ලද්දේය. උන්වහන්සේ ග්‍රන්ථය දිග හැර මෙසේ ලියා ඇති තැන සොයා ගත් සේක. ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. කුමක් නිසාද දිළින්ඳන් හට සුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද, අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්ටත් පීඩිත වූවන් මුදන්නටත් ස්වාමින් වහන්සේගේ ප්‍රසාද ලත් වසර ප්‍රකාශ කරන්ටත් මා එවා වදාළ සේක. (ශු. ලූක් 14:18-19)

මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා හට සාමය වේවා යනුවෙන් සුරදූත ප්‍රකාශයෙන් දෙවි පියාණන් විශ්වයටම ප්‍රකාශ කළේ දේව ප්‍රසාදය ලත් ජනතාවක් උන්වහන්සේට අවශ්‍ය බව ජනගත කිරීමට විය හැකිය. දේව ප්‍රසාදය ලබන්න නම් අප දේව වචනය අනුව ජීවත් විය යුතු බව නොවේ ද2 සකල මිනිස් සංහතියම ප්‍රේමයේ දහම තුළ එකම සහෝදර කැලක් ලෙස දුක - සැප, සියලු සම්පත් සමසේ බෙදා හදාගෙන ජීවත් විය යුතුය.

එකිනෙකා අතර බෙදා හදාගෙන සහජීවනයෙන් ජීවත් නොවන කිසිවකුට දේව ප්‍රසාදය ලත් ජනතාවක් විය නොහැකිය. සියලු සැප සම්පත් තනිවම භුක්ති විඳින වත් පිළිවෙත් රකිමින් ජනප්‍රිය කිතු දහමක් තුළ වැජඹෙන කිතුනුවන් අද අප අතර අනන්තවත් නොසිටී ද? දේව වචනය තුළ ජීවත් වීම යනු විශාල කැප කිරීම්, නිහතමානී බව, කීකරුකම, ඉවසීම, ලද දෙයින් තුටුවීම ආදි අසීරු ගුණ දම් පිරිය යුතු ජීවන ගමනක් නොවේ ද?

ක්‍රිස්තු චරිතය තුළ ගොඩනැගී ඇති මානව හිතවාදය, අපේ ජීවිත තුළ ගොඩනැගිය හැකි නම් මේ ජීවන ගමනේ අප ඉපදී මිය යන මොහොත දක්වා කොපමණ සැප සම්පත් භුක්ති වින්දත් දේව රාජ්‍යය කරා යන ගමනේ අතරමං වුවහොත් සිදුවන්නේ කුමක් ද? නත්තල් කතාව තුළ අප නැති බැරි මිනිසුන් පාගා ඇමුවහොත් දේව රාජ්‍ය අපට කිසිදාක හිමි නොවනු ඇත.

මිහිපිට ප්‍රසාදය ලත් ජනතාවක් වී නත්තලේ සැබෑ උරුමකරුවන් වන්නට උත්සාහ ගනිමු.

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# නිසල රැයක උපත



ඒ ඔස්ට්‍රියාවේ සාල්ස්බර්ග්හි ශාන්ත නික්ලස් නමැති කුඩා දෙව්මැඳුරය. එහි දේවගැති තුමා Joseph Mohr ය. ගීතිකා කණ්ඩායම මෙහෙය වන්නේ ද ඕගනය වාදනය කරන්නේ ද ගමේ ගුරු මහතකු වූ Franz Gruber ය.

ඒ 1818 දෙසැම්බර් මස 24 දා ය. සංගීතයට උපන් හපන්කමක් ඇති දේවගැති තුමා අලුත්ම නත්තල් ගීතිකාවක් නිර්මාණය කර එදා රෑ ගැයීමට ගුරුතුමාට බාර දුන්නේ ය. නමුත් දෙව්මැඳුරේ ඇති ඉපැරණි ඕගනයේ යම් කිසි දෝෂයක් නිසා එම ගීතිකාව ගිටාරයක ආධාරයෙන් එදා රාත්‍රියේ වාදනය කළේය. ඉතා කන්කළු ගීතිකාවක උපත ඉන්පසුව අමතක වී ගියාය.

ඕගනය යම් කිසි තත්ත්වයකට ගෙන ඒමට හැකි දැයි බැලීමට ඕගන් වාදක ගුරුතුමා දක්ෂ ඕගන් කාර්මිකයකු වූ Mauracher මහතාව කැඳවා තිබුණි. ඔහුද එදා දේව මෙහෙයට සහභාගි විය. ඔහු එදා රෑ පිටව ගියේ ඔහුගේ ගත සිත බැඳගත් ඒ අලුත්ම නත්තල් ගීතිකාවේ ප්‍රස්ථාර පත්‍රයක් ද රැගෙන ය. ඔහු තම ගමේ දෙව්මැඳුරේ එම ගීතිකාව ගැයීමට සැලැස්විය. එම ගීතිකාව ඇසූ බොහෝ අය තම තමන්ගේ ගම්වලට එම ගීතිකාව පතුරා හැරියහ. මෙසේ ගමෙන් ගමට පැතිරී ගිය මෙම ගීතිකාව අවසානයේ දී බර්ලින් නුවර රාජකීය වාදක කණ්ඩායම අතට පත් විය.

ඔවුන් තම සියළු සංගීත භාණ්ඩ යොදා ගෙන එම ගීතිකාව වාදනයේ කළේ එය ඉතා උසස් ගීත නිර්මාණයක් බව තේරුම් ගත් නිසාය.

එම ගීතිකාව ප්‍රසිද්ධ කිරීමට ඔවුන්ට උවමනාවක් තිබුණත් ඔවුන්ගේ යම් සම්ප්‍රදායක් තිබුණි. එනම් ඕනෑම සංගීතයක් සඳහා එහි නිර්මාතෘවරයාගේ නම ප්‍රසිද්ධියේ කීමය. එ වූ නිසා මේ මනහර ගීතිකාවේ උපත සොයා ඔවුන් ගමෙන් ගමට ගියහ. අවසානයේදී ඔස්ට්‍රියාවේ Salzburg හි ඕගන් වාදක ගුරුතුමා වූ Franz Gruber ව සොයා ගත හැකි විය.

ඒ මෙම ගීතය පළමු වරට ගැයීමෙන් තිස් වසරකට පසුවය. එතුමාගෙන් දේවගැති තුමා පිළිබඳව සියලු විස්තර රාජකීය වාදක කණ්ඩායම දැන ගත්තේ පනස් හය වියේ පසු වූ දේව ගැති තුමා ඉතා අසාධ්‍යව ලෙඩ ඇඳේ සිටි හෙයිනි.

කෙසේ හෝ දේවගැති තුමා අවසන් හුස්ම හෙළීමට දින කීපයකට පෙර ඔහු වෙත ගිය ගුරුතුමා මේ ගීතිකාව ලොව පුරා ජනප්‍රිය වී ඇති බව පවසා දේව ගැති තුමාව ඉතා සතුටට පත් කළේය. වසර 196 පුරා දේව මහිමය සඳහා ලොව පුරා ගායනා කළ, ලොව පවතිනතාක් ගායනය කරන ඔබත් මාත් ඉතා ආදරය කරන Silent Night ගීතිකාවේ උපත එසේ ය.

(ඩිරෙක්ෂන් සඟරාව ඇසුරෙනි)

**ක්‍රිසාන්ති කොස්තා**

# නත්තලේ ජීවන සුවඳ...!

වඩුමඩුවේ ගෙදර ජීවන සුවඳ විඳ
ඇති දැඩි වෙමින් නෙතු අබියස තිමිර බිඳ
නව ලොව වෙතට අප ගෙන යන වෙහෙස මැද
කුරුසිය රත්තරන් විනි අප ගෙලෙහි අද

සබවස සුවඳ මැද නැණ මං දිටු පෙතෙහි
කඩයිම් පුළුල් වී මඟ හෙලිවන කෙනෙහි
ආදර කුසුම් පිබිදී මිනිසුන් ලයෙහි
අත්වැල් වෙලුනි මේ වැනි නත්තල් දිනෙහි



**රොබට් ෂෙල්ටන්**
මාදම්පේ

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

# ජනාධිපතිවරණයට ඈඳා නොගතයුතු පාප්රුව

**කතුතුමනි,**

පාප්වහන්සේගේ ශ්‍රී ලංකා ගමනයත් සමග උන්වහන්සේගේ රුව ඇතුලත් බැනර්, කටවුට් රැසක් දේශපාලන වාසි තකා යොදාගන්නා බව පෙනේ. මෙසේ එම පාප්තුමාගේ සේයාරූ දැන් දැන්ම භාවිතයට යොදා ගෙන ඇත්තේ ප්‍රසිද්ධ දේශපාලනඥයන් මෙන්ම, විශේෂ කොටම කතෝලික දේශපාලනඥයන්ය. මෙම ක්‍රියාව ගැන සභාව තුළින්ද යම් ඉඟියක් දෙමින් කියා සිටියේද දේශපාලන වාසිතකා පාප් වහන්සෙගෙ රුව ඈඳා නොගත යුතු බවයි.

ඔක්තෝබර් මාසයේ මුලතිව් හි ගිහිකොමිසමේ රැස්වීම සඳහා රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලිටස් චන්ද්‍රසිරි පෙරේරා, අනුරපුර රදගුරු අතිඋතුම් නෝබට් මාෂල් අන්ද්‍රාදි හිමි ඇතුලු පූජා ප්‍රසාදිවරුන් හා ගිහි කොමිසමේ සාමාජිකයන් 25 දෙනෙකු පමණ යන ගමනේදී අප සැවොම දුටුවේ පාප්වහන්සේ ලඟට ගොස් සිටින ලංකාවේ මැති ඇමැතිවරුන්ගේ බැනර්, කටවුට්ය. මෙසේ රදගුරුවරුන්ගෙ ද අප්‍රසාදයට හේතුවූ මේ කටවුට් ප්‍රදර්ශනය ඇත්තෙන්ම වැරදි සහගත වන්නේ ළඟ එන මැතිවරණ වලදී ඉන් ලකුණු ලබා ගැනීමට යෑම නිසාය. පාප්තුමන් සමග සිටින ඕනෑම කෙනෙකුට තම සිතැඟියාව අනුව සේයාරූ ගොනුවල තබා ගත්තාට කම් නැත. ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රසිද්ධ කිරීම වැරදි සහගතය. පාප්වහන්සේගේ සේයාරූ කිසිදිනක බොදුනුවන් විසින් පාවිච්චි නොකරන බව අපි තේරුම් ගත යුතු වෙමු. හෘදය සාක්ෂිය අනුව දේශපාලන වාසි තකා පාප්තුමා ප්‍රදර්ශනය කර ලකුණු ලබා ගැනීම, ජීවිතයේදී පරාජය අත්වන සලකුණකි.

**මැක්සිමස් රෝයි පෙරේරා**
ජාඇල



# ජනතා හඬ

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා

# මිනිසුන්ට නිදහසේ සිතන්නට ඇති අයිතිය තහවුරු කිරීමට අවස්ථාව ලබාදිය යුතුයි

**කතුතුමනි,**

ශ්‍රී ලංකාවේ පුරවැසියකු ලෙස 1988 සිට මේ දක්වා විවිධ මැතිවරණවලදී මම මගේ ස්වාධීන ඡන්දය පාවිච්චි කර ඇත්තෙමි. මගේ දෙමව්පියන් කාලයක් තිස්සේ මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂයක ක්‍රියාකාරීන් ලෙස කටයුතු කළ බැවින් බොහෝ දෙනෙකු ඔවුන්ව එම පාක්ෂිකයින් ලෙස හංවඩු ගසා ඇත.

එහෙත් මම මගේ ඡන්දය පාවිච්චි කරන්නේ රටේ පවතින සෑම තත්ත්වයක් පිළිබඳව ඉතා හොඳින් සොයා බලා මේ රටට වඩාත් ඵලදායකයැයි මට අනුමාන කළ හැකි පක්ෂය හෝ පුද්ගලයා වෙනුවෙනි. එබැවින් මා අයත්වනුයේ රටක ආණ්ඩු පෙරලන සහ පිහිටුවනු ලබන අපි කටවචනයට කියන 'පාවෙන ඡන්දදායකයින්ගේ කණ්ඩායම'ටය.

අප කණ්ඩායමට මෙවර ජනාධිපතිවරණයේදී ඉතා වටිනා කාර්යභාරයක් ඉටුකිරීමට තිබේ. එනම් දැනට ජනාධිපතිවරණයට ඉදිරිපත් වී සිටින ඉතාමත් සුදුසු පුද්ගලයා ජනාධිපති ලෙස තෝරාපත් කර ගැනීමට අපගේ ඡන්දය නිදහසේ පාවිච්චි කිරීමයි. මේ නිදහස යන්නෙන් අදහස් කරන්නේ ඡන්දය පැවැත්වෙන දිනයට ඡන්දපොළට ගොස් ඡන්දය පාවිච්චි කිරීමට ඇති නිදහස පමණක් නොවේ. ජනාධිපතිවරණය සඳහා ප්‍රධාන වශයෙන් ඉදිරිපත්වී ඇති පුද්ගලයින්ගේ ප්‍රතිපත්ති, අදහස්. සැලසුම් පමණක් නොවේ. ඉතා සරලව කියතහොත් 'කෙරුවාවල්' දැන ගැනීමට අපට නිදහස සහ අදහස තිබිය යුතුයි. මක්නිසාදයත් එම නිදහස නිවැරදි තීරණයක් ගැනීමට අපගේ චින්තනය මෙහෙයවනු ලබන බැවිනි.

මේ රටේ පුරවැසියකු ලෙස රාජ්‍ය මාධ්‍යය තුළින් ඒ සියල්ල දැනගැනීමේ අයිතිය මට ඇති බව තරයේ විශ්වාස කරමි. මක්නිසාදයත් රජයේ මාධ්‍යය කිසිම හේතුවක් නිසා එක් කණ්ඩායමකට අයිති නොවන නිසාය. එහෙත් අවාසනාවකට මෙන් මේ රටේ පවතින රජයේ පාලනය යටතේ පවතින සියලුම මාධ්‍යයන් ඉතාමත් නින්දිත ලෙස ඒ අවස්ථාව අපගෙන් උදුරාගෙන තිබේ.

මේ රටට වඩා සුදුසු නායකයා කවුරුන් විය යුතුදැයි තීරණය කිරීමේ අයිතිය ජනතාවට ලබාගැනීමට ජනාධිපතිවරණයට ඉදිරිපත්වී ඇති ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනාටම සමාන අවස්ථාවන් මෙම රජයේ මාධ්‍යයන් තුළින් ලැබිය යුතුව තිබේ. එසේ නොවන්නේ නම් මේ රටේ මැතිවරණය කිසිසේත්ම නිදහස් සහ සාධාරණ මැතිවරණයක් නොවන බවත් විශේෂයෙන්ම මෙවර ජනාධිපතිවරණය නිදහස් සාධාරණ ජනාධිපතිවරණයක් නොවන බවත් ඉතාමත් කණගාටුවෙන් යුතුව සඳහන් කරනු කැමැත්තෙමි. බොහෝදෙනෙකු මගේ මතයේ සිටින බවද දනිමි.

**අරුණ ශාන්ත නෝනිස්**

# සෑම නාලිකාවක සසුන් පිය ලංකා ගමනේ නිල ලාංඡනය බබළවන්න




**කතුතුමනි,**

කතෝලික ජනතාවක් වශයෙන් අප මේ වන විටත් ඇඟිලි ගනිමින් සිටින්නේ අපේ සසුන් කෙතේ විශ්ව නායකයාණන් වන අතිඋත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් අප දේශයට පා තබන ඒ උත්තරීතර අවස්ථාව උදාවන තෙක්ය.

උන්වහන්සේගේ පැමිණීම අප දේශයේ කතෝලික ජනතාවට පමණක් නොව මුළු මහත් ශ්‍රී ලාංකිකයන්ටම වැදගත් අවස්ථාවකි. මේ උතුම් අවස්ථාවන් වතිකාන රූපවාහිණී සේවාව ඇතුලු අනිකුත් ලොව සියලුම කතෝලික රූපවාහිනි සේවාවන් ඔස්සේ සජීවි ලෙස විකාශය වනු ඇත. මුළු ලෝකයේ ඇස් අප වෙත යොමුවන කාලයකි මේ. ඒ අතරම දේශීය වශයෙන් ජාතික රූපවාහිනිය ඇතුලු අනිකුත් සියලුම රූපවාහිණී ගුවන් විදුලි නාලිකාවන් මෙම අවස්ථාවන් සජීවි ලෙස විකාශය කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

එලෙසම අප දැක තිබෙනවා විශේෂ කාල තුළ දී ආගමික උත්සව ක්‍රීඩා උත්සව, ජාත්‍යන්තර උත්සව වැනි දේ සමරණ කොට ඒ කාල සීමා තුළ දී නාලිකාවේ ලාංඡනයට අනිත් පසින් එම ලාංජන හෝ ධජ ලෙළ දී බැබලෙන අයුරු.

මෙය අපේ ශ්‍රී ලංකාවටම වැදගත් අවස්ථාවක් වන නිසා සුදුතුම් පියතුමන්ගේ ලංකා ගමනය වෙනුවෙන් දේශිය සෑම නාලිකාවක් තුළින්ම සසුන් පිය ලංකා ගමන වෙනුවෙන් විශේෂයෙන් සකස් කළ නිළ ලාංඡනය බැබලෙනවා නම් එය ඉමහත් සතුටට කරුණක් වනු ඇත. ඒ සඳහා ආදාල බලධාරින් කටයුතු කරනු ඇතැයි සිතමි.

**බී. ඒ. මනෝජ් දිවන්ක**
බණ්ඩාරවෙල

# විශ්වාසය ද? පොරොන්දු ද? බලාපොරොත්තු ද?



**කතුතුමනි,**

ශ්‍රී ලංකාවාසින්ට 1931 දී ඩොනමෝර් කොමිසම මගින් සර්ව ජන ඡන්ද අයිතිය ලැබුණි. එදා සිට අද දක්වා අවුරුදු 84 ක කාලයක් තුළ මැතිවරණ රාශියක් පැවැත්වුණි. හැත්තෑවේ දශකය වෙනතෙක් අප රටේ වැසියන්ට විශ්වාසයෙන් යුතුව ඡන්දය පාවිච්චි කිරිමට ඉඩ සැලසුණි. නමුත් මෑතක සිට එම බලාපොරොත්තුව කඩවී ඇත.

මේ දිනවල මැතිවරණ ප්‍රචාරක වේදිකාවල ඉදිරිපත්වී සිටින අපේක්ෂකයින් දෙන පොරොන්දු ගැන කියලා වැඩක් නැත. සැමදෙනාම නැති සුරංගනා ලොවක් මවති. තම තමන්ගේ ගොඩ ලොකු කර ගැනීමට ඒ පැත්ත මේ පැත්ත කඹ ඇදිල්ලකට සැරසි වැඩ කරති. දුප්පත් අසරණ අහිංසක අතරමං වී සිටින ජනතාවට පිළිසරණක් වන විදියේ තිරසාර සැලසුමක් නොමැති වීම ගැන කණගාටුවෙමි. මන්ද මේ රටේ ඉදිරි දියුණුවට නිෂ්පාදනය වැඩිකර ස්ථිර වෙළඳපලක් ඇතිකළ යුතුය. පිටරටවලට අත නොපා අපේ රටේ ජනතාවගේ සුබ සිද්ධිය සඳහා කටයුතු කළ යුතුය. හොරකම වංචාව දූෂණය නාස්තිය වැලැක්විය යුතුය. නීතිය කාටත් එකසේ සාධාරණ විය යුතුය.

ඉදිරි මැතිවරණයෙන් පසුව ජය ගන්නා දේශපාලකයා දුන් පොරොන්දු මැනවින් ඉටුවේදෝ කියා ඡන්දදායකයා නොවිමසිල්ලෙන් යුතුව බලාපොරොත්තු තබා විශ්වාසයෙන් සිටින බව දනිමි. දෙවියන් වහන්සේ කෙරේ විශ්වාසය ඇතුව කටයුතු කළොත් අප සැමට සුබ අනාගතයක් ලඟාවේය කියා අප සැම එක සිතින් යාච්ඤා කරමු.

**රංජන් පල්ලේවෙල**
මීගමුව

# සිරිලක කිතුනු විශ්වාසය කොයිබටද?

**කතුතුමනි,**

පවුල් වසර ආරම්භ වී ඇත. කතෝලික පවුල් පිළිබඳව කිව යුතු දෑ රාශියක් ඇතත් එක් ප්‍රධාන කරුණක් ගැන පමණක් පෙන්වා දීමට මා අදහස් කරමි. දැනට වසර පනහකට, හැටකට පමණ පෙර ලංකාවේ කිතුනු ජනගහන අනුපාතය වූයේ 13% කි. අද වන විට එම අනුපාතය 8% ක් දක්වා පල්ලම් බැස ඇත.

මේ ඉලක්කම් කතාකරන්නේ අද ලංකාවේ දේව වචනය බෙදා හැරීමේ වර්ධනයේ පරිමාවයි. මෙතන කොයියම් හෝ වරදක් ඇතිබව ඉතාමත් පැහැදිලිය. මට හිතෙන ආකාරයට මේ කඩා වැටීමට ප්‍රධාන හේතුව වන්නේ මිශ්‍ර විවාහ යන්නය. මූල ධර්මවාදින්ට එරෙහිව අවි අමෝරාගෙන ඉදිරියට යන අපි සිදුවීගෙන යන මේ විනාශය ගැන දක්වන්නේ නිහඬ පිළිවෙතකි.

ආරම්භයක් ලෙසට මෙම පවුල් වසරේදී මේ පිළිබඳව යම් සමීක්ෂණයක් හෝ විමර්ශනයක් ලංකාව පුරා මීසම් මට්ටමෙන් සිදුකිරීමට සභානායක තුමන් හෝ එතුමන්ගේ අනුමතිය ඇතිව ගිහි සංවිධානයක් හෝ පියවර ගන්නේ නම් එය ඉතා වැදගත් දෙයකි.

අප අවට සමාජය දෙස විමසීමෙන් බැලුවහොත් මිශ්‍ර විවාහ දහසක් සිදුවෙද්දී ඉන් එකක් ජේසුව වැලඳ ගත්තත් අනිත් නවදෙනාම කැලෑ වැදි ඇති බව කිව යුතුය. මේ කරුණ ඇත්ත දැයි ඔබ ප්‍රදේශයේ සිදුව ඇති මිශ්‍ර විවාහක පවුල් දෙස විමසිලිමත්ව බැලීමෙන් ඔබට තේරුම් ගත හැකිවනු ඇත.

මඩු මංගල්‍යයට, සුදුතුම් පිය පිළිගැනීම් ආදියට රොක් වෙන ලක්ෂ ගණන් සැදැහැවතුන් දැක ගැනීමෙන් සියල්ල හරි යැයි සිතා සැනසීමට පත්වී, සිරිලක තුළ කිතුනු විශ්වාසයට වෙමින් පවතින මේ විනාශය නොතකා සිටීම ජේසු අපගෙන් බලාපොරොත්තු වන්නක් නොවේ. ලක් කිතුනු සභාවේ මේ කණගාටු දායක නායයාම වගකිව යුත්තන්ගේ ගැඹුරු අවධානයට ලක්වේවා!

**පීටර් ප්‍රනාන්දු**
ලුනාව

# කිතුනුවන් තම ආගමික නායකයාණන් හමුවීමට යන්නේ නිසි සූදානමකින්ද?



**කතුතුමනි,**

එක්තරා කිතුනු පියතුමෙක් දිව්‍ය පූජා යාගයකදී පැවැත්වූ දේශනයකදී මෙසේ පැවසීය. 'අපේ සමහර අය ජනාධිපති මුණ ගැහෙන්න අවශ්‍ය වූ විට පැය 3 කට හෝ 4 කට කලින් එම ගේට්ටුව අසල බොහෝ ගරු සරු ඇතිව අවශ්‍ය ලියකියවිලි යනාදී සියලු දේ සමගින් හොඳින් සූදානම් වී සිටිනවා නේද?

එහෙත් තමන් අදහන තමන්ගේ අසහාය නායකයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජීවමානව වැඩ සිටින දිව්‍ය පූජා යාගයට සහභාගිවීමට යන අවස්ථාවේදී එම මෙහෙයට කල්වේලා ඇතිව හෝ නිසි සූදානමකින් දේවස්ථානය කරා යනවාද?

ඇත්තවශයෙන්ම දිව්‍ය පූජා යාගයට කිතුනු අපි කල්වේලා ඇතිව යනවාද? පැයකට හෝ කලින් ආහාර පාන වලින් වැලකෙනවාද? දිව්‍ය පූජාවේ යාච්ඤා යනාදියට නිසි අයුරින් පිළිතුරු දෙනවාද? ගීතිකා ගයනවාද? දේශනයට හා අනෙකුත් දේව වාක්‍යයන්ට නිසි ලෙස සවන් දෙනවාද? නිසි සූදානමකින් දිව්‍ය සත්ප්‍රසාදය ලබාගන්නවාද? අවසාන ආශිර්වාදය දක්වා දේවස්ථානයේ රැඳෙනවාද? නැතිනම් දේවස්ථානයෙන් පිටත සිටිනවාද? සිතා බැලිය යුතු කරුණකි.

ජනාධිපති හමුවන්න පැය කීපයකට කලින් යනවා නම් ඊටත් වඩා බලගතු මුළු මහත් මැවිල්ලේ මැවුම්කාරයාණන්ද අපගේ අසහාය නායකයාණන්ද හමුවීමට යන මොහොතේදී කොපමණ සූදානම් වී කල්වේලා ඇතිව දේවස්ථාන කරා යා යුතුද යන්න තම හෘදය සාක්ෂියට තට්ටුකර බලා එය ගන්නේ නම් මැනවි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

# ඉදිරි ජනාධිපතිවරණය පිළිබඳව

# කතෝලික රදගුරු සම්මේලනයේ ප්‍රකාශය

2015 ජනවාරි මස 08 වන දින ජනාධිපතිවරණය පැවැත්වෙන බව නිල වශයෙන් නිවේදනය කර ඇත. ජනාධිපතිවරණය ආසන්න වෙත්ම, මුළු මහත් ජාතිය ලෙස මුහුණ දෙන ප්‍රධාන කාරණා කෙරෙහි අවධානය යොමු කොට ඒ සඳහා අවංක දේශපාලනමය කැපවීමකින් හා අධිෂ්ඨානයකින් යුතුව කඩිනම් විසඳුම් සෙවීම අවශ්‍ය බව පෙනී යයි. ඒ හේතුවෙන් සෑම මට්ටමකින්ම පූර්ව හා පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිටුදැකිය යුතුය. දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් වෙත මඩ ගැසීම වෙනුවට විද්වත් කථිකාවක් තුළින් තම තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති පිළිබඳව ජනතාව දැනුම්වත් කළ යුතුය. ශුද්ධෝත්තම පියතුමාගේ සංචාරය ජනාධිපතිවරණය අවසානයත් සමඟ සිදුවීමට නියමිතව ඇති පසුබිමක් තුළ, වගකිව යුතු පාර්ශ්වයන් වෙත අපගේ ආයාචනය වන්නේ ශුද්ධෝත්තම පියාණන්ගේ සංචාරය හා ඊට සමගාමීව සැලසුම් කර ඇති ආධ්‍යාත්මික වැඩසටහන් සඳහා බාධාවකින් තොර සාමකාමී වාතාවරණයක් උදා කර දීම සහතික කරන ලෙසයි. ශුද්ධෝත්තම පියාණන්ගේ සංචාරය කිසිදු අයුරකින් දේශපාලනීකරණය කිරීමෙන් වැළකෙන ලෙසද ජනාධිපතිවරණ අපේක්ෂකයන්ගෙන් අපි දැඩි අවධාරණයෙන් යුතුව ඉල්ලා සිටිමු.

නිදහස් හා සාධාරණ මැතිවරණයකට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය හා පූර්ණ විනිවිද භාවය යන ප්‍රතිපත්තීන් පවත්වා ගෙන යන ලෙසට මැතිවරණයට අදාළ සියලු පාර්ශ්වයන්ගෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ඉල්ලා සිටියි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා රට මුහුණ දෙන අර්බුද හමුවේ ප්‍රතිපත්තිමය කාරණා මත විවිධ මත හා අදහස් දැරීමට හැකි නිදහස් වාතාවරණයක් පැවතීම අතිශයින් අවශ්‍යය. තේරී පත්වන කවරෙකු වුව ද ඉදිරි කාලය තුළ මේ රටේ නීතියේ ආධිපත්‍යය සහ සහභාගිත්වී ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරන නෛතික වෙනස්කම් සිදු කරන බවට සහතික විය යුතුය. දේශයේ සියලු පුරවැසියනට සමානාත්මතාවයෙන් හා අභිමානයෙන් ජීවත් විය හැකි වන ලෙසට සාමය හා සංහිඳියාව රට තුළ ඇති කිරීම කෙරෙහි දැඩි කැපවීමක් ද තේරී පත්වන්නාගෙන් අපි අපේක්ෂා කරමු.

බියෙන් හා බලපෑමෙන් තොරව තම ඡන්දය ප්‍රකාශ කිරීම සෑම පුරවැසියකුටම ඇති අනන්‍යසන්තක අයිතිය හා එම අයිතියට ගරු කිරීම නැවතත් අවධාරණය කිරීමට අපි කැමැත්තෙමු. මේ ක්‍රියාදාමය තුළ සාධාරණත්වය ඉතා ඉහළින්ම පවත්වාගෙන යමින් මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය සියලුම සහයෝගය අදාළ වගකිව යුතු අංශ වෙත ලබා දිය යුතුය. මැතිවරණයට අදාළ සියලු නීති ගරු කරමින් එම ක්‍රියාදාමය තුළ පූර්ණ විනිවිදභාවය ආරක්ෂා කළ යුතුය.

ශුද්ධවූ සභාව නිරන්තරයෙන් අවධාරණය කරන්නේ පොදු යහපත උදාකිරීම වෙනුවෙන් සෑම කෙනෙකුගේම ඡන්ද අයිතිය ප්‍රයෝජනයට ගැනීමේ යුතුකම හා අයිතිය ආරක්ෂා කර ගැනීම අවශ්‍ය බවය. දෙවන වතිකාන කතිකාවතේ (Gaudium et Spes) හෙවත් "නූතන ලෝකයේ ශුද්ධවූ සභාව" නම් අපෝස්තලික ව්‍යවස්ථාව පැහැදිලි ලෙස ප්‍රකාශ කරන්නේ "සියලු පුරවැසියන් පොදු යහපත උදාකිරීම වෙනුවෙන් නිදහසේ තම ඡන්දය ප්‍රකාශ කිරීමේ යුතුකම හා අයිතිය පිළිබඳව අවධානය යොමු කළ යුතු බවය. අන් අයගේ යහපත වෙනුවෙන් ක්‍රියා කරන හා තම නිලයට අනුව රාජ්‍යය සේවයට කැපවෙන සියලුම දෙනා ශුද්ධවූ සභාව ප්‍රශංසාවෙන් හා අගය කිරීමෙන් සලකනු ලබයි. (අංක 75). ඒ අනුව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය සියලු කතෝලිකයින් හා පුරවැසියන්ගෙන් ඉල්ලා සිටින්නේ ඉදිරි ජනාධිපතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති ශුද්ධවූ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ක්‍රියාවට නංවන ලෙසයි.

ජනාධිපතිවරණයෙන් පසුව ජයග්‍රාහකයින් හා පරාජිතයින් ජනතාවගේ තීරණය පිළිගෙන, ජනතාවගේ තීන්දුවට එකඟතාවය පෙන්වමින්, එකිනෙකා සමඟ මිත්‍රත්වයේ දෑත් දිගුකොට රටේ යහපත වෙනුවෙන් එක්ව ක්‍රියා කිරීම අවශ්‍යයි. අපේ ඒකායන පැතුම හා යැදුම, ජනාධිපතිවරණය නිදහස් හා සාධාරණ මෙන්ම පූර්ණ ලෙසම "ප්‍රචණ්ඩත්වයෙන් තොර" වූ හා ජාතියේ ඉදිරි ගමනට, පූර්ණ නිදහසට හා සමෘද්ධියට හේතුවන මෙන්ම ආර්ථික, සදාචාරාත්මක වශයෙන් හා අප ජනතාවගේ වටිනා සංස්කෘතික උරුමයන් රැකදෙන ජනාධිපතිවරණයක් වේවා යන්නය.

✠ **අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි**
සභාපති - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
කොළඹ අගරදගුරු

✠ **අති උතුම් රායප්පු ජෝශප්**
උප සභාපති - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
මන්නාරම රදගුරු

✠ **අති උතුම් තෝමස් සෞන්දරනායගම්**
යාපනය රදගුරු

✠ **අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි.**
බදුල්ල රදගුරු

✠ **අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා**
කුරුණෑගල රදගුරු

✠ **අති උතුම් ජෝශප් පොන්නයියා**
මඩකලපුව රදගුරු

✠ **අති උතුම් මේරියස් පීරිස්**
අගරදගුරු පදවි සහයක රදගුරු

✠ **අති උතුම් මැක්ස්වල් සිල්වා**
අගරදගුරු පදවි සහයක රදගුරු

✠ **අති උතුම් වැලන්ස් මෙන්ඩිස්**
මහලේකම් - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
හලාවත රදගුරු

✠ **අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ**
ත්‍රිකුණාමලය රදගුරු

✠ **අති උතුම් වියානි ප්‍රනාන්දු**
මහනුවර රදගුරු

✠ **අති උතුම් නෝබට් එම්. අන්ද්‍රාදි නි.ම.නි.**
අනුරාධපුර රදගුරු

✠ **අති උතුම් ක්ලීටස් පෙරේරා සා.බෙ.නි.**
රත්නපුර රදගුරු

✠ **අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ**
ගාල්ල රදගුරු

✠ **අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු**
අගරදගුරු පදවි සහයක රදගුරු

2014 දෙසැම්බර් මස 05 වෙනිදා

# 2014 කි…

වසර ගණනාවක සිට ශ්‍රී ලාංකික කතෝලික ප්‍රජාව කෘතවේදීත්වයෙන් අපේක්ෂාවෙන් සිටි භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා සුදුවරයට එසැවීම සඳහා වත්මන් සසුන් පිය අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් මෙරටට සම්ප්‍රාප්ත වීම පිළිබඳ බලාපොරොත්තු පොහොණී වෙමින් තිබෙන මොහොතක 2014 වසර එකී බලාපොරොත්තු සඵල කරගැනීමට මඟසැලසූ වසරක් හැටියට සඳහන් කළ හැකිය.



අති උතුම් විසිතුන්වන ජුවාම් සුදු පියාණන් හා භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු හිමිපාණන් දෙපල සුදුවරයට එසැවීමත් අති උතුම් හයවන පාවුලු සුදු පියාණන් භාග්‍යවරයට එසැවීමත් 2015 ජනවාරි 14 දින භාග්‍යවත් ජුසේ වාස් පියතුමා ශුද්ධවරයට ඔසවන බවට කළ නිල නිවේදනයත් සමඟින් සුදුතුම් පිය සිරිලක් සංචාරය 2015 ජනවාරි 13 සිට 15 දක්වා සිදු කිරීමට නිවේදනය වේ.



2014 ජනවාරි 01 ලෝක සාම දින පණිවුඩයෙන් "කුරුසිය" සහෝදරත්වයේ තිරසර පදනම වන බව ප්‍රකාශ කරන ශුද්ධෝත්තම පියතුමා ඒ මඟ යන්නට ජනතාවට ඇරියුම් කරයි.



ඉතාලියේ කතෝලික රදගුරු සමුළුවේ සභාපති අති උතුම් ඇන්ජලෝ කාදිනල් බැර්ග්නිස්කෝ හිමිපාණන් සිරිලකට සැපත් වූයේ ද ඉකුත් ජනවාරියේ ය. රත්නපුර පදවියේ මා හේන දෙව්මැඳුරට ප්‍රවිෂ්ට වන මාර්ගයෙ තහනම් කළ බැනරයක් අන්තවාදීන් විසින් එල්ලා තැබීම නිසා බරපතල අවුලක් පැන නැගිනි. සදාසරණ නිකායට හැට වසරක් සපිරීමත් ෆ්‍රැන්සිස්කන් තෙවන නිකායේ ප්‍රාදේශාධිපති ලෙස ගරු එරික් මදුරාවල පැ.තු.නි. පියතුමා පත් වීමත් ඉකුත් වසරේදී සිදුවිය. සා. සෙබස්තියන් මුනිඳුන්ගේ හස්ත ධාතු සිරිලකට සැපත් වූයේ ද ඉකුත් වසරේය.




## පෙබරවාරි

කුර්සිල්ලෝ ව්‍යාපාරයේ ස්වර්ණ ජයන්තිය පැවැති අතර ජනතා විමුක්ති පෙරමුණේ නව නායකයා ලෙස අනුර කුමාර දිසානායක මහතා පත්විය. 14 වන ගුවන් හමුදාපති ලෙස රොෂාන් ගුණතිලක මහතා පත් වූ අතර ශුද්ධෝත්තම පියතුමන් විසින් නව කාදිනල් හිමිපාණන් 19 දෙනෙක් අභිසෙස් ගන්වන ලදි. නි.ම.නි. නව ප්‍රාදේශාධිපති ලෙස ගරු රොහාන් සිල්වා නි.ම.නි. පියතුමා යළි පත්කර ගැණින.

## මාර්තු

භක්ති ප්‍රබෝධනය නව සංස්කාරක ලෙස ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි. පියතුමා පත් වූ අතර සැලේසියානු ලෝක ශ්‍රේෂ්ඨාධිපති ලෙස ගරු ඒන්ජල් ෆර්ඩිනැන්ඩස් පියතුමා පත් විය. ප්‍රවීන කිතුනු රංගන ශිල්පිනී මර්සි එදිරිසිංහ සග සුව දිනූ අතර ඇෆ්ගනිස්ථානයේ ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවට පැමිණියේ ය. බස්නාහිර පළාත් සභා මැතිවරණයෙන් පවත්නා රජය ජය තහවුරු කරගත් අතර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ දී ශ්‍රී ලංකාවට එරෙහි මානව හිමිකම් යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත විය. වසර 30 කට පසු යාල් දේවි දුම්රිය පලෙලෙයි දුම්රිය ස්ථානයට ළඟා වූ අතර මඟීන් 208 ක් රැගත් මැලේසියානු ගුවන් යානයක් අතුරුදන් විය.

## මැයි

ශ්‍රී ලංකා කතෝලික ර…
සසුන් පිය බැහැදැක්ම රෙ…
පැවැත්විණි. දිව්‍ය සත්ප්‍රසා…
ප්‍රාදේශියාධිපති ලෙස ගරු…
දි.ස.නි. පියතුමා පත් විය. …

ධර්මෝපදේශය දොරට වැ…
වන විශ්වීය දේව කැඳවීම් …
පැවැත්විණි.

## ජුනි

සිරිලක ප්‍රථම කතෝලි…
ආයතනය "වර්බුම්" නමින්…
මැල්කම් කාදිනල් රංජිත් හි…
විවෘත කරන ලදි. ගරු එස…
ජේ.නි. පියතුමා ලියූ "වාස්…
චරිතය" ග්‍රන්ථයේ සිංහල …
වූ අතර අති උත්තම ප්‍රැන්…
පියතුමා ඊශ්‍රායෙල් ජනාධි…
පෙරෙස් සහ පලස්තීන ජ…
අබ්බාස් සමඟ සාකච්ඡා ප…

ඉන්දියාවේ අති උතුම් …
හිමිපාණන් සහ මෙරට ගරු…
පියතුමා සගසුව දිනූහ. බේ…
නගරයේ සිංහල - මුස්ලිම් …
අතර ගරු පීටර් කෙරේ නි…
සගසුව දිනීය. ගරු සිරිල් …

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

ඥානාර්ථ ප්‍රදීපය



# තුනු ඇසින්

දගුරු සමුළුවේ
ර්මයේදී
ද නිකායේ
ඩිලාන් ප්‍රනාන්දු
කතෝලික සභා

පියතුමා ජාතික කතෝලික සන්නිවේදන අධ්‍යක්ෂ පදවි ලැබූ අතර ගරු සෑම් කුවින්ටස් පෙරේරා පියතුමා අගරදගුරු පදවි ධර්මදූත කලාපයේ නව නාහිමි ලෙස පත්විය.

ත්‍රස්තවාදීන්ගේ පීඩනයට ලක්ව සිටින කතෝලිකයන් පිළිබඳව අවධානය යොමු නොකිරීම පිළිබඳව බටහිර රටවලට ලෝක ප්‍රජාවගෙන් බරපතල චෝදනා එල්ල විය.


















### සැප්තැම්බර්

සුදුතුම් පිය ලංකා ගමනයේ පොලිස් සම්බන්ධීකරණ කාර්යාලය ස්ථාපිත කළ අතර එහි අධ්‍යක්ෂ ලෙස ප්‍රියන්ත ජයකොඩි මහතා පත් කර ඇත. ප්‍රවීන කිතුනු කලාකරුවකු වූ ඇන්ඩෘ ජයමාන්න මහතා සගසුව දිනූ අතර භාග්‍යවත් ජුසේ වාස් පිය සුදුවර දින ප්‍රකාශ කරන නිල නිවේදනයත් සමඟින් මෙරට කතෝලික ප්‍රජාව උද්දාමයට පත්වූහ. තමිල්නාඩු මහඇමතිනි ජයලලිතා ජෙයරාම් මහත්මිය සිවු වසරකට බන්ධනාගාර ගත කැරිණි. මරිය වසර නිමිත්තෙන් ලූර්දු නුවරට විශේෂ වන්දනා චාරිකාවක් පැවැත්විණි.

### ඔක්තෝබර්

අති උතුම් හයවන පාවුලු සුදුතුම් පියා භාග්‍යවරයට එසවුනු අතර සා. 23 වන ජුවාම් පිය මංගල්‍යය ඔක්තෝබර් 17 වන දිනටත් සා. දෙවන ජුවාම් පාවුළු මංගල්‍යය ඔක්. 22 දිනටත් යොදා තිබේ. සගසුව දිනූ ගරු පීටර් පිල්ලේ නි.ම.නි. පිය 50 වන ගුණ සමරු උත්සවය පැවැත්විණි. බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් වෛද්‍ය ක්‍රිස් නෝනිස් මහතා ඉල්ලා අස්වූ අතර වසර 24 කට පසු යාල් දේවි දුම්රිය යාපනයට නිරික්ෂණ චාරිකාවක ගමන් කළේය. මහින්ද රාජපක්ෂ ජනපතිවරයා 10 වැනි අය වැය ලේඛනය ඉදිරිපත් කළේය.

### නොවැම්බර්

ගරු හැරී මිලර් පියතුමාට ජාතික සාම මණ්ඩලයේ 2014 සාම ත්‍යාගය හිමිවිය. කොස්ලන්ද මීරියබැද්ද නාය යෑමේ ඛේදවාචකය මුළු රටම කම්පාවට පත් කළ අතර මෙරට කතෝලික රදගුරු සමුළුව ඊට සොව පළ කළේ ය. ජනාධිපතිවරණය නියමිත දිනට වසර දෙකකට පෙර පැවැත්වීමට ජනාධිපතිවරයා තීරණය කළ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහ ලේකම් මෛත්‍රිපාල සිරිසේන මහතා ප්‍රධාන විපක්ෂයේ අපේක්ෂකයා ලෙස තරගයට ඉදිරිපත් විය. මේ අතර එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් තිස්ස අත්තනායක මහතා ආණ්ඩුවට එක් වූ අතර ඇමතිවරුන් ඇතුළු මන්ත්‍රිවරුන් විපක්ෂයටත් විපක්ෂයේ අය ආණ්ඩු පක්ෂයටත් පිනුම් ගැසීමක් දක්නට ලැබිණි. සුදුතුම් පිය ලංකා ගමනෙන් දේශපාලන වාසි ලබා නොගන්නා ලෙස අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් දේශපාලන පක්ෂ වලින් ඉල්ලීමක් කළ අතර දේශපාලකයන් හා සසුන් පියා එකට සිටින පෝස්ටර් හා කටවුට් ඉවත් කරන ලෙසට ද ආයාචනා කළේ ය.

ඩි අතර 51
යාච්ඤා දිනය

ක රූපවාහිනී
අති උතුම්
හිමිපාණන් අතින්
. ජී. පෙරේරා
පිය ජීවන
අනුවාදය නිකුත්
සිස් සුදුතුම්
තී සීමොන්
නපති මහමුද්
ැවැත්විය.
ලූර්දුසාමි කාදිනල්
රු ලූෂන් ඩෙප්
රුවල දර්ගා
ගැටුමක් හට ගත්
.ම.නි. පියතුමා
ගාමිණී ප්‍රනාන්දු

### ජූලි

දියලගොඩ දොන් බොස්කෝ ළමා නිවාසයට සිය වසරක් සපිරේ. කතෝලික ජනමාධ්‍යවේදී සුහද හමුවක් පැවති අතර විශ්‍රාමික මේජර් ජෙනරාල් ඒ. පි. ඒ. චන්ද්‍රසිරි මහතා උතුරු පළාත් ආණ්ඩුකාරයා වේ. කිතුනු ගායක වින්සන්ට් ද පෝල් පීරිස් මහතා සගසුව දිනූ අතර රොහාන් වැලිවිට මහතාගේ "තිනෙත" චන්ද්‍රිකා රූපවාහිනී නාලිකාව ඇරඹේ. අගරදගුරු පදවි පූජක පුතුන් අට නමකගේ පූජකවර රජත ජයන්ති සැමරිණි.

### අගෝස්තු

දිව්‍ය ගැලවුම්කාරයාණන්ගේ නිකායට 75 වසරක් සපිරි අතර කොළඹ කතෝලික මුද්‍රණාලයට අනුබද්ධව කොළඹ කතෝලික පොත්හල අභිනවයෙන් විවෘත කැරුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් නායක ඇන්ජලෝ මැතිව්ස් පාකිස්ථානය සමඟ ක්‍රිකට් තරගයේ ජයග්‍රහණයට දේව පිහිට හේතු වූ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ ය. ඉස්ලාමීය

### දෙසැම්බර්

ජනවාරි 08 දිනට නියමිත ජනාධිපතිවරණයට අපේක්ෂකයන් 19 දෙනෙක් තරග කරන අතර ආණ්ඩු පක්ෂයෙන් මහින්ද රාජපක්ෂ මහතා ත් පොදු විපක්ෂයෙන් මෛත්‍රිපාල සිරිසේන මහතාත් අතර තරගය ඉන් ප්‍රධාන තැනක් ගනී. දිවයිනේ අයහපත් කාලගුණය නිසා ජල ගැලීම්, නාය යෑම් ආදියෙන් දස ලක්ෂයකට උන් හිටි තැන් අහිමි වී විසිඅට දෙනකුගේ ජීවිත විනාශ වී තිබේ. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා බරපතල ලෙස වැඩිවෙමින් පවතින අතර මඩ ප්‍රචාර අත් හරින්නැයි කතෝලික රදගුරු සමුළුව ඉල්ලීමක් කළේය.

**තියබෝල්ඩ් සමරතුංග**

# සිරිලක අපෝස්තුළුවරයාණන් සමරනු වස් ජාතික කතෝලික සිද්ධස්ථානයක අවශ්‍යතාවය

අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය සමස්ත ශ්‍රී ලාංකේය කතෝලික බැතිමතුන්ගේම අතිශය වැදගත් වූත්, වාසනාවන්ත වූත් අවස්ථාවකැයි සඳහන් කිරීම කිසි ලෙසකින්වත් අතිශයෝක්තියක් නොවනු ඇත. මෙම අති වැදගත් අවස්ථාවේ ඓතිහාසික වටිනාකම දෙගුණ තෙගුණ කරන කරුණක් වශයෙන් හඳුන්වා දිය හැකි එක්තරා අසමසම අවස්ථාවක් ද වෙයි. ඒ වූ කලී සිරිලක කතෝලික සසුන රැක ගැනීමේ කාර්යයෙහිලා මහඟු, අනගිභවනීය සේවයක් ඉටු කළ ජුසේ වාස් ධර්මදූතවරයාණන් ශුද්ධවරයට එසැවීම ද ජුසේ වාස් පියතුමන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් කතෝලික දහම ප්‍රචලිත කළ ඒ දේශයේ දීම සුදුතුම් පියාණන් විසින් සිදුකරනු ලැබීමයි. එය එක්තරා අන්දමක විරල මහඟු සිදුවීමක් ලෙසින් සඳහන් කිරීම සාවද්‍ය නොවේ. ශ්‍රී ලංකාද්වීපයේ කතෝලික සසුන නමැති පහන නිවී යාමට ඉඩ නොදී වැරයෙන් දැල්වීමට විවිධ පීඩන මැද එතුමා ගත් වීර්යය අසමසමය.

ජුසේ වාස් පියතුමා තමාගේ ධර්මදූත ව්‍යාපාරයේ මධ්‍යස්ථානය කන්ද උඩරට මහනුවර මුල්කරගෙන මුළු ශ්‍රී ලංකාව පුරාම ගත කළ කාලය එනම් ක්‍රි.ව. 1692-1711 දක්වා වූ සමය දෙවන විමලධර්මසූරිය (1687 - 1707) සහ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (1707 - 1739) යන රජවරුන්ගේ රාජ්‍යත්ව සමයේ දී ය.

වර්ෂ 1697 දී මහනුවර නගරය දෙවනත් කරමින් සිසාරා පැතිරී ගිය අති භයානක වසංගතයක් වූ වසූරිය රෝගය මුළු නගරයම ගිල ගනිද්දී වාස් පියතුමන් රෝගීන්ට උවටැන් කරමින් ඉටුකරන ලද මහඟු සේවය උන්වහන්සේ මහනුවර නගර වැසියන්ගේ ගෞරවාදරයට පාත්‍රවීමෙන් කතෝලික ධර්මය කෙරෙහි ලැදියාවක් ඇතිවීමටත් බලපෑ හේතුවක් විය. ලංකාවේ ඉතිහාසය පිළිබඳ වැදගත් මූලාශ්‍රයක් වන "මහා වංශයේ" (මහාචාර්ය විල්හෙල්ම් ගෛගර් සිය - මහා වංශ ඉංග්‍රීසි පරිවර්තනයේ දී මෙම යුගය "චූල වංශය" වශයෙන් හඳුන්වයි) මෙම යුගය අයත් වන කොටසේ දි ජුසේ වාස් පියතුමා පිළිබඳ මෙම පුවත් ඇතුළත් විය යුතු වුවත් "මහා වංශයේ" ලක්දිව බුදු දහමේ ඉතිහාසයක් වශයෙන් ද, රචනා වීමේ සම්ප්‍රදායක් පැවතියෙන් මෙම පුවත් එයින් බැහැර වන්නට ඇතැයි සිතිය හැකිය. එතකුදු වුවත් 1697 දී ජුසේ වාස් පියතුමන් සිදු කළ සේවය පිළිබඳව උන්වහන්සේගේ මරණින් අවුරුදු 120 කට පසු බෞද්ධ ගම්මුලාදෑනිවරයෙක් විසින් රචිත "විජිතවල්ලි රාජාවලිය" නම් පුස්කොල පොතක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ "හිවු නෙවිල්" එකතුවේ තිබී - අතිගරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් හට දක්නට ලැබීම මෙකී පුවත්වල ඓතිහාසික භාවයට සාක්ෂි දැරීමක් බඳුය.

ජනශ්‍රැති මඟින් ද ඓතිහාසික පුවත්වලට කිසියම් සාක්ෂි ලැබෙන අවස්ථාවක් තිබේ. ජුසේ වාස් පියතුමා පිළිබඳව මුඛ පරම්පරාගතව ආ ජන කවියක් මෙහි සඳහන් කරන්නේ මෙම පුවතේ සත්‍යතාවය කෙරෙහි ජන ප්‍රවාදානුගත සත්‍යයක් හෙළි කිරීමේ අභිලාෂයෙනි. මෙය මට පුද්ගලිකව අසන්නට ලැබුනේ 1983 දී 89 හැවිරිදි මහළු සැදැහැවතකුගෙනි.

ලකට ජුසේ වාස් එ පිය එව් දෙවි තුමට නිබඳ නිරතුරු — මංගලම්
ලකට මෙත් නෙත් යොමා බැලූ සුරතුමට නිරතුරු — මංගලම්
සතට කුළුණින් කහිත වෙහෙසා අනෙක වැඩ කර — මංගලම්
මොකට පත් ජුසේ වාස් පිය ගුණ සමර කර කිය — මංගලම්

මේ අනුව සිරිලක කිතු සසුන ස්ථාවර අඩිතාලමක පිහිටුවීමට අති මහත් වෙහෙසක් දරා එය සාක්ෂාත් කර ගැනීමේ වාසනාව ලද ජුසේ වාස් පියතුමා සිරිලක අපෝස්තුළුවරයා වශයෙන් ශුද්ධවරයට එසැවීමත් පාප්තුමාගේ ලංකාගමනත් යන ලාංකික කතෝලික දන හට අති වැදගත් සිදුවීම් ද්විත්වය එකට සිදුවීම අතිශය වාසනාවක් වශයෙන් හඳුන්වන අතරම එයට තෙවැනි කරුණක් ද එකතු කිරීම මෙම ලිපියේ පරමාර්ථයයි.

ඕලන්ද පාලනයේ ගැහැට නිසාම බිඳී විසිරී නැත්තටම නැතිවීමේ ඉරණමට මුහුණ පා තිබූ කතෝලික සසුන නැවත නිදි ගැට හැර පියා වර්තමාන දියුණු ස්ථාවර තත්ත්වයට පත් වනු පිණිස, නැවත ගොඩනැගීමේ අති දුෂ්කර මෙහෙය නොපසුබස්නා ධෛර්යයෙන් යුතුව සාක්ෂාත් කළ ජුසේ වාස් පියතුමා සමරනු පිණිස ජාතික කතෝලික සිද්ධස්ථානයක් ගොඩනැගීමේ ආරම්භය ද මෙම වාසනාවන්ත අවස්ථාවට එකතු කිරීම අතිශයින් වැදගත් වනු ඇත.

යෝජිත ජුසේ වාස් පියතුමාණන් සමරනු වස් ඇරඹෙන ජාතික කතෝලික සිද්ධස්ථානය ඉදිකිරීම සඳහා උන්වහන්සේගේ පාද ස්පර්ශයෙන් පවිත්‍ර වූ සහ උන්වහන්සේගේ දැනට ඇති එකම පාරිභෝගික හා උද්දේශික ධාතුව වන කළුවර ලී කුරුසිය හා සබැඳි වයඹ පළාතේ, හතලිස් පහ බස්නාහිර කෝරළයේ මඩදොඹේ ප්‍රදේශයට අයත් වන්නි වන මැද පිහිටි "මහගල්ගමුව ග්‍රාමය" සුදුසුම ස්ථානය බව සඳහන් කරන්නේ ඓතිහාසික තොරතුරු ආශ්‍රිතවමය.

මෙම ග්‍රාමය ජුසේ වාස් පියතුමන්ගේ ශාසනික සේවයට අනුගතව කතෝලික ජනාවාසයක් ව පැවතුන අතර අදත් එකී මුතුන් මිත්තන්ගෙන් පැවත එන කතෝලික බැතිමතුන්ගෙන්ම සපිරි කතෝලික ගමකි. පුත්තලම හා කල්පිටිය ආශ්‍රිත නෑසියන් ඇති ද්‍රවිඩ භාෂාව කතා කරන "මුක්කුවර්" ජනකොටසට අයත් මොවුන්ගේ ග්‍රාමය අතීතයේ දී "සම්මනිසි ස්වාමි" ලෙස ඔවුන් හැඳින් වූ ජුසේ වාස් පියතුමන්ගේ ආශ්‍රය නිතර ලද ගමක් බැව් පැහැදිලි වේ. වන සතුන්ගෙන් සිය භවබෝගවලට හා ජීවිත වලට ඇතිවන නිරන්තර පීඩා උදෙසා ආරක්ෂාවක් පැතූ ඔවුන් සඳහා අඩි හතරක් පමණ උස කළුවරලීයෙන් තැනූ කුරුසියක් උන්වහන්සේ විසින්ම ආසිරි ගන්වා ගම් සීමාවට ඇතුළුවන ස්ථානයක වූ පබලු ගසක් පාමුල වඩා හිඳුවා ගම් වැසියන්ට යාච්ඤා කිරීම සඳහාත් එමඟින් පිහිටාරක්ෂාවක් ලැබීමටත් ස්ථානයක් ස්ථාපිත කරන ලදි. ජුසේ වාස් පියතුමන්ගේ ජීවමාන සිහිවටනයක් හා ධාතුවක් වශයෙන් අද ද සුරැකිව ඇත්තේ ඔවුන්ගේ කිතුනු උරුමයත්, සිය මුතුන් මිත්තන් දෙවිඳුන් වෙත තැබූ අචල විශ්වාසයත් නිහඬව කියාපාන්නේ මෙම කුරුසයයි.

දැනට ශේෂ වී ඇති ජුසේ වාස් පියතුමා පිළිබඳ වූ එකම සදාතනික සිහිවටනය බඳුවූ මෙම ලී කුරුසිය හමුවූ උන්වහන්සේගේ නිරන්තර පාද ස්පර්ශය ලැබීමට වාසනාවන්ත වූ මහගල්ගමුවේ එකී පුන්‍ය භූමිය සිරිලක අපෝස්තුළුවරයාණෝ සමරනු වස් ජාතික කතෝලික සිද්ධස්ථානයක් ඉදිකිරීමට අතිශයින්ම යෝග්‍ය ස්ථානය වශයෙන් හඳුන්වා දීමට කැමැත්තෙමු. සිරිලක කතෝලික දහම් මඟෙහි එක්තරා ස්වර්ණමය සන්ධිස්ථානයක් බඳු ජුසේ වාස් පියතුමන්ගේ යුගය සමරනු වස් ජාතික කතෝලික සිද්ධස්ථානයක් ගොඩනැගීමේ මුල් ගල සිරිලකට සැපත් වන සුදොතුම් පියාණන්ගේ සුරතින් ආසිරි ගන්වා ගන්නේ නම් එය කතෝලික සසුනට පළඳවන මහානර්ඝ ආභරණයට යොදන මහානර්ඝ මැණික වන බව අපගේ විශ්වාසයයි. මෙකී යෝජනාව අරබයා සිරිලක කතෝලික රදගුරු මණ්ඩලයේ කුළුණු බර අවධානය යොමු වෙතැයි අපේක්ෂා කරමු.

**ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමා**
කුරුණෑගල කතෝලික රදගුරු පදවිය

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55



# රජෙක් උපන්නා!

**ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා**



# නත්තල් ගීතිකා

ශීත උඳුවප් මහේ උදාවත් සමගම ආගමන සමය නැවතත් එළැඹෙයි. ආගමන කාලය සූදානම් වීමේ කාලය වශයෙන් සලකනු ලැබේ. නත්තල් උළෙලට ක්‍රිස්තු භක්තිකයින් ආධ්‍යාත්මික වශයෙන්ද ලෞකික වශයෙන්ද සැරසෙන්නේ මහත් බලාපොරොත්තු සහිතවය.

ආගමන කාලයේ පළමු ඉරු දින සිට නත්තල් දිනය උදාවන තෙක් සැම ඉරු දිනකම ගැයෙන නත්තල් ගීතිකා අරුත් සහිතය. විදේශීය තනුවක් අනුව හලාවත රදගුරු හිමිව සිටි එඩ්මන් පීරිස් මාහිමියන් විසින් රචිත 'වඩිනු දෙව් මැසීයා' ගීය මීට අවුරුදු පනහකට උඩදීත් ගැයුවාක් මෙන්ම අදද ගයනු ලබන්නේ මහත් භක්තියකිනි. මෙම ගීය ගැයෙන විට භක්තිමතුන්ගේ සිත් තුළ නත්තල පිළිබඳව සුන්දර සිතිවිලි නිතැතින්ම හැඟේ. එදා දෙව් තුමන් ලොව පහල වනු දැකීමට ලෝක වාසින් මහත් බලාපොරොත්තු සහිතව බලාසිටියහ. ඔවුහු එලෙසින් ගැලවුම් කරුවාණන්ගේ පැමිණීම අපේක්ෂා කළේ මුළා වී සිටින ජනරැස සුමඟට යොමු කරනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි.

**වඩිනු දෙව් මැසියා**
**පතා සිටිත් මෙලෝ දනා**
**සිරින් පිරි දිනේයා**
**රකින්ට සතුටිනා**
**ආ එනු මැනේ දෙව් ස්වාමිනේ**
**නසා'පව් දොසා උදා කරන්**
**ඔබේ වරම් රැසා**
**වඩිනු දෙව් මැසීයා**
**බොහෝ අනාථසේය**
**මේ සාන්තියෙන් ආගමනය**
**මිනිස් වෙසින් වැසේය**
**ඔබේ ශ්‍රී මහිමය**

නත්තල් දින මැදියම් රැයෙහි පැවැත්වෙන මංගල පූජාවෙහිදි ගැයෙන Adeste Fldelis නමැති ලතින් ගීතිකාවත් Silent Night ගීතිකාවත් ලෝක ප්‍රකටය. ආඩෙස්ටේ ෆිඩේලිස් ලතින් ගීතිකාවේ ඉංග්‍රීසි සිංහල ගීතයන් අද පවා දේවස්ථානයන් හි ගයනු ලබන අතර Silent Night ගීතයේ සිංහල අනුවාදය නත්තල් සමය තුළදී දේවස්ථාන වල මෙන්ම භක්ති ගීත කණ්ඩායම් විසින් ගායනා කරනු ලැබේ.

මෙයට අවුරුදු පනහකට පෙරදීත් නත්තල් දින රාත්‍රියේ ගැයූ නත්තල් ගීත අද පවා ගයන්නේ නවතාවයකින් යුතුවය. දෙවියන් වහන්සේ අනාථව සිටි මිනිසා ගලවා ගැනීම සඳහා සිය පුත් ජේසුස් වහන්සේ මෙලොව වෙත එවූ අයුරු එයින් සිහිපත් කෙරේ.

**අනාදි දෙව් තුමා**
**අනාථ මනු සැමා**
**විනාශ නොවන සේ මෙමා**
**හූ ලෝකෙ වැඩි පෙමා**
**එසේය අපි සැමා**
**පුරාම හද පෙමා**
**දෙමෝය පඬුරු සේ අමා**
**දෙපාද නම නමා**
**අහෝ මේ බාල කුමරුවා**
**වෙව්ලා මේ සීතලේ**
**මේ තෘණ ආසනේ හොවා**
**සුයාන නැතිවදෝ**

පළමු නත්තල් රැයේ වූ විචිත්‍ර දර්ශන මේ ගීයෙන් සිතුවම් කර ඇත. මෙවන් ගීත කවර දිනකවත් අභාවයට නොයන අතර එම ගීතයන් ක්‍රිස්තු භක්තිකයින් විසින් වසරක් පාසා නත්තල් සමය තුළදී පුන පුනා ගායනය කරනු ලැබේ.

මෑතක සිට දෙව් මැඳුරු වල ගායනා කරනු ලබන ගිතිකා වල දේශීය ස්වරූපයක් පෙනෙන්නට තිබේ. පදමාලාව අතින් මෙන්ම එහි ගැබ් වූ අර්ථයෙන්ද සංගීත නාද රටාවෙන්ද දේශීය ස්වරූපයක් ගත් මෙම ගීතිකාවන් එහි සරල බව හා ගීතවත් බව නිසා ජනප්‍රියව ඇත. විශේෂයෙන්ම ගරු මර්සලින් ජයකොඩි පියතුමන් විසින් රචිත නත්තල් ගී බොහෝ දුරට භක්තිමතුන්ගේ මන බැඳ ගත්හ. අයිවර් ඩෙනිස් හා ජේ. කේ. එස්. පෙරේරා විසින්ද බෙනදිකාන නිකායට අයත් පියවරුන් විසින්ද බැඳි නත්තල් ගී නත්තල් සමය තුළදී භක්ති ගීත වශයෙන් ගායනා කරනු ලැබේ.

නව නත්තල් ගී අතරින් ගරු මර්සලීන් ජයකොඩි පියතුමන්ගේ 'රෑ තරු බබලනවා' ගීතය නත්තල් සමයේදී නොගයෙන දේවස්ථානයක් නැත. නොගයන භක්ති ගීත කණ්ඩායමක් නැත. එහි පද බැඳුමත් සුමදුර සංගීතයත් හේතුවෙන් එදා පළමු නත්තල් දිනයේදී බෙත්ලෙහෙමෙ සුන්දර පරිසරය කරා අප ගෙන යනු ලබයි.

**රෑ තරු බබලනවා මල් පිපිලා වාගේ**
**එලියෙන් නැහැවෙනවා මල්**
**වැහැලා වාගේ**
**රැව් පිළිරැව් දෙනවා ගීත නාද වාගේ**
**ගීත නාද වාගේ**
**බිළිඳෙකු හිනැහෙනවා මුහුදක රැළි**
**වාගේ**

**සීත සුළං එනවා උයනක සිරි වාගේ**
**ගොපලුන් දුර එනවා පැනි බඹරුන්**
**වාගේ**
**රැව් පිළිරැව් දෙනාව ගීත නාද වාගේ**
**ගීත නාද වාගේ**
**බිලිදෙකු හිහැහෙනවා මුහුදක රැළි**
**වාගේ**

**බිළිදෙකු හිනැහෙනවා පොපියන**
**කුසුම් වගේ**
**තුරුලක පෙරලෙනවා හිම මත හිම**
**වාගේ**
**රැව් පිළිරැව් දෙනවා ගීත නාද වාගේ**
**ගීත නාද වාගේ**
**බිළිඳෙකු හිනැහෙනවා මුහුදක රැළි**
**වාගේ**

'අරුණ දිස්න' නමින් පළ කර ඇති බෙනදිකාන නත්තල් ගී අතරින් ගරු අබා කොස්තා පියතුමන් විසින් රචිත ඩී. ශ්‍රෙෂන් මාර්ක් හිලරි ජයකොඩි විසින් ස්වර රචනා කරන ලද 'සග සැපසාමේ' ගීතය ඉතාමත්ම අර්ථවත්ය.

තුරු ලිය සුවඳ මලින් සරසන්නයි
අම රස පිරි රස පල හට ගන්නයි
එක තැන හිත්වල හැඟුම් රඳන්නයි
දෙරණ පුරා සුර ලොවක්
මැවෙන්නයි

සග සැප සාමය අප වෙතැ
රැගෙනේ
මැදි රැය දෙව් පුතු මෙලොව
උපන්නේ
එතුමන් ඇති තැන වරම් පිරෙන්නේ
වරමින් පිරි හද පැතුම් පුරන්නේ

මුළු සක්වල එක පවුලක් වන්නට
එක ගීය එක හඬින් ගයන්නට
ආදරය සොයුරු දහම වඩන්නට
නෙත් යුග අත්වැල් එකට
බැඳෙන්නට

ඈත අහසේ තරුවක් බලා....

ප්‍රකට කතෝලික ගී ප්‍රබන්ධයක් වන හියුබත් දිසානායක, ලෙස්ලි බොතේජු, කැලිස්තස් ජයසිංහ, පයස් ප්‍රනාන්දු, කේ. ප්‍රැන්සිස්, කදිරාණෙ රණසිංහ වැනි අයගේ ගී එකතුවක් වන 'නත්තලි' කැලිස්තස් ජයසිංහ විසින් රචිත අයිවර් ඩෙනිස් විසින් ස්වර රචනා කරන ලද 'බබෙක් නිදයි' මැයෙන් යුත් ගීතය වඩාත්ම ලගන්නා සුළුය.

**නෙළුම් මලක් වගේ මේ දැන් පිපී**
**පහන් සිලක් වගේ කැළුම් දිදී**
**සුපුන් සඳක් වගේ බැලුම් හෙලා**
**නිසන්සලේ බබෙක් නිදයි මෙරැ**
**අහස් කුසේ වළා වියන් ඇදේ**
**දහස් ගණන් තරුත් සිරින් දිලේ**
**ගසුත් වැලුත් නටයි සුලන් ගහේ**
**නිසන්සලේ බබෙක් නිදයි මේ රෑ**

මෙයට පනස් වසරකට ඉහතදී ගැයූ නත්තල් ගීතිකාවන් තවමත් නත්තල් සමය තුළ දී නවතාවයෙන් යුතුව ගායනා කෙරෙන අතර මෑතකදී රචිත නත්තල් ගීතිකාවන්ද මහත් භක්තියකින් හා අභිරුචියකින් යුතුව ගායනා කරනු ලැබේ. එයින් හදවත් තුළ නැගෙන භක්තිය. බලාපොරොත්තුව හා සැනසුම නත්තල් සමය අපගෙන් ඉවත්ව යන තුරුම රැඳී පවතී.

'ගැයීම හෙවත් ගීතිකා මගින් දෙවිඳුන්ගේ ගුණ පළ කිරීම උසස් ක්‍රියාවක් බව සුද්ධ ලියවිල්ලේ සඳහන් වී තිබේ. ඒ නිසා සභා මාතාවද එදා සිටම ගායනය අගය කොට සලකන්නීය. මිනිසා තුළ ඇති හැඟීම් වඩාත් බලවත් ලෙස පසක් කර දීම සඳහා හේ ගීය උපයෝගි කර ගත්තේය. සොම්නස හෝ දොම්නස හෝ වටාපිටාවේ පතුරුවා හැරීමටද ගීය මහඟු අවියකි.

කිතු සමිඳුන් උපත ලත් මැදි රැයේ එඬේරුනට සුපුවත හෙලි කරන ලද්දේද ගීයෙනි'යැයි විශ්‍රාමික ඔස්වල්ඩ් ගෝමිස් කොළඹ රදගුරු හිමියෝ සඳහන් කර තිබේ.

නත්තල් ගීතිකාවන් නැති නත්තලක් නොමැත. එදා සිට මෙදා වන තුරු නත්තල් ගීතා වලියට එක්වුන ගී සියගණනකි. නත්තල් සමය තුළදී මේවා ගැයෙන්නේ භක්තියකින් හා මහත් අභිරුචියකිනි.

**ලියෝනාර්ඩ් මනම්පේලි**

# නත්තල් ගහේ සුල මුල දැන ගනිමු

**ජේසු උපත සමරන නත්තලත් සමග නත්තල් ගසට ඇත්තේ සුවිශේෂී ස්ථානයකි. නත්තල් ගසේ ආරම්භය කිතු දහමේ ආරම්භයටත් පෙර සිදු වූවකි.**

ඈත අතීතයේ මිත්‍යා මත ඇදහූ ගෝත්‍රික ජනයා තම ආගමික උත්සව වල අංගයක් ලෙස වෘක්ෂ වන්දනාව කර ඇත. පුරාණ බ්‍රිතාන්‍ය ජාතිකයෝ අස්වැන්නට බුහුමන් දක්වන්නට පලතුරු හා ඉටිපන්දම් වලින් සැරසූ ඕක් ගස් භාවිත කර ඇත.

මේ විකාශනයත් සමග නත්තල් ගස නත්තල හා සම්බන්ධ වූවේ කෙසේද? එක් පැරණි කථාවක මෙසේ සඳහන්ය. බොනිපස් සාන්තුවරයා ඕක් ගසක් යට ළමයෙකු බිලි දීමට යන ගෝත්‍රික මිත්‍යා මත ධාරි ජර්මානුවන් පිරිසක් දැක ළමයා වහා බේරාගෙන ඕක් ගස කපා දේවදාර ගසක් සිටුවා මෙය ජීවන වෘක්ෂය බවත් මෙයින් ජේසු සමිඳුන් නිරූපනය වන බවත් සාන්තුවරයා මිත්‍යා දෘෂ්ටිකයින්ට පවසා ඇත.

මේ තවත් පුරා වෘත්තයකි. රෙපරමාදු ආගමේ ආරම්භකයා වන මාර්ටින් ලූතර් දේව ගැතිවරයා දිනක් රාත්‍රියේ වනාන්තරයක් මැදින් ගමන් කරන විට ගස් අතරින් දිලිසෙන තරු වළල්ලක් දැක විස්මිතව එම දසුන සිහි කරනු වස් කැලයෙන් ගසක් කපාගෙන ගොස් ඉටි පහන් වලින් ගස සරසා තම නිවස ඉදිරි පිට ප්‍රදර්ශනය කළේලු. පුරාණ ජර්මන් ජාතිකයෝද නත්තල් දිනට සමගාමීව සදාහරිත ගසක් සරසා තම නිවස ඉදිරිපිට ප්‍රදර්ශනය කළ බව පැරණි මූලාශ්‍රවල සඳහන් වේ. එංගලන්තයේ නත්තල් ගසේ ආරම්භය සිදු උනේ 1841 දීය.

ඒ ඇල්බට් රජු හා වික්ටෝරියා රැජින සමයේය. ඔවුන් සදාහරිත ගස්, පලතුරු, රස කැවිලි හා ඉටිපන්දම් වලින් සරසා වින්සන්ට් මාලිගය ඉදිරිපස තබා නත්තල සැමරුවා. මේ ආකාරයෙන් නත්තල හා සබැඳිව නත්තල් ගස ලොව පුරා ව්‍යාප්තව ඇත. ලොව ඉතාම ආකර්ශණීය නත්තල් ගස් බ්‍රිතාන්‍ය රජයේ ට්‍රැපල්ගා චතුරස්ශයේ දැකිය හැකිය.

**පීටර් කැමිලස් සුබසිංහ**
පොත පත ඇසුරෙන්



# දේව ප්‍රේමයේ බලය

සියල්ල අතහැර ජීවිතේ කලකිරි සිටි මොහොතක මට ඔහු හමුවිය. මුළු ලොව රඳා ඇත්තේ ප්‍රබල මිනිසුන්ගේ දෙඅත් මත බව මගේ හැඟීම විය. ඒ නිසාම දුබල මට කිසිදිනක ලෝකය ජයගත නොහැකි බවත් මගේ අරමුණ කිසිදිනක ඉටු කරගත නොහැකි බවත් මට අවබෝධ විය. එහෙත් මේ සියල්ල මුසාවක් කරමින් ඔහුගේ දෑස මට මුණගැසුණා.

කෲර මිනිසුන්ගේ නපුරු හදවත් වලට වඩා ප්‍රබල උතුම් හදවතක් ඇති ඔහු ඇත්තටම මගේ ජීවිතය විය. ඔහුගේ ප්‍රබල වූ දෑත් මා වෙත දිගු කරමින්, ඔහු සමග නව සබැඳියාවකටත්, දුක්විඳින. අසාධාරණයට පත මිනිසුන් වෙනුවෙන් ජීවත් වන්නට ඔහු මට ඇරයුම් කළා. සියල්ල අතහැර දමා මම ඔහු පසුපස ගමන් කළා. අද මම සියල්ල ජයගෙන ජීවිත අරමුණු අවබෝධ කරගනිමින් ඔහුගේ ආදරණීය මනාලිය ලෙස ජීවත් වෙමි. ඔහුගේ ආදරය හැර අන් කිසි සතුටක් මට නැත. පොළවේ දූවිලි අංශුවක් වැනි මගේ ජීවිතය වෙනස් කළ හැක්කේ බලවත් වූ ඔහුගේ ආදරයට බව දැන් මම දනිමි. මේ සියල්ල වෙනස් කරමින් ජීවිත අවබෝධය ලබා දුන් දයාබර ඔහු වෙන කිසිවකු නොව මගේ ස්වාමියාණන් වූ කිතු සමිඳාණන්ම විය. දැන් මම මගේ ස්වාමියාණන්ගේ ආදරය බලවත් සේ අත්දකිමි.

**ගරු හෙල්ඩා සුරංගනි සොයුරිය**
දිව්‍ය හෘදයේ අපස්වාමිදුගේ පැවිදි පන්තිය
ඉරණවිල

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

# කතෝලික සංවිධාන එකතුව සකස් කළ යෝජිත ව්‍යවස්ථා සංශෝධන යෝජනාවලිය

'කිතු හඬ' කතෝලික දහම රැකගැනීමේ ජාතික ව්‍යාපාරයේ සංවිධානයෙන් ''ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පතේ මැදිහත්වීමෙන් සහ තවත් කතෝලික සංවිධාන 8ක සහභාගීත්වයෙන් කතෝලික ජනතාවගේ අදහස් 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පත හරහා රැගෙන එම අදහස් හා යෝජනා පාදක කරගනිමින් විද්වත් මඩුල්ලක් හා කතෝලික පියවරුන් එක්ව සකස්කරනු ලැබූ යෝජිත ව්‍යවස්ථා සංශෝධනය පසුගියදා එළිදැක්විය. ඒකීය රටක් තුළ රටේ නීතිය හා සාමය, දූෂණය පිටු දැකීම හා යහපාලනය ඇති කිරීම, සැබෑ ආර්ථක සංවර්ධනයක් ඇති කිරීම, ආගමික සහජීවනය ඇති කිරීම, රටේ සම්පත් සුරැකීම හා වැඩි වර්ධනය කිරීම, අධ්‍යාපනය, පරිසරය, අධ්‍යාපනයේ දූෂණ අවම කර වර්ධනය කිරීම මෙම ව්‍යවස්ථා සංශෝධන යෝජනාවලියට ඇතුලත්ය. 'කිතු හඬ' කතෝලික දහම රැකගැනීමේ ජාතික ව්‍යාපාරය විසින් මෙම ව්‍යවස්ථා සංශෝධන යෝජනාවලිය ජනාධිපතිවරණ අපේක්ෂකයින් සියල්ලන්ටම හා ආගමික නායකයින් සියල්ලන්ට ප්‍රදානය කිරීමට නියමිතය. ව්‍යවස්ථා සංශෝධන යෝජනාවලිය සවිස්තරාත්මකව මෙසේය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1. විධායක ජනාධිපතික්‍රමය අහෝසිකිරීම හෝ පාර්ලිමේන්තුවට වගකියන අන්දමින් නිසි පරිදි සංශෝධනය කිරීම.

2. ඒකීය රටක් තුළ භෞමික අඛණ්ඩතාවය රැකෙන පරිදි බලය විමධ්‍යගත කිරීම.

3. මුදල් නාස්තිවන හා ප්‍රචණ්ඩත්වයට මග පාදන මනාප ක්‍රමය වෙනුවට නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීම.

4.මැතිවරණ සඳහා ඉදිරිපත් වන සියළුම අපේක්ෂකයින් සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සීමාවක් අනිවාර්යයෙන් ඇතිකරවීම.

<u>එනම්:</u>

i. ප්‍රදේශීය සභා අපේක්ෂකයින් සඳහා අවම වශයෙන් සා.පෙළ වැඩ 8ට සමත්ව තිබීම.

ii. පළාත් සභා අපේක්ෂකයින් සඳහා අවම වශයෙන් උසස් පෙළ වැඩ 3ක් සමත්ව තිබීම.

iii. පාර්ලිමේන්තු අපේක්ෂකයින් සඳහා අවම වශයෙන් උසස් පෙළ වැඩ 3ක් සමත්ව තිබීම.

iv. රජයේ අමාත්‍ය හෝ නියෝජ්‍ය අමාත්‍ය තනතුරක් දැරීම සඳහා අවම වශයෙන් උපාධියක් ලබා තිබීම.

එම දරණ අමාත්‍යංශය සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

(මේ සම්බන්ධව රජය මැදිහත් වී සියළු අමාත්‍ය තනතුරු සඳහා පාඨමාලා පැවැත්විය හැකිය)

vii. දහම් පාසල් (කවර ආගමක් හෝ අනිවාර්ය වීම)

## පරිසරය

1. ස්වභාවික වනාන්තර, ගස්වැල්, පරිසරය අනවසරයෙන් විවිධ ව්‍යාපෘති සඳහා දේශපාලන බලය මත අත්පත් කර ගැනීමත්, රක්ෂිත වනාන්තර හෙළි කිරීමත්, අනවසර දැව ජාවාරම වැළැක්වීමටත් දැඩි දඬුවම් ගෙන එමින් පියවර ගත යුතුය.

<u>මේ යටතේ:</u>

i. ජාවාරම් සඳහා සහාය දෙන දූෂිත වන සංරක්ෂණ නිලධාරීන්ට එරෙහිව දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීම.

ii. දැනට අනවසරයෙන් එලිකර ඇති හා අත්පත් කරගෙන ඇති සියළු ව්‍යාපෘති නතරකර නීති විරෝධී එම කටයුතු සඳහා දැඩි නීති රීති පද්ධතියක් ගෙන ඒම.

iii. වන සංරක්ෂණයට, පරිසරය සුරැකීමට දැඩි නීති පද්ධතියක් ගෙන ඒම.

iv. අනවසර දැව ජාවාරම සම්බන්ධ දැඩි නීතිරීති ගෙන ඒම.

2. අලි ඇතුන් සහ අනිකුත් වන ජීවින් අනවසරයෙන් පුද්ගලික පරිහරණයට යොදා ගන්නා පුද්ගයින් සම්බන්ධව දැඩි ක්‍රියාමාර්ග ගෙන ඔවුනට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේදයක් සැකසීම

3. රටේ සිදුවන සියළුම සංවර්ධන ව්‍යාපෘති, ඉදිකිරීම වැනි සියල්ලේදී පරිසර හානිය අවම කිරීමේ නිසි ක්‍රමවේදයක් සැකසීම.

## කලාව

1. පක්ෂ දේශපාලනයේ අතකොළුවක් නොවී සියළුම අංශවල කලාකරුවන්ට සිය හෘද සාක්ෂියට අදලව නිදහසේ සිය කලා නිර්මාණ කළ හැකි පරිසරයක් ඇති කිරීම.

2. නාට්‍ය සිනමාව, නැටුම්, සංගීතය ඇතුළු ප්‍රධාන කලා අනුමණ්ඩලයන්හි සභාපතිවරුන්ගේ වැඩ පහසුවීම හා විධිමත්වීම සඳහා ඒ සෑම අනුමණ්ඩලයකටම සුදුසුකම් සහිත විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් ඇතිකර සෑම ක්‍රියාකාරකමක්ම එම විද්වත් කමිටුවේ පූර්ණ අනුමැතිය සහිතව කිරීමට හැකි වනසේ බලතල ඇති කිරීම.

3. කලාකරුවන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීම.

4. වයෝවෘද්ධ කලාකරුවන් රැකබලා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ඇති කිරීම.

5. කලාකරුවන්ගේ කලාකටයුතු සඳහා අවශ්‍ය කලා උපකරණ හා සේවා සඳහා බදු සහන ලබාදීම.

6. අධික මිලගණන් අයකරනු ලබන 'නෙළුම් පොකුණ' වැනි රඟහල් වෙනුවට සහන මිලකට රංග ශාලා, පුහුණුවීම් ශාලා, දේශන ශාලා, රැස්වීම් ශාලා, නේවාසික පහසුකම්, අන්තර්ජාල පහසුකම්, ප්‍රියසම්භාෂණ හා විනෝද පහසුකම් හා පංති පැවැත්වීමේ පහසුකම් සහිත අංගසම්පූර්ණ කලා සංකීර්ණයක් ඉදිකර සහන මිලට එය පරිහරණය කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම.

7. දේශීය කලාකරුවන්ගේ දෙස් විදෙස් අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදිය හැකි අන්දමේ ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කිරීම.

8.නාට්‍ය, චිත්‍රපට, කෙටි චිත්‍රපට වැනි අංග ප්‍රාදේශීය මට්ටමින් ගෙනගොස් ප්‍රදර්ශනය කළ හැකි වන ලෙස කුඩා රංග ශාලා පද්ධතියක් රට පුරා ඇති කිරීම.

9. නව කලා නිර්මාණ සඳහා ණය ආධාර හා අරමුදල් ලබාදීමේ විධිමත් ක්‍රමවේදයක් සැකසීම.

10. නිසි සුදුසුකම් සපුරණ සියළු කලාකරුවන්ට රටේ ඕනෑම තැනක නිසි පිළිගැනීමක් ලැබෙන පරිදි හැඳුණුම්පතක් නිකුත් කිරීම හා රාජ්‍ය අනුග්‍රහයෙන් එම හැඳුණුම්පත නිකුත් කිරීමට විද්වත් කමිටුවක් ඇති කිරීම.

## ක්‍රීඩාව

1. ක්‍රීඩාවේ දේශපාලන අතපෙවීම් අවම වන අන්දමින් ස්වාධීන ක්‍රීඩා කොමිසමක් ඇති කරමින් ක්‍රීඩාව ස්වාධීනව පවත්වාගෙන යෑමට පරිසරයක් නිර්මාණය කිරීම.

2. ගම්බද දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කළ හැකි පරිදි සියළු පහසුකම් වලින් පිරි තාක්ෂණික විද්‍යාල සෑම දිස්ත්‍රික්කයකම ඇති කිරීම.

3. ක්‍රීඩා අතුරු කමිටු පත් කිරීම මගින් දේශපාලන අතපෙවීම් සිදුකරනු වෙනුවට නිසි පාලක මණ්ඩල නියමිත කාල වකවානුවල ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පැවැත්වීමට අවශ්‍ය පරිසරය සැකසීම.

## මාධ්‍ය, තොරතුරු හා ජනසංනිවේදනය

1. ඉන්දියාවේ තොරතුරු දැනගැනීමේ පණත සැකසීම ආභාෂයට ගෙන එම පණතටද වඩා ප්‍රබල තොරතුරු දැනග ැනීමේ පණතක් සම්මත කිරීම.

2. නව සන්නිවේදන උපකරණ, පරිගණක වැනිදේ අඩුමිලට ලබාගත හැකි පරිදි මෙරට නිශ්පාදනය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

3. සන්නිවේදන හා ජනමාධ්‍ය උපකරණ සහන මිලට හෝ තීරුබදු රහිතව ලබාගැනීමේ වැඩපිළිවෙලක් සැකසීම.

4. රටේ සියළුම දෙනාට අන්තර්ජාල පහසුකම් හා අන්තර්ජාල දැනුම නොමිලේ ලබාදිය හැකි අන්දමේ ක්‍රමවේදයක් සැකසීම.

5. වෙබ් අඩවි හා බ්ලොග් අඩවි වාරණය හා අවහිර කිරීම නවතා වෙබ් අඩවි නිසි ප්‍රමිතියකට ගෙන ඒමේ ක්‍රමවේදයක් සැකසීම.

6. මුද්‍රිත කඩදසි හා මුද්‍රණ අමුද්‍රව්‍ය බද්දෙන් නිදහස් කර මුද්‍රණ කර්මාන්තයට සහන සැලසීම

7. විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනී සහ ගුවන්විදුලි) සඳහා වාර්ෂිකව බලපත්‍ර අළුත් කිරීමේ ක්‍රමවේදය වෙනුවට දීර්ඝ කාලීනව අවසර ලැබෙන නිසි ක්‍රමවේදයක් සැකසීම.

8. මාධ්‍යවේදීන් සඳහා රක්ෂණ ක්‍රමයක් හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම.

## නාස්තිය හා දූෂණය අවම කිරීම

1. පාර්ලිමේන්තු මන්ත්‍රී මණ්ඩලය සීමා කිරීම, අනවශ්‍ය වියදම් කපා දැමීම, සියළු අමාත්‍යාංශවල නාස්තිය, දූෂණය හා අපතේ යැවීම් අවම කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

3. අල්ලස් නීතිය සංශෝධනය කර අල්ලස් ලබා ගන්නන්ට ලබා දෙන දඬුවම් දැඩි කිරීම හා අල්ලස් ලබා දෙන්නන් යම් ලෙසක රජයේ සාක්ෂිකාරයෙකු ලෙස අල්ලස් ලබාගන්නන් හෙළි කරන අවස්ථාවන් වලදී ඔවුන්ගේ දඬුවම් අවම කිරීම හෝ දඬුවම් ඉවත් කිරීම.

4. සියළුම ව්‍යාපෘති, ඉදිකිරීම්, සංවර්ධන යෝජනා ක්‍රම සම්බන්ධව සම්පූර්ණ අයවැය වාර්ථාවක් රටේ මහජනයාට දැකගත හැකිසේ ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

5. රේගු, පොලිස් ඇතුළු වැටලීම් වලදී අත් අඩංගුවට ගන්නා බඩු භාණ්ඩ සම්බන්ධව තොරතුරු විනිවිදභාවයකින් යුතු රටේ ජනතාවට දැන ගැනීමට ක්‍රමවේදයක් සැකසීම.

6. සෑම පාර්ලිමේන්තු නියෝජිතයෙකුම වසරකට වරක් සිය වත්කම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා එය ජනතාව අතර ප්‍රසිද්ධියට පත් කිරීමට පියවර ගැනීම.

## ආගමික හා ජාතික සහජීවනය

1. පාසැල් අධයාපන ක්‍රමය තුළ ජාතික හා ආගමික සජීවනය මුල් කර ගනිමින් සියළුම දෙනාට සියළු භාෂාවන්, සියළු ආගම්, සියළු ජාතීන්, සියළු සංස්කෘතීන් සම්බන්ධව දැනුම හා අවබෝධය ලබාදීමේ ක්‍රමවේදයක් සැකසීම.

2. සංස්කෘතික ලෙස ජාතීන් හා ආගමිකයින් අතර සහජීවනය ඇති කිරීමේ වැඩසටහන් පද්ධතියක් ඇති කිරීම.

3. යුද්ධයෙන් අවතැන් වූ, පීඩාවට පත් වූ, මානසික ආතතියට පත්වූ, ජීවිත අහිමි වූ උතුරේ සහ දකුණේ සියළු පවුල් වෙත සාධාරණයක් ඉටු කිරීමේ නිසි ක්‍රමවේදයක් සැකසීම.

## යහපාලනය, දුෂණ වංචා වැළැක්වීම

1. රටේ රාජ්‍ය බැංකුවලින් මහා පරිමාණ ණය ලබාගෙන ඒවා නොගෙවා පැහැර හරින්නන්ගෙ න් ඒවා නැවත අය කර ගැනීමට දැඩි නීති ඇති කිරීම.

2. සගවා හෝ විදේශ බැංකු ගිණුම් තුළ රහසේ පවත්වාගෙන යන කළු සල්ලි නැවත මෙරටට ගෙන්වාගෙන ඒවා රටේ ආර්ථිකයට යොදවා ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් සැකසීම.

3. රටේ ආර්ථිකයට අයවිය යුතු ආදයම් බදු නොගෙවා පැහැරහැර ඇති සියම ව්‍යාපාරිකයගෙන් මෙතෙක් ගෙවීමට ඇති බදු සියල්ල අයකර ගැනීමට කටයුතු කිරීම.

4. සෑම ව්‍යාපාතියක්ම විනිවිද භාවයකින් යුතුව නිසිලෙස ටෙන්ඩර් පටිපාටියක් සහිතව මහා පරිමාණ ව්‍යාපෘති කිරීමේ ක්‍රමවේදයක් සැකසීම. ස්වාධීන ටෙන්ඩර් මණ්ඩලයක් පිහිටුවීම.

5. ස්වාධීන පොලිස් කොමිසමක්, ස්වාධීන මැතිවරණ කොමිසමක්, ස්වාධීන ආරක්‍ෂක අංශ කොමිසමක්, ස්වාධීන අධිකරණ කොමිසමක්, ස්වාධීන අල්ලස් හා දූෂණ කොමිසමක්, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් පිහිටුවා රටේ නීතිය ආරක්‍ෂාව හා යහපාලනය සඳහා කටයුතු යෙදීම.

6. කැසිනෝ, රෙස්බයිරෙස්, ජැක්පොට්, හා වෙනත් සියම සූදු මෙරටින් ඉවත් කිරීම හා රටේ සාමාන්‍ය ජනතාව සූදුව තුළින් ආර්ථික අවපාතයකට ඇද දැමීම නැවැත්වීම.

7. හෙරොයින්, කුඩු, එතනෝල්, කසිප්පු, ගංජා වැනි මත්ද්‍රව්‍ය මැඩලීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ඇති කිරීම හා ඒ සඳහා අවශ්‍ය දැඩි නීති රීති සම්පාදනය කිරීම.

8. රටේ ඇති, සුරාසැල් බලපත්‍ර සීමා කරමින් මතට තිත සැබෑ ලෙසම ක්‍රියාත්මක කරන ක්‍රමවේදයක් සැකසීම.

9. මීගමුව, වත්තල, ජා-ඇල, කටාන, හලාවත, වෙන්නප්පුව වැනි කතෝලික බහුතරයක් ජීවත්වන ''කතෝලික ජන මූල ප්‍රදේශවල'' ක්‍රියාත්මකවන දුරාචාරයන් මැඩලීමට නිසි පරිදි නීතිය ක්‍රියාත්මක කිරීම.

10. අනවසර ගිනි අවි සියල්ල අත්අඩංගුවට ගැනීමට හා පාතාලය මර්ධනය කිරීමට නිසි ක්‍රමවේදයක් සකසා දැඩි නීති රීති සැකසීම.

11. සිගරැට් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනවලට ඉතා ඉහල බද්දක් හා නීති රීති පනවමින් එතුළින් ලැබෙන ආදයම ජනතා ප්‍රයෝජනයට යොදවීම.

12. රාජ්‍ය සේවකියන් හා රජ්‍ය දේපළ මැතිවරණ වලදී පක්‍ෂ දේශපාලන වැඩ කටයුතුවලට යොදු ගැනීම වලකන ක්‍රමවේදයක් සැකසීම.

## අධ්‍යාපනය

1.පාසල් පෙළපොත් සැකසීමේ දී කිසිදු ආගමික විශ්වාසයකට, චාරිත්‍රයකට, පිළිවෙතකට හානි වන සේ අගරු වන ආකාරයට කටයුතු කිරීමෙන් වැලකී සිටීම.

2.පලාත් සභා යටතේ පාසල්වල ප්‍රතිපාදන වෙන් කිරීමේ දී විෂමතාවයකින් තොරව සියළු පාසල්වලට සමසේ ප්‍රතිපාදන බෙදහරින ක්‍රමවේදයක් සැකසීම.

3.රජයේ ගුරුපත්වීම් ප්‍රදානය කිරීමේ දී කතෝලික දහම් පාසල්වල උගන්වන ගුරුවරුන්ට අවස්ථාවක් ලබා දීම.

4.මෙරට රජයට පවරාගත් කතෝලික පාසල්වල මෙන්ම රජයේ පාසල්වල කතෝලික ධර්මය ඉගැන්වීමට ගුරුභවතුන් හිගකම නිසා කතෝලික දුදරුවන්ට පාසලේ දී අන්‍යාගම් ඉගෙන ගැනීමටත්, ඇතැම් අවස්ථාවල වෙනත් ආගමක් විභාග විෂය ලෙස පෙනී සිටීමටත් සිදුව ඇත. මේ තත්ත්වය සමනය කිරීම සඳහා කතෝලික ධර්මය ඉගැන්වීමට රජයේ ගුරුවරුන් බඳවා ගන්නට පියවර ගන්නැයි ඉල්ලා සිටිමු.

1960 දී මෙරට කතෝලික පාසල් රජයට පවරාගත් අතර රජයට පවරාගැනීමේ දී පැවැති ආගමික ප්‍රතිශතය පවත්වාගෙන යෑමට නීතිමය ප්‍රතිපාදන ලබා දී ඇතත් ප්‍රායෝගික මට්ටමින් එය සිදු නොවේ. මේ පාසල් වල එකී ප්‍රතිශතය පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

6.කතෝලික පාසල් රජයට පවරා ගැනීමේ පනතට අනුව එකී පාසල් ගොඩනැගිලි සියල්ල අයත් වන්නේ කතෝලික සභාවට වන අතර, ඒවා ආපසු කතෝලික සභාවට පවරා දීමේ එකඟතාවයකට යටත්ව පරිහරණය කැරේ. ඒ අනුව මේ පාසල් ගොඩනැගිලි ආපසු අදළ අංශයන්ට පවරා දී විකල්ප ගොඩනැගිලි ඉදිකිරීමට පියවර කිරීම.

## ආගමික හා සංස්කෘතිය

1.ආගමික සහජීවනය ඇති කිරීමටත් රටතුළ වරින් වර ඇතිවන ආගමික ගැටුම් සමනය කළ හැකි වන පරිදි සියළු ආගම් නියෝජනය වන පරිදි බලතල සහිත ආගමික කමිටුවක් පත් කිරීම.

2. කිතුනුවන් සඳහා යලි ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයක් ඇති කරමින් ඒ සඳහා අමාත්‍යවරයෙකු හෝ අධීක්‍ෂණ අමාත්‍යවරයෙකු පත් කිරීම.

3.මේ වන විට විනාශයට පත්ව යමින් තිබෙන ජාතික උරුමයන් වන සියළු පුරාවස්තූන් රැකගැනීම හා නඩත්තුව සඳහා අයවැයෙන් සැලකිය යුතු මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම. එම පුරාවස්තූන් රැකගෙන අනාගත පරපුරට උරුම කිරීම සඳහා විධිමත් ජාතික වැඩපිළිවෙලක් සැකසීම.

4.පුරාවස්තු, දගැබ්, බුදු පිළිම විනාශ කරමින් ඒවායේ ඇති නිධන් වස්තූන් කොල්ල කන්නන් අත්අඩංගුවට ගෙන දඬුවම් දීම සඳහා වෙනම ''පුරාවස්තු සුරක්‍ෂණ බලකායක්'' නිර්මාණය කිරීම හා පුරාවස්තු මංකොල්ලකන්නන්ට දැඩි දඬුවම් ලබාදිය හැකි පරිදි නීති රීති ඇති කිරීම.

5.ලංකාව තුළ ඇති ඉපැරණී කතෝලික දේවස්ථාන හා සිද්ධස්ථාන හෝ ඒවායේ ඇති ඓතිහාසික වටිනාකමක් ඇති භාණ්ඩ සංරක්‍ෂණයට හා නඩත්තුව සඳහා ක්‍රමවේදයක් සැකසීම හා දැනට කතෝලික සභාවට විශේෂිත පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන කතෝලික සභාවට පැවරීම.

6. මහ සිකුරාද කතෝලික ජනතාවගේ උතුම්ම දිනයක් බැවින් එදින වෙළඳ නිවාඩු දිනයක් බවට ප්‍රකාශයට පත් කිරීම.

7. දිවයිනේ සියළුම රජයට පවරා ඇති කතෝලික පාසල් සඳහා විදුහල්පතිවරුන් පත් කිරීමේ දී කතෝලික පියවරු සහ කතෝලික විදුහල්පතිවරුන් පත් කිරීමට කටයුතු කිරීම.

8. අමාත්‍යාංශයේ අධීක්‍ෂණය යටතේ විධිමත් නඩත්තුව සඳහා සංරක්‍ෂණ කිරීමේ වගකීම කතෝලික සභාවට පැවරීම.

9. මෙරට දහම් පාසල් වලට දහම් පාසල් ගුරුවරුන්ට හා සිසුනට රජයේ ලබා දෙන වරප්‍රසාද හා වෙන්කරන ප්‍රතිපාදන කතෝලික දහම් පාසැල් සඳහා ද වෙනසකින් තොරව ලබාදීම.

10. සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් සිදුකෙරෙන ජන සංයුතින් වෙනස් කෙරෙන ක්‍රියාමාර්ග වඩා සැලකිල්ලෙන්හා පවත්නා තත්ත්වයන් වෙනස් නොවන ආකාරයට සිදුකිරීම.

## ආර්ථිකය

1.පරගැති ආර්ථික ක්‍රමයක් වෙනුවට දේශීය ව්‍යාපාර හා දේශීය ව්‍යාපරිකයා නංවන ''ස්වදේශීය ආර්ථික ප්‍රතිපත්තියක්'' ඇතිකරමින් ස්වදේශීය ව්‍යාපාරවලට හා ව්‍යාපාරිකයින්ට බදු සහන ලබාදීම.

2.මෙරට ආනයනය කරනු ලබන මෙරටේ නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හා අමුද්‍රව්‍ය සඳහා බදු අය කිරීම ඉහළ දමා එම භාණ්ඩ නිෂ්පාදනය කරන මෙරට නිෂ්පාදකයින්හට එම බදු මුදල් මගින් සහන හා ආධාර සැපයීමෙන් මෙරට නිෂ්පාදකයා නගාසිටුවීම.

3. කෘෂිකාර්මාන්තය දියුණු කිරීම සඳහා පොහොර ඇතුළු අනෙකුත් කෘෂි කාර්මික උපකරණ සහන මිලට ලබා දීමට කටයුතු කරමින් ගොවියා නගා සිටුවීමේ ජාතික වැඩ පිළිවෙලක් ඇති කිරීම.

4. ජලය හිඟ ප්‍රදේශවල වාරි කර්මාන්තය හා වැව් ඉදි කිරීමට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශයේ ජල පහසුකම් ඇති කර ගොවිතැන හා ජන ජීවිතය නගා සිටුවීමට ක්‍රමවේදයක් සැකසීම.

5. රටේ ගොවිතැන කෘතිම පොහොර හා කෘතිම රසායනවලින් බෙරා ගනිමින් මෙරටට ආනයනය කරන විෂ සහිත, ප්‍රමිතයකින් තොර කෘමිනාශක, වල්නාශක හා පොහොර වර්ග සඳහා පූර්ණ තහනමක් පැනවීම.

<u>මේ යටතේ;</u>

i. කාබනික පොහොර හා පාරම්පරික ගොවිතැන් ක්‍රම වඩා ප්‍රචලිත කරමින් පාරිසර හිතකාමි හා සෞඛ්‍ය ආරක්‍ෂිත ගොවැතනක් සඳහා රටපුරා දැවැන්ත වැඩ සටහනක් ඇරඹීම.

ii. වකුගඩු රෝගීන්ගේ ගැටළු සම්බන්ධව ප්‍රමුඛත්වය දෙමින් වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර සඳහා අරමුදලක් පිහිටුවීම හා වකුගඩු රෝග ඇති වීම වලක්වන ජාතික වැඩපිළිවෙලක් වහා ඇති කිරීම.

6. සෞඛ්‍ය ආරක්‍ෂිත නොවන හා ප්‍රතිමතියකින් තොර කෘතිම ආහාර ඇතුළු රටට අහිතකර ආහාරපාන ආනයනය තහනම් කරමින් ආනයනික ආහාරවල ප්‍රමිතය සම්බන්ධව දැඩි ලෙස පරීක්‍ෂාකර අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදයක් සැකසීම.

7. නාස්තිකාර මුදල් ආයෝජන ව්‍යාපෘති නවතා රටපුරා දේශීය ආදයම් නැංවිය හැකි අන්දමේ කර්මාන්ත ඇති කරමින් රැ කියා අවස්ථා සහ විදේශ විනිමය වැඩි කරගැනීමේ ආර්ථික ක්‍රමවේදයක් සැකසීම.

8. ඖෂධ පණත ක්‍රියාත්මක කරමින් බාලවර්ගයේ හා ප්‍රමිතයකින් තොර ඖෂධ වර්ග ගෙන්වීම වැලැක්වීම හා රජයේ රෝහල් වල අතරමැදියන් මඟින් සිදුවන ඖෂධ ජාවාරම නැවැත්වීමට දැඩි ක්‍රමවේදයක් ගැනීම.

9.රජයේ රෝහල්වල ප්‍රතිකාර ලබන රෝගීන්ට අධික වියදමක් දරා පෞද්ගලිකව වෛද්‍ය පරීක්‍ෂණ හා වාර්තා ලබා ගැනීමට සිදුවීම නවතා රජයේ රෝහල් තුළින්ම සියළු පරීක්‍ෂණ කරදෙන අන්දමේ පහසුකම් සැකසීම හා ක්‍රමවේදයක් ඇති කිරීම.

10. සේවක අර්ථසාදක අරමුදල සම්බන්ධව විනිවිදභාවයක් ඇතිකර සේවක අර්ථසාධක අරමුදල ආයෝජනය සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම. සේවක අර්ථසාදක අරමුදල් ගෙවීම් පැහැර ඇති සියළු සේවායෝජකයින් සම්බන්ධව පරීක්‍ෂණයක් කර සේවකයින් හට සාධාරණය ඉටු කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

11. කැසිනෝ, සමාජශාලා, දුරාචාරය ප්‍රමුඛ කරගත් සංචාරක ව්‍යාපාරය ඉලක්ක කරගනිමින් ආර්ථික සංවර්ධනයක් සිදු නොකර ඒ වෙනුවට 2500ක පෞඪ ඉතිහාසයාකට උරුම කම් කියන අපේ රටේ පුරාවස්තු, නටඹුන් ආගමික සිද්ධාස්ථාන, ආසියාවේ ඉතා අලංකාර ස්වභාවික පරිසයකින් හෙබි ලංකාවේ සොබා ආසිරිය අපටම අනන්‍යය වූ ලාංකේය සංස්කෘතිය මුල් කර ගනිමින් සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීමේ විධිමත් හා සදාචාරත්මක ක්‍රමවේදයක් ඇති කිරීම.

<u>මේ යටතේ:</u>

i. ලංකාවේ බෞද්ධ සිද්ධස්ථාන, ආගමික උත්සව, ඉපැරනි නටඹුන්, සංස්කෘතික උත්සව නැරඹීම සඳහා මෙරටට පැමිණීමට උනන්දුවන අන්දමේ දැවැන්ත ප්‍රචාරණ ව්‍යාපාරයක් විදේශීය රටවල් තුළ ක්‍රියාත්මක කිරීම.

ii. මෙරට ස්වභාවික පරිසය, පූජනිය ස්ථාන, නැරඹීමට හා චිත්‍රපට රූපගත කිරීම් වැනි දේ සඳහා මෙරටට පැමිණීමට සංචාරකියන් උන්නදු කරවන ප්‍රචාරක ක්‍රමයක් ඇති කිරීම.

iii. කතෝලික සිද්ධස්ථාන නැරඹීම සඳහා විදේශීය කතෝලික බැතිමතුන් යොමු වන ආකාරයේ ප්‍රචාරණ ක්‍රමයක් කතෝලික රටවල සිදුකර ඒ තුළින් සංචාරකයින් ගෙන්වා ගැනීම.

iv. හින්දු දේවාල හා පූජා ස්ථාන නැරඹීම සඳහා ඉන්දියා වැනි රටවලින් බැතිමතුන් ගෙන්වා ගනිමින් සංචාරක කටයුතුකිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම.

දේශයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් එදා පටන් මෙරට කතෝලිකයින් ඇප කැප වූ අතර ඒ තත්වයන් සැළකිල්ලට ගනිමින් කාලීන අවශ්‍යතාවයන් සපුරාගෙන ගොඩනැගෙන ලාංකීය සමාජයක් සඳහා මෙම ව්‍යවස්ථා සංශෝධන යෝජනාවලිය සකස් කරන ලදි

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55



# රජෙක් උපන්නා!

**ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරී 04 ඉරිදා**

## ශුද්ධවූ පවුලක්



බැස යන හිරුගෙන් විහිදෙන ලා කහ පැහැ ආලෝකය ගස් මුදුන් පොල් කරටි නහවමින් පහලට හැලෙන්නා සේය. එහෙත් රුක් වදුලු අතර මඟදී එය බොඳ වී යන්නේ පොළොව මත වැඩෙන දම් පැහැ මුසු අඳුරට ඒකරාශී වෙමිනි.

ඈත ඕවිටිවල කොරවක්කන්ගේ කරච්චලයත්, ගොඩබිමේ බඩවැටි අතර දෙමලිච්චන්ගේ කිචි බිචියත් අතරට ඉඳ හිට මුසුවන්නේ අව්ච්චියන්ගේ ආගන්තුක හඬයි.

තුරුලතා අතු ඉති තලමින් හඹා යන උතුරු කං සුළං රැළි අතරට තෙල් පැණි බැදෙනා සුවඳක් ද මුසු වී පාවී යයි.

අලුතින් කොන්ක්‍රිට් බදාම වැටුන පැරැණි කරත්ත පාරේ කෙළවරට වන්නට ඇති මහ වත්ත වටකොට තිබෙන්නේ ද බඹ දෙකකටත් වඩා උසට බැඳි කොන්ක්‍රිට් තාප්පයකි.එහි එක් පසෙක ඊට පිටතින් සේම තාප්පයටම සමයාන්තරව සැහෙන දුරක් ඇදී යන අඩි අටක් පමණ පළල පාර කෙළවර වන තැන කුඩා ඉඩමේ ඇත්තේ වහලය පල දෙකට සැදු කුඩා නිවසකි.

එම කුඩා නිවසේ පිටුපස දෙසින් සුළඟට මුසුවන සුදු පැහැ දුම් රොටුවක්, වා තලයේ මද දුරක් පාවී තුනිවී ගියත් ඒ හා මුසුවන තෙල් පැණි සුවඳ පාටක් රුවක් නැතිමුත් බොහෝ දුර පාවී යන්නේ ය. ඒ පවතින්නේ මිනිස් ජීවිතයේ ගුණ සුවඳ මිස පුහු ආටෝපය නොවේ යැයි කියාපාන්නාක් මෙනි.

මේ සුවඳ එන්නේ කුඩා මඩුවක් තුළ තාවකාලිකව සැදු ලිපක් මත උතුරනා තෙල් තාච්චියකිනි. තරුණ කාන්තාවක් හා යුවතියක් ඒ අසළය. තරුණ කත ගෙහිමි කතය. යුවතිය අසල්වාසිය. කාන්තාව අත කැවුම් හැන්ද හා ඉරටුවක් ඇත. අසළ ඇස් වට්ටියක් පුරා රන්වන් උණු කැවුම් ය. කුඩා ලදැරියක් නිවස තුළින් දිව විත් ඒ දෙස විපරම් කරයි. "මගේ දුව යන්න මල්ලි ළඟට මං දුවට කැවුම් දෙනවනේ" මවගේ වදනට අවනත දියණිය මල් සිනාවක් පා යළි නිවස තුළ නොපෙනී යයි.

නිවසින් පිට පරිසරය සුවඳ කරන තෙල් පැණි සුවඳට නිවස තුළදී තීන්ත හා ටිනර් සුවඳක් හා මුසු වී මැකී යයි.

දැනට රැකියාවට ගොස් ඇති ගෙහිමියා ගෙවුනු රාත්‍රිය පහන් වනතුරුම නිවසේ දොර ජනේල් වල ආලේප කළ තීන්ත වල නැවුම් සුවඳයි ඒ.

පැරැණි පොල් අතු ගෙයි වහල අලුත්වැඩියා කර සිමෙන්ති තහඩු සවිකර බිත්ති වලට අලුත් දොර ජනෙල් ද සවි කර තවම වසර දෙකකට වඩා නැත. මුල් වරට තීන්ත ආලේප වූයේ මෙවරය. බිත්තියේ කපරාරුවට ගෑ සුද තවත් එසේය. චිමිනි ලාම්පුවෙන් රෑ එළිය වූ මෙම නිවසට විදුලිය ලැබී තවමත් වසරක් පමණය. එහෙත් මිදුලේ සිටිනා අයට ද පැහැදිලිව පෙනෙනා සේ ගේ තුළ හරි මැදින් ඉහළ බිත්තියේ සවිකර ඇති සුරුවම් කුඩුව අසල දැල්වෙන පොල් තෙල් පහන නම් කවදත් පොල් තෙල් පහනමය.

දිවා රෑ එළිය දෙන එම පොල් තෙල් පහනින් ඔවුන් නිරතුරු දකින්නේ ශුද්ධවූ පවුලයි. එම දැවැන්ත පින්තූරය ඔවුනට පරම්පරාවෙන් උරුම වූ වස්තුවකි. ඒ අනුව මේ නිවැසියන් ගේ ආලෝකය හා ආරක්ෂාව මෙතැන යයි ඔවුන්ගේ මතයයි. ඒ අනුව මෙම පවුලේ - සතුටේ දී, සැපේදී, දුකේ දි පමණක් නොව අසල්වැසියකුගේ දුකක් කරදරයක දී ද මෙම පවුලේ වැඩිහිටි දෙදෙනා පමණක් නොව යමක් තේරෙන කුඩා දියණිය ද දිව එන්නේ මෙහි ආරක්ෂාව පතාය.

ඇඩි වැසි අකුනු පවතින අවස්ථාවලදී සියළු ආලෝක නිවා දමා මෙතැනට ගුලිවන ඔවුන් තමන් වෙනුවෙන් පමණක් නොව අසල්වාසින් වෙනුවෙන් ද යදී.

දේශපාලන පෙරළි වල දී පිරිසක් ජයපැන් බොද්දී පිරිසක් රැකවරණ සොයද්දී මේ පවුලේ අය සැම වෙනුවෙන් මෙතැනට එක්වේ. ලබන වසරේ නව පාසල් ගමන යන තම දියණිය වෙනුවෙන් ඔවුන් ලොකු ඉස්කෝල සොයා ගියේ නැත. මුදල් වැය කළේ නැත. දරුවාගේ අනාගතය ශුද්ධවූ පවුලට භාර දී දරුවාගේ අධ්‍යාපනය ගමේ පාසලට භාර දුන්නේ ය.

ජේසුගේ පියා "ජෝශප්" වෙද්දී මේ පවුලේ පියා "සීමන්ය" ජේසුගේ මව "මරියා" වෙද්දී මේ පවුලේ මව "සිසිලියා"ය. මේ දැන් කියූ දියණිය "රුවනි"ය, කුඩා පුතු "යොහාන්"ය.

අඳුරත් සමඟ රැකියාව ඇරී නිවසට දිව ආ සීමන් රැගෙන ආ කළමනා ඉස්තෝප්පුවේ තබා ඇඳ සිටි උඩ ඇඳුම් ගලවා රෙදි වැලට දැමුවේ පසුදා බිරිය සෝදන නිසයි.

යට ඇඳුමට උඩින් පරණ තුවායක් ඔතාගත් ඔහු පිටුපස මඩුවේ තම කාරිය නිමාකර අස්පස් කරන බිරිඳගෙන් අඟුරු පොල් කට්ටක් හා වියළි පොල් මුඩු කීපයක් රැගෙන පල්ලම් බැස්සේ වල දමා ඇති කෙසෙල් කැනට දුම් පිඹීමට බව බිරිය දනී.

ලිඳ අසළ කැවිලි සැදු භාජන සෝදන හඬ හා මුසුව ගැහැනු දෙදෙනාගේ සතුටු සිනා හඬ සීමන්ට ඇසේ.

"ජේසු ඉපදී මේ මනුලෝකේ ... අමුතු තරු දිලිසේ" ඒ සීමන්ගේ හඬයි නත්තල් කාලයට ඔහු තම ප්‍රීතිය ප්‍රකාශ කරන්නේ මෙවැනි පැරැණි ගී පද උච්ච හඬින් ගයා බව බිරිය දනී.

"සීමන් අයියේ තව කියන්නකෝ..." යුවතිය කෑ ගසයි. "බෑ බෑ.. ඒව නත්තලට නේද?" බිරිය කියයි. "කෝ දෙවි කුමරා කෝ දෙවි කුමරා ඉපදී ඇත මෙ දෙසෑ...."

ඔහු තම කාරිය නිමා කර තවත් ගීයක් ගයමින් නිවසට ඇතුළු වන්නේ... තම කුඩා පුතු නිදා සිටින කාමරයට එබිකම් පාමිනි. ඔහු ඒ එන්නේ ද පිටුපස මඩුවේ වහල මත පොතු ගලවා වේලෙන්නට දමා තිබී දැනට සුදු පැහැයෙන් වියළි ඇති වල්ලා ගහක අත්තක් ද රැගෙන ය. ඒ මේ නිවසේ නත්තල් ගසයි. ක්‍රේප් පටි සහ බැලුන් බෝල සෙල්ලම් බඩු එල්ලූ විට පාරම්පරික නත්තල් ගහ සිරියාවන්තය. විසිහතර වනදා සීමන්ට රැකියාවට ගොස් බැරිය. ඒ තරමට ගෙදර වැඩය. නත්තල් ගහ නිමා කරන්නට, වත්තේ ගවලෙන හදන්නට, බුලත් දුම්කොළ ගේන්නට, කැවිලි පෙවිලි එකලස් කරන්නට, සියල්ලටම වඩා බිරිය හා දරු දෙදෙනා රාත්‍රි නත්තල් පූජාවට සූදානම් කරන්නට දවසත් මදිය.

එසේම එදින නිවසට එන කිසිම කෙනෙකුට වෙනදා මෙන් තේ කෝප්පයෙන් සලකන්නේ නැත. කැවුම්, කෙසෙල් මේසය මත සූදානම්ය. තමන් අතින් සැකසූ දේ ලෝබකමක් නැතිව දෙනවා කියාය ඒ. නත්තල් ලැබූ පසුත් අසල්වාසින්ට එසේම කැවිලි බෙදයි. පළමු කොටම කැවිලි බඳුන රැගෙන යන්නේ අල්ලපු වත්තේ විල්බට් ගුරුන්නාන්සේගේ බාල පුතාගේ නිවසටයි. එය එදා සිට ඔහුගේ කැමැත්තයි.

විල්බට් ගුරුතුමා අගනුවර විදුහලක විදුහල්පතිවරයෙකි. මුල් කාලයේ ගමේ පල්ලියේ ඉස්කෝලයේ උගන්වන කාලයේ සීමන්ලා ඔහුගේ ශිෂ්‍යයෝ ය. ඒ ගුරු ගෞරවය අදටත් ඔහු තුළ ඇත. ගමේ දේවස්ථානයේ "හර්මෝනියම්" වාදකයා වූයේ ද මෙම ගුරු මහතායි. ඔහුට ගමේ ඉඩම් තිබූ අතර ඔහු තවත් ඉඩම් මිලදී ගෙන දරුවන් වෙනුවෙන් ලියා දුන්නේ ය. සීමන්ලාගේ නිවස අසළ වූ එම ගුරුතුමාගේ එක් ඉඩමක් ලොකු කරගත්තේ සීමන්ලාගේ ඉඩම් කොටසක් ද මිලට ගෙනය. ඒ අනුවය පාර තෙක් තිබූ සීමන්ලාගේ මහ ඉඩම අද පාරේ සිට අඩි පාරක් තරමට තමන්ගේ නිවස දක්වා පටු වූයේ, අධ්‍යාපනයේ ඉහළට ගිය දරුවෝ දේපල විකුණා දමා ගම් රටවල් හැර ගියහ. බාල පුතා "ග්‍රෙගරි" පමණක් අසළ නිවසේ රැඳුනි. ඔහු ඉංජිනේරුවෙකි. බිරිය නීතිඥවරියකි. ගුරුතුමාගේ බිරිඳ මිය ගිය පසු ගුරුතුමා මෙම නිවසේ හුදෙකලා විය. ඔහු මිය ගිය විට පිටරට සිටි දරුවෝ ආහ. එපමණකි. අද මළවුන්ගේ දිනයටවත් ඔහුගේ වල අසළ සිටින්නේ බාල පුතු පමණි. මිනීවල සුද්ද කරන්නේ කුලිකාරයෝ ය. වෙනදා නත්තලට නිවෙසේ දැල්වෙන පැට්‍රෝල් මැක්ස් ලාම්පුව වෙනුවට අද විදුලි බුබුලු දැල් වී ඇත. ඒ කාලයේ ඇති හැකි අය දැල් වූයේ ඇලඩින් ලාම්පුය.

කෙසේ විදුලිය තිබුණත් ගවලෙනේ ලන්තෑරුමත්, ශුද්ධවූ පවුලේ පොල්තෙල් පහනත් නොවෙනස් ය.

සවස් කාලයේ නිවසට ආ ගිය අසල්වාසිනට තේ සමඟ සූදානම් කළ කැවිලි පිඟන් තවමත් මේසය මතය. වෙනදා පැණි රසට ලොල් දියණියට අද ඒවාට ප්‍රියක් නැති සේය. ඊට වඩා ඇයගේ සිතත් නත්තල් ප්‍රීතියෙන් උද්දාම වී විය යුතුය. සැමට ඇත්තේ රාත්‍රි නත්තල් පූජාවට යෑමේ කලබලයයි.

සැමදා නිහැඬියාවේ ගිලී තිබෙන ගුරුතුමාගේ පුත් ග්‍රෙගරිගේ තෙමහල් නිවස දෝංකාරය දෙමින් ඉංග්‍රීසි ගීතයක් වාදනය වනු ඇසිනි.

"ජිංගල් බෙල් .. ජිංගල් බෙල්.."

"අන්න අරහේ..."

සීමන්ගේ බිරිය තිගැස්සී එයට සවන්දේ...

බෙත්ලෙහෙම් - නිදනා වෙලාවක ...

සීත මැදියම් අඳුරු යාමෙක.....

ආ.... ආ....

ගොපල්ලන් නිදි වරණ මොහොතේ .... ඒ....ඒ

දිසී.... දසුනක් අරුම විලසේ......ඒ...

අරුමයක් නැත.. නොමැත නිදි උන්......න්...න්...

අමුතු තරුවක් අහසේ... බබළන්නේ...."

මෙතෙක් වේලා කුඩා දරුවාගේ ඇඳුම් තෝරමින් සිටි සීමන් කාරිය පසෙකලා අංගික, සාත්වික හා වාචික අභිනයන් කදිමට පාමින් උච්ච ස්වරයෙන් නාඩගම් ශෛලියේ පද වැලක් ගායනා කළේ කුඩා නිවස පුරා දෝංකාරය නංවමිනි.

"මගේ දුවේ ... මගේ මහප්පප ඒ කාලේ හොඳ ටීටර් කාරයෙක්. නාඩගං කාරයෙක්. නාඩගං... ටීටර්... වාසප්පු මේ ගමේ පෙන්නුවද... උන්දෑ එතැන මුල් තැන... අද ඒව නෑ දුවේ..." ඒ කාලේ මාව පොතේ ගුරාට අන්දල උගන්නපු එකක් තමා ඒ... හතර අතින් නත්තල් හඬ ගිගුම් දෙද්දී ඇඟ කිලි පොලා යන සීතල උණුසුම මරා දමද්දී වෙනදා පාලු පාර දෙවනත් කරමින් යතුරු පැදි ත්‍රීරෝද රථ, කාර්, වෑන් ඇදෙනු පෙනුණි. නිවසේ දොරගුලු ලද සීමන් සිය බිරිය හා කුරුසේ ලකුණ සනිටුහන් කරමින් දරු දෙදෙනා තුරුළු කර ගත්තේ පා ගමනින් නත්තල් රෑ දේව මෙහෙයට යෑමටයි.

"දුව නැගිටින්න නැගිටින්න... අද නත්තල් නේ..."

"ආ... තාත්ත පල්ලියෙන් ඇවිත් නිදා ගත්තේ නැද්ද..."

"නෑ... මගේ පුතේ...අම්මටයි මට යි වැඩ තියනවනේ කිරිබත් හැදුව"

මොහොතකින් - අලුත් සරමකින් හා මේස් බැනියමකින් සැරසුන සීමන් සමනලියක මෙන් සරසාගත් සිය කුඩා දියණියද කැටිව සුදු රෙද්දකින් වැසූ බන්දේසියක් ද අතැතිව අසල තෙමහල් නිවසේ ගේට්ටුව අසළ සිටිනු පෙනුණි.

කිසිදා දරුවකුගේ හඬක් නැසුන නිරතුරු දඩ බල්ලන්ගේ ගෝරනාඩුව ඇසෙන මෙම නිවසේ ගේට්ටු පලුවක් අඩවන්ව ඇරී තිබුණත් ඇතුල් වීමට දැරිය බියක් දැක්වුවාය.

"අනේ තාත්තේ මට බයයි...."

ඒ හඬ ඇසී දෝ නිවසේ වැඩකරන කාන්තාව දිව විත් දොර විවෘත කළාය.

හා එන්න එන්න....

"සුභ නත්තලක්..."

"මෙරි ක්‍රිස්මස්..."

ගැහැනු හා පිරිමි හඬ මුසු වෙමින් භාෂා දෙකකින්ම මිශ්‍රව සුභ පතනු ඇසුනි.

නිවසේ නවතා තිබූ කළු පැහැ මෝටර් රථය අසල එකම හැඩයේ සුදු කොට කලිසම් හා බැනියම් හැඳ සුදු පාවහන්ලා ගත් දෙදෙනෙක් සිටිනු පෙනුනි. ඇඳුම එකම වුවත් ඒ ගැහැනියක හා පිරිමියකු බව වැටහුනි.

"අපට නත්තල් ගෙනල්ල දුවත් එක්ක.. ඊයේ රෑ පල්ලි ගියාද දුව. අපට නං යන්න බැරි උනා... මගේ යාළු ෆැමිලි එකක් ආව ඉතින් රෑ කෑමක් නොදී බැහැනේ.... කෑම පිටින් ඕඩර් කළා... ටිකක් විනෝද වුණා..."

"ඉතින් පල්ලි ගියෙ නැහැ.. අනික මේ දවස්වල ගෙවල් වහල යන්නත් බයයිනේ හරියට හොරු ඉන්නවනේ ... නේද?"

"ඒකනං එහෙම තමයි නෝනා.. දැන් උදේ පූජාව තියෙනවනේ.."

"ඔව්.. උදේ පල්ලි යන්න තමයි හිතාගෙන ඉන්නේ.. ඉතින් උදේම නැගිටල දෙන්නම ජොකිං පාක් එකට ගියා ටිකක් ඇවිදින්න.. අපි දෙන්නටම ෂුගර් තියෙනව ටිකක් ... ව්‍යායාම ඕනෑ"

"හොඳයි නෝනා... නෝනලට පරක්කුත් වෙනවනේ..."

සීමන් තමන් ගෙනා කැවිලි බඳුන... කාන්තාව අත තබද්දී ඇය නැවතත් ..." මෙරි ක්‍රිස්මස්" යයි කීවාය. ඒ සමඟ අසල නිහඬව සිටි ඇගේ සැමියා "ඔයාලට සුභ නත්තලක්" යැයි කියන්ඩ කුඩා දියණිය හා සීමන් එකවරම "එසේම වේවා"යි කීය.

"එහෙනං අපි එන්නං..."

" හා.. හා.. එහෙම බෑ... මේ නත්තල් දවසේ අපෙන් කේක් කෑල්ලක් කාල එහෙම යන්න ඕනේ..."

පිරිමියා පවසද්දී... නිවස තුළට දිව ගිය කාන්තාව අලංකාර බෝනික්කෙක් ගෙනැවිත් ... සීමන්ගේ දියණිය අත තැබුවාය. "මෙහෙන් නත්තල් තෑග්ගක්... ඔක ඕස්ට්‍රේලියාවෙන් හම්බ වුනේ.."

"ස්තූතියි"

දියණියත් පියාත් දැවැන්ත ආසනයක වාඩි කළ නිවැසි යුවළ නිවස තුළට ගිය පසු ආලින්දයේ නේක වර්ණයෙන් දිදුලන දැවැන්ත ප්ලාස්ටික් නත්තල් ගස දෙස දියණිය බලා සිටියාය. එහි ඇති විදුලි වැල් දිය දහරා ගලා යන්නා සේය...

"තාත්තේ... අර ලයිට් වතුර ගලනව වගේ"

"එහෙම පෙනුනට ඒ ගිනියම් වෙච්ච විදුලිය.. ඒක සීතල නෑ" සීමන් පැවසුවේ මිනිසුන්ගේ කෘතිම ජීවිතත් ඒ අයුරු නොවේදැයි සිතමිනි.

කේක් බන්දේසියක් රැගෙන ආ වැඩකරන කාන්තාව එය අසළ කනප්පුව මත තබා අයිස් කැට පාවෙන.. පෙන උතුරන වර්ණවත් බීම වීදුරු දෙකක් ද රැගෙන ආවාය.

ගෙහිමියා හා බිරිය... වෙනත් ඇඳුම් ලාගෙන යළි පැමිනුනි.

"දුව, කන්න.. සීමන් අයිය ගන්න..."

ගැහැනිය පිරිමියාගේ මුහුණ බැලුවාය. නැවත සීමන් දෙස හැරිණ.

"අද නත්තල්නේ... රෑට මෙයාගේ යාළුවො දෙන්නෙක් එනව කෑමට ඒ අය හොඳ විනෝදෙට කැමති අය.. ෆන් එකක් ගන්න එන්නේ.. සීමන් අයියත් පුලුවන්නං එන්න.. හැමදාම නැහැනේ... පරණ සිංදුවක් එහෙම කියල... පියානෝව තියෙනව... ඕගන් ඔක්කොම තියෙනව. අපි රැකෝඩ් කරපු...."

"ගෙදර අයටත් ප්‍රශ්නයක් නෑ... පවුලටයි ළමයින්ටයි කෑම අපි යවන්නම්.... හරිනේ...."

"ඔව් සීමන් අයියෙ.. ඔයා කොහොම හරි එන්න ඕනේ..."

සීමන්ට උඩ බිම බැලිනි. අතට ගත් බීම වීදුරුව ආපසු තැබිනි.

"අනේ මහත්තයො අද නත්තල්නේ..."

"ඔව් සීමන් අයියෙ නත්තල් නිසානේ... අපිත්..."

"මහත්තයො තරහ ගන්ඩ එපා මගෙ අම්මා තාත්තා මැරුණට පස්සෙ මගේ නෝනගේ දෙමාපියෝ තවම ඉන්නවනේ. ඉතින් මේ වගේ හොඳ දවසක තනියම විනෝද වෙනවට වඩා ඒ අයත් එක්ක නත්තල බෙදා හදාගෙන භුක්ති විඳීම තමයි නත්තල." මට සමාවෙන්න ග්‍රෙගරි මහත්තය.. මට සමාවෙන්න නෝන... ඔබල දෙන්නටම සුභ නත්තලක් අපි යන්නං..."

"හා.. නෑ... ඔහොම වාඩිවෙන්න සීමන් අයිය.. වාඩිවෙන්න දුව.. දුවගේ තාත්තා... මේ නත්තල් දවසේ හොඳ දෙයක් අපට ඉගැන්නුව මගේ තාත්ත ගුරුවරයෙක් ඒත් එයා... මේ වගේ දෙයක් අපට උගන්නල නෑ...

අපේ තාත්ත පල්ලියෙ කංතාරු කණ්ඩායම පාලනය කෙරුව.. රට පුරා ලොකු ඉස්කෝලවල ඉගැන්නුව.. එයා අපේ පවුලේ අයට හොඳට ඉගැන්නුව ඉහළ තැන් වලට යන්න. දේපල ඉඩකඩම් එකතු කෙරුව. අපට මතක තියෙන කාලෙක අපව එකතු කරං ... ආච්චිල සීයල බලන්න නත්තල් දවසෙ ගිහිල්ල නෑ. ..

අන්තිමට මගේ සහෝදරයො සහෝදරියෝ තාත්තා එකතු කරපු දේපල විකුණා දාල රට රටවල ගියා. තාත්ත ඉන්න කාලේ සුභ පැතුවේ කාඩ් වලින්.. ඉතුරු උනේ මම විතරයි.. අපි දෙන්නටත්.. රාජකාරි වැඩි උනා... ආගම් අදහන්නත් කාලයක් නැතිව ගියා... දරුවෙක් බලන්න වාසනාව නැතිව ගියා...

තාත්තා අන්තිම කාලේ හිටියෙ හරි දුකකින් තනිකමකින්... ඒ තනිකම එයාගේ මරණෙ ලං කෙරුව. අම්මටත් උනේ ඒකයි. අපටත් එහෙම වෙයිද සීමන් අයියෙ... එහෙම තනි වෙච්ච නිසයි අපිත් පිට මිනිස්සුත් එක්ක විනෝද වෙන්නේ...

සීමන් අයිය... යන්න... වැඩිහිටියො බලන්න. මේ දරුවො කවදාවත් ... ඔයාව තනිකරන එකක් නෑ.. සීමන් අයිය. එහෙමෙ නේද දුව... ජේසුත් ගවලෙනෙයි ඉපදුනේ.. සතුටුවෙන්න සීමන් අයිය.. ඔයාගේ පවුල ..."ශුද්ධවූ පවුලක්..." අද දවල්ට අපි සීමන් අයියලගෙ ගෙදර යමු ද ග්‍රෙගරි."...

"මමත් මේ හිතුව"

"බොහොම සංතෝෂයි නෝන මහත්තය... අපි බලා ඉන්නවා"

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**
රාගම

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

ඥානාර්ථ ප්‍රදීපය





# රජෙක් උපන්දා!

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා

# සුබ නත්තලක්!

හේනෙ ඉඳල ගම්මානෙට හූ තුනක් වගේ දුරක් තිබුනත් වැවේ රක්ෂිතයට අලි මාරුවෙන කපොල්ල ඒ මැද්දේ ඇති නිසා රෑ බෝවෙන්න කලින් හේනට යනඑන එක ගම්මුන්ගේ සිරිත යි.

උදේ පාන්දර හේනෙ ඉඳල තාත්තා ඇවිත් වතුර මුට්ටියක් අරන් පොහොරිගේ මඩුව දිහැවට ගියේ කිරි දොවන්න යි.

මල්ලියි මමයි සම්බෝලයි බතුයි කන්න හරිම රුසියෝ. ලහි ලහියේ ටිකක් වැඩියෙන් කන්නේ දවල්ට බඩ පිරෙන්න බත්කෑම අපිට නුපුරුදු නිසයි.

"මටත් බත් ටිකක් බෙදුවනම් සුනංගු නොවී ආපසු හේනට යන්න. මෙලහකටත් වඳුරො රෑන ඇවිල්ල බඩ ඉරිඟු ටික කාබාසිනිය කරල ද දන්නෙ නෑ" කියමින් තාත්තා කිරි බොතල් දෙක එළිපත්ත මත තබා බත් කමින් සිටි අප දෙදෙනා ළගින් වාඩි විය.

'අම්මේ මෙන්න මල්ලිට ඉස්කෝලෙ යන්න බැහැ කියනවා.'

'ඒව හරියන්නෙ නෑ' යයි කියමින් අම්මා තාත්තා අත බත්පත තැබීය.'

'මල්ලි ඉක්මනට ලෑස්තිවෙන්න මෙන්න ඔයාගෙ පොත් බෑග් එක.'

බත්පත ඉක්මනින් ගිලදමා කහට කෝප්පය උගුරට දෙකට බී අප දෙදෙනාගේ හිස පිරිමැද තාත්තා ලහි ලහියේ හේනට පිටත් විය.

'දුවේ කිරි බෝතල් දෙක හංදියෙ කඬේට දීල මල්ලිවත් ඉස්සර කරගෙන ඉක්මනට යන්න' කියා අම්මා කියනවත් සමගම....

'අම්මේ මට ගල්කූරක් ඕන' ඒ මල්ලිගේ දිනපතා ඉල්ලීම යි.

'අක්ක පුතාට මුදලාලිගෙන් ගල්කූරක් ඉල්ලලා දෙයි,' දැන් ඉතින් ඉක්මනට යන්න මාත් පොහොරිව දක්කගෙන හේනට යන්න එපායැ.'

හැමදාම ඉස්කෝලෙ ගිහිල්ල ආවට පස්සෙ අපි හේනට දුවනවා. සමහර දවස් වලට මල්ලි ඉස්සරවෙලා දුවල ගිහිල්ල කරද හෝ එරමිනියා පුංචි සරොම් ගෙට්ටට දාගෙන මහ හපන්කමක් කෙරුව වගේ මටත් පංගුවක් දෙනවා. කොච්චර හපනා උනත් අලි මාරුවෙන වංගුවේ දී අක්කෙ අපි දුවමු කියල හැමදාම යෝජනා කරන්නේ මල්ලිම යි.

අපි හේනට ළංවෙන බව ඉවෙන් මෙන් දැනී සැරයක් දෙකක් උම්බෑ කියල හැමදාම අම්මට පණිවිඩේ දෙන්නෙ පොහොරියි.

'දුවේ තම්බපු මංඤොක්කා තියනවා. මල්ලිටත් බෙදල දීල කන්නකෝ.....'

'අම්මල කෑවද?'

'ඔව් අපි කෑව. ඔන්න තාත්ත දුවටයි පුතාටයි පැණි කොමඩු ගෙඩියකුත් කඩල තියනවා.

හේනෙ පැළට වෙලා අම්මගෙ යි තාත්තගෙයි වැඩ ඉවර වෙනකම් අපි දෙන්නා එහෙට මෙහෙට දුව දුව සෙල්ලම් කරනවා. අපි තියෙන දෙයක් බෙදාගෙන කාල සමහර දවස් වලට සමනල්ලු අල්ලලා පස්සෙ අතහරිනවා. සමනල්ලු ඉන්නකොට ගස්වැල්වල ගෙඩි හටගන්නවා කියල ටීචර් කියල දුන්න නිසා ඒ සෙල්ලම පස්සෙ නැවැත්තුවා.

ඉර ගස් මුදුන් වලට මුවාවෙන වෙලාවට පොහොරි වත් දක්කගෙන ගෙදර එන ගමන් වැවේ නාන තොටින් නාගෙන ගෙදර එනවා. සමහර දවස්වලට තාත්තා රාත්‍රි කෑමෙන් පසුව ආපසු හේනට යන්නෙ දඬුවැඩට කඩාගෙන ඌරෝ හේනට වදියි කියන බියෙන්. හඳ තියන රාත්‍රියට අම්මා මිදුලේ පොල් අතු වියන දවස් වලට මමත් ළඟින් ඉඳගෙන ඉරටු කඩල දීල අම්මට උදව් වෙනවා. එදත් ඒ වගේ දවසක් අහස පුරාම තරු පායල, මිදුලේ බෝලිද්ද ගහේ කොළ පෙනෙන්නෙ නැති තරමට මල් පිපිලා.'

'අම්මේ' අද ඉඳලා හරියටම දවස් විස්සයි නත්තලට තියෙන්නේ, මෙදා සැරේනම් රෑ පූජාවට අපි යන්නම ඕන.'

අම්මා නිහඬයි.

'අපි රෑ පූජාවට යනව නේද අම්මේ.'

'මම තාත්තගෙන් අහල බලන්නන්කෝ' කියමින් අම්මා තවත් පොල් අත්තක් වියා නිමකර ආපස්සට ඇමීය.

මම තාත්තගෙනුත් අහලා බලන්නම් කො කියා අම්මා පැවසුවේ ඉතාමත් සැහැල්ලුවෙනි. පසුව දා ඉස්කෝලේ නිවාඩු දුන්න නිසාවෙන් වෙනදාට වඩා ඉක්මනින් මල්ලිත් මමත් ගෙදර ඇවිත් හේනට දිව්වෙමු. ඒ වන විටත් අම්මාත් තාත්තාත් වෙහෙස නිවාගන්න පැලට ඇවිත් කහට බොමිනුයි සිටියේ.

'දුවේ උඹල දෙන්නත් අම්මට ඉරිඟු ටික කඩාගන්න උදව් වෙයල්ලා. ඉක්මනින් ඇටකර ගත්තොත් නත්තලට උඹලට අඳින්ට මොනව හරි ගන්න පුළුවන් වෙයි.'

මගේ ඉල්ලීම අම්මයි තාත්තයි සාකච්ඡා කරල තියනව වගේ හැඟීමක් මට ඇති විය. එය ස්ථිර කරගන්නට සිතූ මම ඒ අවස්ථාවට ඔබින ප්‍රශ්නය ඇසුවෙමි.

'තාත්තෙ' 'අපි රෑ පූජාවට නේද යන්නේ.'

'අම්මත් එහෙම කිව්වා' යයි තාත්තා තේ උගුරක් බී සීනි ටිකක් කටේ දමා ගනිමින් පැවසීය.

වෙනදා හේනෙදි සෙල්ලම් කරන අපි එදා මුළු දවසම අම්මාට ඉරිඟු කඩන්නට උදව් උනෙමු. ඉරිඟු ගොඩ උසට උසේ දුටුවිට අම්මගෙ යි තාත්තගෙයි මහන්සිය ඊටත් වඩා උසයයි මට සිතුනි. සතුට කොච්චරද කියනව නම් පල්ලියෙ ගවලෙන, කැරොල් ගායනා, මල්වෙඩි එකින් එක මගේ සිතට ඇතුල්වන්නට විය. සති දෙකකට පසුව කළු මාමගේ අත් ට්‍රැක්ටරයෙන් ඉරිඟු ඇට මිටි පටවාගෙන විකුණන්න ගිය ගමනට අපි හතරදෙනාම එක්වුනෙමු.

එදා රාත්‍රියේ තාත්තා හේනට නොගොස් ගෙදර නතර වූයේ මහන්සිය නිසාය. ගමටම තියන ආගමේ පවුල අප නිසා අවට උදවිය අපේ ගෙදර ඇවිත් කිරිබත් කා තේ බීම සැම නත්තලක දී ම සිදුවන්නකි. එනිසා දොදොල් හැඳිගෑම නත්තලට දින කීපයකට පෙර ඉතා ඕනෑකමින් අම්මා සිදුකරයි.

'තව දවස් දෙක තුනයිනෙ නත්තලට තියෙන්නේ..... අපේ මේ පොඩි උන්ට පින්න කෝටු ටිකක් හෙට උදේම්මෙ කපල දෙන්න ගවලෙන හදන්න. මට දවස් දෙක තුනක ඉඳන් බේරිල්ලක් නෑ' යයි පවසමින් අම්මා කුප්පි ලාම්පු එළියෙන් උදළු මිටක් ගාමින් සිටි තාත්තාගෙන් අප වෙනුවෙන් තවත් ඉල්ලීමක් ඉල්ලීය.

නත්තල් දාට පෙරදින අපි දෙදෙනාගේ එකම රාජකාරිය වූයේ ගවලෙන සෑදීමය.

'අක්කෙ අපි වහලෙට මොනවද දාන්නෙ.'

'අපි පිදුරු දාමු.'

'ඒක හොඳයි අපේ ගෙදර වහලෙටත් දාල තියෙන්නෙ පිදුරුනේ.'

තාත්තා වේලාසනින් හැරිසන් ලාම්පුවේ චිමිනිය පිරිසිදුකර තැබුවේ පූජාවට යන්න කලින් පත්තුකර තබා යාම පිණිස ය. කිලෝ මීටර් හයක් පයින්ම දේවස්ථානයට යාමට තිබුනත් ඒකත් මොන දුරක්දැයි මට නොසිතුනේ සිතේ තිබුනාවූ සතුට නිසාය. රෑ 10 ට පමණ තාත්තා හැරිසන් ලාම්පුව පත්තුකර වහලේ එල්ලා....

'අපි යමු නේදැ යි' කාටත් ඇසෙන ලෙස පවසන විට මමත් මල්ලීත් මිදුළට බැස හමාරය.

ටෝච් එක දල්වාගෙන ඉදිරියෙන් ගිය තාත්තා පසුපස අඩිපාර දිගේ අපි සෙමින් පා නැගුවෙමු' සතුට වැඩි නිසාදෝ මාත් මල්ලිත් වචනයක්වත් නොකියා ගමන් කළෙමු. දේවස්ථාන භූමියේ ගස්වල එල්ලෙමින් තිබූ පාට පාට එළිය දකින විට අනේ මේවයින් එකක් අපේ ගවලෙනට තියනව නම් කොච්චර හොඳදැයි මට සිතුනි.

නත්තල් පූජාවෙන් පසුව හැමදෙනාම පියතුමාට නත්තල් කියන්න දේවස්ථානයේ මහා දොරටුව අසල සංතෝසෙන් පොර කනවා. අපි පසකට වී ඒ දෙස බලා සිටියෙමු. කට්ටිය අඩුවූ සැනින් අප ද ගොස් පියතුමාට සුබ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කළෙමු.

'ආ...... අද මුළු පවුලම පල්ලි ඇවිල්ලා, ඒක කොච්චර හොඳද. ඒක නෙමේ පීටර් මෙදා වගා කටයුතු එහෙම සාර්ථක දැ'යි පියතුමා ඇසීය.

'දේව වරප්‍රසාදයෙන් වරදක් නැහැ පියාණනි' යනු තාත්තගේ පිළිතුර විය.

'වන සතුන්ගෙන් එහෙම කරදර තිබුන ද?'

'සුළු සුළු කරදර තිබුනා පියාණනි, නමුත් අපි උන්ටත් එක්කනෙ වගා කරන්නේ.'

'හුම් ඒක ඉතාමත් යහපත් පිළිතුරක් පීටර්.'

'එහෙමයි පියාණනි අපි සත්තුන්ට ආදරේ කරන විට සත්තුන්ගෙන් අපිට අනතුරක් වෙන්නේ නෑ.'

අපි පියතුමාගෙන් සමුගෙන ආපසු ගමන ආරම්භ කළෙමු. මහපාරෙන් දෙවටට හැරී දෙවටින් දිය කඳුර පසුකර අඩිපාරට වැටි ටික දුරක් එනවිටම...

'අනේ මල්ලියේ උඹලගේ ගේත් ඉවරයි' කියමින් කඳුරේ ගෙදර නැන්දා අප ඉදිරියට දුවගෙන ආවෙ උන්දෑ අපට තිබුනු ලෙන්ගතුකම නිසාය.

'ඇයි මොකද උනේ තේරෙන භාෂාවෙන් කියපල්ලකෝ' කියමින් තාත්තා මදක් නොසන්සුන් විය.

'මෙ..... මේ... මේකයි වෙලා තියෙන්නේ... එහා ගොඩේ කොල්ලෝ කෑකෝගහල පොඩි සතා ගම පැත්තට හැරිල මහදෙන්නත් ඒ පස්සෙන් දුවගෙන ඇවිල්ල වී සුවඳටද කොහෙදෝ ගෙවල් ඇතුලට හොඬේ දාල ගෙවල් තුන හතරක් බිම. ඉස්පිරිතාලෙටත් තුන්හතර දෙනෙක්ව අරන් ගියා' කියමින් කඳුරේ ගෙදර නැන්දා සිදුවී තිබූ ඇබැද්දිය කියාගෙන කියාගෙන ගියේය.

මට එකපාරටම පොහොරි මතක්විය. 'අම්මේ අපේ පොහොරි කියමින් මම අම්මව බදා ගත්තමේ.'

'මල්ලි ද අම්..... මේ අපේ ගවලෙන කියමින්' හයියෙන් අඩන්නට විය.

'කවුරුත් කලබල වෙන්න එපා' කියමින් තාත්තා ඉස්සර විය. අපි ගෙරදට කිට්ටුවන විට කළු මාමයි නැන්දයි අහල පහල කීප දෙනෙකුයි අපි එනතුරු ගේ ළගට වී බලාගෙන සිටියෝය.

'පීටර් අයියල ඇවිත් අපේ ගෙදර ඉන්න. එළිය වැටුනම කරන්න පුළුවන් දෙයක් ගැන බලමු.' ඒ කළු මමා ය.

එළිය වැටෙන්න තියෙන්නෙ තව හෝරා දෙකතුනයිනෙ. එතකම් මොනවහරි කරන්න බලමු යි කියා තාත්තා සුන්බුන් ප්‍රවේශමින් අවුස්සා පැදුරු දෙක තුනක් හා ගෝනි කෑලි කීපයක් ගෙන පොහොරිගේ මඩුවට ගොස් රාත්‍රිය ගතකරන්නට තාවකාලික නවාතැනක් සැකසිය. මම සෙමින් පොහොරි ළඟට ගියෙමි.

'පොහොරියේ ඔයාටයි පුතාටයි කරදරයක් නෑ නේද? අපි නත්තලට ඔයාලගෙ ගෙදර ආවා.'

මල්ලිත් සෙමින් සෙමින් එතනට පැමිණ පොහොරිගේ පැටියා අතගාමින්, 'පැටියෝ අපේ ගවලෙනට මොකුත්වෙලා නෑ හොඳට තියෙනවා.'

ගම්මුන් ද එළිය වැටුනට පසුව ආපසු එන පොරොන්දුවෙන් ගිය පසු අපි ගව මඩුවේ තැනු අළුත් නිවහනට ගියෙමු.

'හ්ම්..... ඔයිං ගියා මදැයි, අපි බේරුනේ දේව වරප්‍රසාදයකින්, රෑ පූජාවට නොගියා නම් අපි අහවර යි.'

'මෙදා සැරේ තමා දුවේ අපි නියම ගවලෙන සැදුවේ' කියමින් අම්මා පැවසූ දේ තාත්තා අනුමත කරමින් හ්ම් කියා පැදුරේ දිගාවිය.

එළිය වැටුනට පසුව ගමේ උදවිය අපේ ගෙදර පැමිණියෝය. ඒ කිරිබත් දොදොල් කා තේ බීමට නොව. අලි කැඩූ අපේ පැල්කොටේ සාදා දීමටය. ඒ සැම දෙනාටම තාත්තා 'සුබ නත්තලක් වේවා' යි පැතුම් පැතීය.

**ගරු ඉග්නේෂස් සේනානායක පියතුමා**
ශුද්ධවූ පවුලේ දේවස්ථානය
බිබිල

# නත්තල හා කිතුනු ක්‍රියාකාරකම් සම්බන්ධව විවේචනාත්මක චිත්‍රපටයක් ශ්‍රී ලංකාවෙන්

ක්‍රිස්තු චරිතය සම්බන්ධයෙන් ආන්දෝලනාත්මක චිත්‍රපටයක් ශ්‍රී ලංකාවෙන් බිහිවී තිබේ. 'ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා !' ( Praised be Jesus Christ ) නමින් මෙම කෙටි චිත්‍රපටය නම් කර තිබේ. ලංකාවේ මෙතෙක් ක්‍රිස්තු උපත හා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත කතාව අළලා කරන ලද චිත්‍රපට අතරින් වෙනස්ම තේමාවක් හා ආකෘතියක් ගත් චිත්‍රපටයක් වන මෙයට පාදක වන්නේ ක්‍රිස්තුන් වහන්සේ නැවත වර්තමානයේ ලංකාවේ කතෝලික පුරවරය ලෙස හඳුන්වන මීගමුවේ උපත ලැබීමත් ඉන් අනතුරුව වර්තමාන සමාජ, දේශපාලනික හා ආගමික පසුබිම යටතේ උන්වහන්සේට මුහුණ දීමට සිදුවන ඛේදවාචකයත්ය. ලංකාවේ දේශපාලනයත්, කතෝලිකයින් ගේම ඇතැම් ක්‍රියාකාරකමුත් මෙම චිත්‍රපටයේ දැඩි ලෙස විවේචනය කර තිබේ.

'බෙත්ලෙහෙමෙන් නැගලා මීගමුවෙන් බැහැලා ගිය සුපර්ස්ටාර්ගේ කතාව' නමින් නම් කර ඇති මෙම කෙටි චිත්‍රපටය සම්මානනීය යොවුන් කෙටි චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු වන තිළිණ අලහකෝන්ගේ අධ්‍යක්ෂණයකි. මෙය ඔහුගේ හතරවන කෙටි චිත්‍රපටයද වේ. මෙයට පෙර ඔහු 'පාට පාට හීන (Colour Dreams 2004), 'ඇයත් ගැබ්බරයි' ( She is Also Pregnent 2008), 'සිගරට් කොටය' (Cigaret Butt 2008) නමින් කෙටි චිත්‍රපට තුනක් අධ්‍යක්ෂණය කර දේශීය විදේශීය උලෙළින් රැසක් නියෝජනය කර දේශීය හා විදේශීය සම්මාන රැසක්ද හිමිකරගෙන සිටී.

'ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා !' කෙටි චිත්‍රපටය කැළණිය සරසවියේ ක්‍රිස්තියානි සංස්කෘතික අංශය මගින් සංවිධානය කරනු ලබන කිතු උපත තේමා කර ගත් සිනමා උළෙලට ඉදිරිපත් කිරීමටද නියමිතය. සම්මානනීය මාධ්‍යවේදියෙකුද වන තිළිණ අලහකෝන් මේ වන විට කතෝලික නිල පුවත්පත වන 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පතේ නිෂ්පාදන විධායක ලෙස සේවය කරනු ලබයි.

උදේනි අල්විස්, දේශක අලහකෝන්, නිදූ ගුරුසිංහ, ලහිරු පෙරේරා, නිශ්මං රණසිංහ, චමින්ද රත්නායක, අශේන් එස්. සේනාරත්න, ෆ්‍රැන්සිස්කා අලහකෝන්, ප්‍රියන්ත මෙන්ඩිස්, ගයාල් බුද්ධිදස, ප්‍රේම් ජයන්ත් කපුගේ, හයිලන්ස් ෆොන්සේකා මෙම චිත්‍රපටයේ රංගනයෙන් දයකවේ. කැමරාකරණය, ආලෝකකරණය හා සංස්කරණය සංජීව දුල්හාන් සිල්වාගෙන් වන අතර මෙහි නිශ්පාදනය චාන්දනී අලහකෝන් ගෙනි.





Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

# "ශුද්ධ වූ සභාව සීමා බන්ධනවලින් තොර වූ පොදු මවකි"

## සංක්‍රමණික දිනය

**ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා**

## 2015 වසරේ ජාත්‍යන්තර සංක්‍රමණික සහ සරණාගතයින්ගේ දිනය වෙනුවෙන් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් විසින් නිකුත් කරන ලද පණිවිඩය

**හිතවත් සොයුරු සොයුරියනි,**

අන්ත දුගී භාවය සහ වහල්සේවාවන්හි නියැලී සිටිනා'තර සූරාකන්නන්ගේ නවතම ගොදුර බවට පත්ව පීඩා විඳින්නන් තුළින් උන්වහන්සේගේ වේදනාත්මක මුහුණ හඳුනාගන්නැයි පවසන අප ස්වාමින් වහන්සේ අද දැඩි අනතුරුදායක තත්ත්වයන්ට මුහුණ දෙමින් ජන සමාජයෙන් කොන් කරන ලද බෙලහීන කොටස් වෙත කාරුණික අවධානය යොමු කරන්නැයි ඉල්ලමින් අප කැඳවන සේක. "මම සාගිනිව සිටියෙමි, ඔබ මට කන්ට දුන්නහුය. මම පිපාසව සිටියෙමි, ඔබ මට බොන්ට දුන්නහු ය. ආගන්තුකව සිටියෙමි, ඔබ මා ගෙදරට පිළිගත්තහුය. වස්ත්‍ර නැතිව සිටියෙමි, ඔබ මට වස්ත්‍ර දුන්නහුය. රෝගාතුරව සිටියෙමි, ඔබ මා බලාගත්තහුය. හිර ගෙදර සිටියෙමි, ඔබ මා බලන්නට ආවහුයැ'යි වදාරණ සේක." (මතෙව් 25:35-36)

ධර්මදූත සේවාවන්හි නියැලෙන සුදූ සබය අද ලෝකය තුළ සැරිසරන එක්තරා වන්දනාකරුවකු වන්නාසේම හැමගේම පොදූ මාතාවන්ද වන්නීය. ඕ ජේසුස් වහන්සේට ප්‍රේම කරයි. වන්දනා කරයි. සමාජයෙන් බැහැර කරන ලද දුගී දුප්පතුන් වැළඳගනියි. මේ අය අතර නිසැකවම ජීවිත ගමනේ නොයෙකුත් දුෂ්කරතා තුළින් පැන යාමට තැත් කරන ශ්‍රමික සංක්‍රමණිකයන් මෙන්ම සරණාගතවුවෝද වෙති. මේ හේතුන් නිසා මෙම වසරේ ලෝක සංක්‍රමණික සහ සරණාගතයින්ගේ දිනය සඳහා තෝරා ගෙන ඇති තේමාව වනුයේ "ශුද්ධ වූ සභාව සීමා බන්ධන වලින් තොර පොදු මවකි, යන්නය.

"දෙවියන් වහන්සේ ප්‍රේමය වන සේක" යන දේව වචනය ලොවට ප්‍රකාශ කිරීමේ අරමුණ ඇතිව සභා මාතාව කිසිදු භේදයකින් හෝ සීමාවකින් තොරව සියලු ජනතාව විවෘත දෑතින් වැළඳගන්නීය. ස්වාමින්වහන්සේ තම මරණින් සහ උත්ථානයෙන් පසු තමන්වහන්සේටම සාක්ෂි දරමින් ප්‍රීතියේ සහ දයාවේ සුබාරංචිය පතුරුවාලීමේ මහඟු කාර්යය තම ශ්‍රාවකයින් වෙත භාර දෙන ලදි. ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කළ දින දී එදා ශ්‍රාවකයන් ඉහළ මහළ තුළින් පිටත් වුයේ ශුද්ධාත්ම ආනුභාවයෙන් සපිරුණු ශක්තිය, ධෛර්යය සමඟ බැඳුණු උද්යෝග යකිනි. තමන් තුළ එතෙක් පැවති සැක සංකා අනුමාන හැම දෙයක්ම ජය ගෙන එම පිරිස පිටතට ගොස් ජනතාව අමතද්දි තම භාෂාවලින් ඔවුන් එකිනෙකා කතා කරන අයුරු තේරුම් ගැනීමට ජනතාවට හැකි විය.

ආරම්භයේ සිටම සභාව කිසිදූ බාධා හෝ සීමා බැඳීම් නොමැතිව මුළු ලොවම තම වතට තුරුළු කර ගත් සෙනෙහසේ මාතාවක වූවා ය. මෙම ධර්මදානීය ක්‍රියාදාමය වසර 2000ක් තුළ අඛණ්ඩව පවතියි. මුල් ශතවර්ෂවලදී පවා ධර්ම දූතික ප්‍රකාශන මඟින් පවසන ලද්දේ සභාව හැමදා විශ්වාසනීය දයාබර මාතාවක බවයි. සභා පියවරුන්ගේ ලිපි ලේඛනවලින් පවා සනාථ කරන ලද එම ප්‍රතිපත්තිමය පිළිවෙත පසුව දෙවන වතිකාන කතිකාව තුළද සාකච්ඡාවට ලක් වුයේ ය. සභාවේ මෙම සුහද ලෙන්ගතු ස්වභාවය "ECCLESIA MATER" යන එම චක්‍රලේඛය සභා පියවරුන් විසින් අනුමත කරන ලදි. තවද සභා මාතාව තම දූ පුතුන් ප්‍රේමයෙන් දැල්වෙන උණුසුම් භාවයකින් දෝතින් වැළඳ ගන්නී ය. (Lumen Gentium 14)

සීමා බන්ධනවලින් තොර පොදු මවක්ය යන මෙම තේමාව නිසා මුළු ලොව පුරා එකිනෙකා පිළිගැනීමේ සහ සාමුහික බවේ සංස්කෘතික රටාවක් ගොඩනැගීමේ හැකියාව සභාවට ලැබෙන්නේය. මෙම සංකල්පය තුළ නොවැදගත් හෝ බැහැර කළ යුතු හෝ කිසිවකුත් නැත. හැමදෙනාම පිළිගත් මෙම මාතෘත්වය සාර්ථකව ක්‍රියාවට නැඟීමේදී ක්‍රිස්තියානි සංඝ පෝෂණය වෙමින් වර්ධනය වන්නාහ. තවද ඔවුන්ට අවැසි මාර්ගෝපදේශකත්වය නිතැනින්ම ලැබෙනු ඇත. එහි අවසාන ප්‍රතිඵලය වනුයේ හැමදෙනාම තමන් වෙත ළඟා කර ගැනීමේ උපරිම අවස්ථාව උදාවීමයි.

යටකී ක්‍රියාදාමය තුළින් මතුවන එක්තරා සිද්ධාන්තයක්ද ඇත. වත්මන්හි ශ්‍රමික සංක්‍රමණය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී තිබෙන අයුරු අපි දකිමු. තම බලාපොරොත්තු අපේක්ෂා සමඟ මුසුවූ බිය සැක වැනි දෑ ද අසුරා ගත් ගමන් මල්ලක් ද රැගෙන තම මව්බිමටද ආයුබෝවන් කියා මිනිස් ආචාර ධර්ම සුරකින යහපත් සමාජයක් තුළ ගෙවෙන වාසනාවත් ජීවිතයක සිහින දකිමින් අනතුරුදායක ගමනක යෙදෙන බොහෝ දෙනෙකු අද අපට හමුවේ. කිසිදූ පූර්ව දැනුමක් හෝ අත්දැකීමක් නොමැතිව ඈත එපිට රටක් බලා යන පූජක, පැවිදි අයවලුන්ට පවා නොයෙකුත් අන්දමේ පීඩන, බාධා, තර්ජන ඇතැම්විට ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදුවීම අරුමයක් නොවේ. එවැනි කටුක අවස්ථාවල දී විවිධ පුද්ගලික අවශ්‍යතාවලින් පෙළෙමින් පිහිට ඉල්ලා ඔබ වෙතට එන අමුත්තා පිළිගන්නැ'යි යන සුබාරංචි නියෝගය අවිශ්වාසය, සැකය, අනවබෝධය නිසා කඩවීමට ඉඩ ඇත.

තවත් කෝණයකින් බලන විට අද මනුෂ්‍යයින් අත්විඳින දුක් පීඩා වරින් වර අපේ හෘදය සාක්ෂියටද තට්ටු කරයි. එවිට අපට ද දැනෙන්නේ ජේසු සමිඳුන් අපටද දානය කළ අපට කියා පහදා දුන් ප්‍රේමයේ, දයාවේ පනත ක්‍රියාත්මක කළ යුතු බවකි. ඔවුන්වහන්සේ අමුත්තකු, ආගන්තුකයකු, දුක් පීඩාවලට භාජනය වූවකු, හිංසාකාරී ක්‍රියාවලට සහ සූරා කෑමට ගොදුරු වූ නිර්දෝෂී අහිංසකයින් හඳුනාගත් සේක. එහෙත් අපේ මිනිස් දුබලතා නිසා අපි, අප ස්වාමින් වහන්සේ අත්විඳි එම වේදනාකාරී තුවාල පසෙක ලා ක්‍රියාකිරීමේ පරීක්ෂාවට යටත් වී සිටිනු දක්නට ඇත. (Evangeliie Gaudium 270) ප්‍රේමයේ, විශ්වාසයේ සහ බලාපොරොත්තුව තුළින් බිහිවන ධෛර්යය මිනිස් දුක්ඛ දෝමනස්සයන්ගෙන් අප වෙන් කරනු ලබන පරතරය අඩු කිරීමට සමත් වේ. මෙම සංක්‍රමණිකයන්, සරණාගතයන් හා අවතැන්වූවන්ගේ විලාපයට සංවේදිවෙමින් ඔවුන් හඳුනා ගැනීමට මග බලා සිටින ජේසුස් වහන්සේ, අප සතු ධනය හා සම්පත් ඔවුන් සමඟ බෙදා ගැනීම සඳහා අප කැඳවන සේක. මේ කරුණු සම්බන්ධව VI වැනි පාවුළු ශුද්ධෝතම පාප්වහන්සේ පැවසු වචන පහත සඳහන් කරමි.

"වඩාත් වාසනාවන්ත ජීවිත ගත කරන අය එවන් වාසනාවක් නොලද අන් අයගේ යහපත හා සුවසෙත සලකා ත්‍යාගිශීලිව තමන් සතු අයිතිවාසිකම් සමහරක් අතහැර දැමිය යුතු වේ." (Octogesima Advenieres)

නූතන සමාජ ව්‍යුහය තුළ පවත්නා බහු සංස්කෘතික ආකල්පවලට අනුකූලව සංහිඳියාව සහ ධර්මදානීය කටයුතු සඳහා සභා මාතාව නව ආරක සාමුහික කැපවීම් කරා යෑමට දිරිගන්වනු ලැබේ. ජනතාව සහ සංස්කෘතීන් අතර සහජීවනය සහතික කිරීම සඳහා අවශ්‍ය වටිනාකම් වඩාත් තිව්‍ර කිරීම වෙනුවෙන් සංක්‍රමණික ව්‍යාපාර ද කැඳවා තිබේ. එකිනෙකාට වෙනස් වූ පරස්පර විරෝධි වාතාවරණ සහ සංස්කෘතීන් යටතේ බෙදීයන විෂමතා කෙරෙහි නාම මාත්‍රිකව ගරු සැලකිලිමත් වීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. මෙහිදී අප අත්දකින අනාරක්ෂිත භාවය සහ බිය, කෙණෙහිලිකම් සහ කොන්කිරීම් වලින් ඇති වන නොයෙකුත් බාධක ජය ගැනීම සඳහා සභාවට දිය හැකි දායකත්වය කෙරෙහිද අවධානය යොමු කර සිටිමි. මෙහිදී සාධාරණ, යුක්තිසහගත සහ සහෝදරත්වය හඳුනන ලොවක් ගොඩනැගීමේ හැකියාව උදාකර ගත හැක්කේ සියලු බාධක අක්‍රමිකතාවයන් මැඩපැවැත්වීම සඳහා සැදී පැහැදී සිටින සවිමත් සංස්කෘතික පදනමක් මත බවද අවධාරණය කරමි. (Message of the world day of Migrants and Refugees 2014)

අද සංක්‍රමණික ක්‍රියාදාමය කෙතරම් දුරට ව්‍යාප්ත වී තිබේදැයි සිතාබලද්දී එම ව්‍යාපාර සාර්ථකව හා ක්‍රමවත්ව පාලනය කිරීම හා කළමනාකරණය සඳහා රාජතාන්ත්‍රික ක්‍රියාකාරී මැදිහත්වීම් සහ සහභාගිත්වයක අවැසියාව අපි දකිමු. තවද සංක්‍රමණික ක්ෂේත්‍රය මේ අන්දමින් පුළුල් වීම හැමෝටම බලපාන සංසිද්ධියක් බවට පත්වී ඇති අතර සමාජික, ආර්ථික, දේශපාලනමය, සංස්කෘතික සහ ආගමික ගැටලු සහ අභියෝග රාශියක් ජාතික සහ අන්තර් ජාතික මට්ටමින් විසඳා ගැනීමට සිදුවී තිබෙන අයුරු දකිමු. (Caritas et Ueritate 62).

සංක්‍රමණික ක්‍රියාවලිය සාර්ථකව යහමග ගමන් කිරීම අරමුණු කොට ගත් ක්‍රමවේදයන් සහ නීති පද්ධතීන් පිළිබඳව දැනටමත් අන්තර් ජාතික මට්ටමින් සංවාද නිරතුරුවම පැවැත්වෙයි. වඩාත් සාර්ථක ඵලදායි ජීවිත අපේක්ෂා කරන සංක්‍රමණිකයන්ගේ අභිවෘද්ධිය තකා එම කාර්යයෙහි නිරතව සිටින දේශීය ඒජන්තවරුන්ට අමතරව අන්තර් ජාතික වශයෙන්ද ක්‍රියාකරන සංවිධාන කීපයක්ද ඇති බව රහසක් නොවේ. මෙම සංවිධාන මඟින් කෙරෙන පරිත්‍යාගිශීලි මහඟු සේවාවන් අගය කරන අතර සෑම මිනිසකුගෙ 'ම ගෞරවාන්විත මිනිසියාව සුරැකීමට පාත්‍ර වූ සාමුහික විශ්වීය වැඩ පිළිවෙලක් දියත් කිරීමේ අවැසිතාවයද අවධාරණය කරමි.

මේ අන්දමේ පොදු ක්‍රියාදාමයක් තුළින් නිර්ලජ්ජිත ලෙස ඉතා තුච්ඡ අන්දමින් සිදුකරනු ලබන සාහසික මිනිස් වෙළෙඳාම් මූලික මිනිස් අයිතිවාසිකම්, පැහැර ගැනීම්, හිංසාව, වහල් වෙළඳාම, සුරා කෑම හා මර්දනය වැනි අධම ක්‍රියාවන්ට එරෙහිව නැගිසිටීමට හැකි වනු ඇත. මේ සම්බන්ධව ක්‍රියා කිරීමේදී එක්සත්කම, අන්‍යෝන්‍ය අවබෝධය, සහයෝගය, විවෘතභාවය හා විශ්වාසයද අත්‍යවශ්‍යය.

සියලුම මහද්වීපවලට බලපාන අන්දමින් උග්‍ර අතට හැරී ඇති ද්විප්‍රකාර ආගමන සහ විගමන ක්‍රියාවලිය තුළින් පැන නඟින ගැටලු කිසිම රටකට තනිවම විසඳාගත නොහැකි බවද කිවයුතුව තිබෙයි. (Message of the world Day of Migrants and Refugees 2014)

සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට ඊට වඩාත් යහපත් මානුෂික මුහුණුවරක් ලබාදීම සඳහා දයාව හා සහයෝගිතාවය ගෝලීය වශයෙන් ගලා ඒම අත්‍යවශ්‍යයි. සංක්‍රමණික ගෝලීයකරණයට යහපත් ප්‍රතිචාර දැක්විය හැක්කේ එමඟිනි. තවද තමන්ගේ නිජබිම අතහැර වෙනත් රටවලට සංක්‍රමණය වීමට හේතු සාධක අවම කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. එවැනි විරසක ඇති නොවීම සඳහා සහතික කරමින් එම පරිශ්‍රමයන් සාක්ෂාත් කෙරෙන දැඩි පියවර ගැනීමේ වැදගත්කමද අවධාරණය කරමි.

සංක්‍රමණික සහ සරණාගතයිනගේ උන්නතිය උදෙසා සාමුහිකව ක්‍රියාත්මක වනවිට ලෝක මට්ටමින් ඒ සඳහා ධෛර්යවත්ව පෙරට යා යුතු වෙයි. තවද සධාරණ මුල්‍යමය ආර්ථික පිළිවෙතක් පිළිපැදිය යුතුය. නිත්‍යානුකූලව සියලුම ප්‍රගතීන්වල සාර්ථකත්වය සඳහා අනිවර්යයෙන්ම තිබිය යුතු කොන්දේසිය විය යුත්තේ සාමය වෙනුවෙන් කැපවීමයි.

ආදරණීය සංක්‍රමණිකයනි, සරණාගතයනී!

සභා මාතාවගේ හදවත තුළ ඔබ සඳහා විශේෂ ඉඩක් වෙන්ව ඇති බව සඳහන් කරමි. මුළු මහත් මිනිස් පවුල වෙනුවෙන් උණුවන විශාල හදවතක් ඇය සතුව ඇති බව පෙන්වීමට ඇයට උපකාරී වන්න. කිසි දිනෙක ඔබේ විශ්වාසය සහ බලාපොරොත්තුව නැති කර නොගන්න. එදා ඊජිප්තුවට පලා ගිය ශුද්ධ වු පවුල මුහුණ දුන් ඛේදවාචකය සිහිපත් කරන්න. සර්වදයාබර දෙවිඳාණෝ කිසිවිටෙක තමන් අත්නාරින බවට භාග්‍යවන්ත කන්‍යා මරිය වහන්සේ සහ ජුසේ මුනිඳුන් තුළ පැවති ඒ අචල විශ්වාසය ඔබද ඔබේ ස්වාමින් වහන්සේ කෙරෙහි පවත්වා ගන්න.

ඔවුන්වහන්සේගේ සදා ආරක්ෂාවට ඔබ සැම බාර දෙමින් මාගේ අපෝස්තලික ආශිර්වාදය දානය කරමි.

2014 සැප්තැම්බර් 3 වැනි දින වතිකානයේදී ය.

**ප්‍රැන්සිස් සුදුතුම් පියා**
**සිංහල පරිවර්තනය**
**මොරිස් බොල්ලෑගල**

## 2014 අන්තර් ජාතික සංක්‍රමණික දිනය වෙනුවෙන් අති උතුම් හැරල්ඩ් ඇන්තනී රදගුරු හිමිපාණන්ගේ පණිවුඩය

මෙම වසරේ පවත්වනු ලබන ලෝක සංක්‍රමණික සහ සරණාගතයින්ගේ දින තේමාව වනුයේ, ශුද්ධ වූ සභාව සීමා බන්ධන වලින් තොර වූ පොදු මවකි, යන්නයි. මෙම මාතෘත්වය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදී ඉවසීම, යාච්ඤා සහ දයාවේ ක්‍රියා මගින් ක්‍රිස්තියානි සංඝය පෝෂණය කරනු ලබන්නේ ය. මෙහෙයවනු ලබන්නේ ය. ඒ අතර සුදුතුම් පියා විසින් අවධාරණය කරන්නේ සංක්‍රමණික ක්‍රියාදාමය තුළින් තමන් හඳුනාගනු ලැබේ, යන බලාපොරොත්තුවෙන් ජේසුස් වහන්සේ පසුවන බවයි.

සාගිනි වු ද, පිපාසිත වු ද, ආගන්තුක වු ද, නිර්වස්ත්‍ර වු ද, රෝගාතුර වු ද, හිර අඩස්සියට පත්කරනු ලැබුවා වු ද සංක්‍රමණික ජනතාවෙනි, මාවෙතට එන්නැ' යි ස්වාමින් වහන්සේ පවසන සේක. ධර්මදානීය ක්‍රියාවන්හි නියැලෙන සභාවල මුළු මහත් ලෝකය තුළ එක්තරා වන්දනාකරුවකු හා සෙනෙහෙබර මාතාවක ද වන්නීය. ඕ හැමදෙනට දයාව පාන මාතාවක බවට පත්වෙමින් ක්‍රිස්තු සමිඳාණන්ට ප්‍රේමය දක්වයි. වන්දනාමාන කරයි. ඒ අතර අන්ත දුගීභාවයේ වේදනා උහුලන අයද කොන්කරනු ලැබූ අයද වැළඳ ගනී. තවද ජීවිතයේ නොයෙකුත් කඨෝර බාධා හිංසා වලින් ගැළවී යෑමට උත්සහ කරන සංක්‍රමණික සරණාගතයින් පිරිසක් ද ඒ අතර ඇත.

ක්‍රිස්තුන් වහන්සේ අප සැම කැඳවා ඇත්තේ, බඩ සාවුන් පෝෂණය කිරීමටය. පිපාසිතයින්ට පානය දීමටය. අවතැන් වුවන් පිළිගැනීමටය. සිරගත වුවන් බැහැදැකීමටය. කොන්කරනු ලැබූ සියලුදෙනා අසම්මත බාධක නොසලකා ගෞරවාන්විතව සැලකීමටය. ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා පවසන පරිදි සංක්‍රමණික ක්‍රියාදාමය ජීවිත අපේක්ෂා බලාපොරොත්තු සපුරා ගැනීමේ දීර්ඝ ගමනකි.

අපි හැම සංක්‍රමණිකයකු තුළ බලාපොරොත්තු ඇති කරමු. ඒ අය වෙත කාරුණික මාතාවක සේ හැසිරෙමු. ක්‍රියා කරමු. කොන්දේසි විරහිතව එවැන්නන්ට සෙනෙහසපාමු. ඒ අයගේ වුවමනාවන් සපුරාලමු. ඒ සරණාගත පිරිස අපේම දරුවන් මෙන් සලකා ක්‍රියා කළ යුතුව ඇත්තේ වචනයෙන් නොව ක්‍රියාවන් තුළින්ය.

අද අපි ජීවත්වන මෙම ලෝකය තුළ සෑම පුද්ගලයින් හත්දෙනෙකුගෙන් එක් අයකු සරණාගත ඝණයට යටත් වේ. සීග්‍රයෙන් වැඩිවන මෙම සරණාගතයින් සංඛ්‍යාව ගැන සළකා ඔවුන්ට උපරිම සහයෝගය දක්වමින් ඒ හැම දෙනාම මනුෂ්‍යත්වයේ නාමයෙන් ගෞරවාන්විතව සැලකීම අන්තර්ජාතික ප්‍රජාවගේ යුතුකමයි. සීග්‍ර ලෙස ප්‍රසාරණය වන්නාවු වර්තමාන, ගෝලීය ආර්ථික වේගය නිසා පෙර නොදුටු විරූ අන්දමින් සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාවද ඉහළ ගොස් ඇති බව පෙනී යයි. නුපුහුණු කම්කරුවන් සඳහා සංවර්ධිත රට රාජ්‍යවල පවතින ඉල්ලුම ඉහළ යන්නාසේම සංවර්ධනය වෙමින් පවතින්නාවු රටවල ඇති දරිද්‍රභාවය තූළින් මතුවු විරැකියාවේ ප්‍රතිඵලයක් වශයෙන් එම රටවල ශ්‍රමිකයන්ට රැකියා අපේක්ෂාවෙන් විදේශගත වීමට සිදු වී ඇති බවද අමතක නොකරමු.

බොහෝ අවස්ථාවලදී සංක්‍රමණිකයන් තමන් උපන් රට අතහැර දමා විදේශගත වන්නේ තම පවුල් නඩත්තු කිරීමේ චේතනාවෙනි. ඉක්බිතිව යම්කිසි මුදල් ප්‍රමාණයක් තම පවුල වෙත එවීමට හැකි වුවත්, එයින් පමණක් සෑහීමට පත්විය නොහැකිය. ඒ ඒ හා බැඳුනු තවත් සමාජමය ප්‍රශ්න කිහිපයක් ඉතිරිව ඇති නිසාය. අද වත්මන් සමාජය තුළ පවත්නා විවිධ ආරක්ෂිත සංස්ථාවන් බොහෝවිට සංක්‍රමණිකයන් නිසා හුදකලා වු පවුල් වලට සහන සැලසීම ක්‍රමවත්ව සිදු කරන්නේ නැත. මෙම සුරක්ෂිත අවශ්‍යතාවය විශේෂයෙන් බලපාන්නේ දෙමාපියකු හෝ අඹුසැමියකු නිසා තනි වු පවුල්වල දරුවන්ට බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මෙම තත්වය යටතේ කිසියම් පවුලක සාමාජිකයකු සැමියා හෝ බිරිද රැකියාවක් සඳහා විදේශගත වු විටක තමන්ට නුහුරු නුපුරුදු වගකීම් භාර ගැනීමට කවුරු හෝ කෙනෙකුට අනිවාර්යයෙන්ම සිදුවේ. මේ අයුරින් දෙමාපියන් දෙදෙනාම විදේශගත වන අවස්ථාවකදී එම පවුලේ දරුවන්ගේ වගකීම පවුලේ වැඩිහිටියන් විසින් භාර ගත යුතුව ඇත.

සරණාගත සංක්‍රමණික පවුල්වල අභිවෘද්ධිය ගැන කතා කරද්දී එකිනෙක පවුල්වල තත්ත්වය එකිනෙකට වෙනස් වේ. එබැවින් එම ව්‍යුහය තුළ පහත සදහන් කොටස් වලට අයත් වුවන් ඔබේ අවධානයට යොමු කිරීමට මා කැමතිය.

ළදරුවන්, පාසල් නොයන දරුවන්, බාල වයස්කාර ගැහැනු දරුවන්, යොවුන් වයසේ දරුවන්, පාසල් ළමුන්, වැඩිහිටියන්ට අවනත නොවන දඩබ්බර දරුවන්, මත්ද්‍රව්‍ය සහ වෙනත් අපචාරවලට ඇබ්බැහි වු පියවරුන්, වැඩිහිටි ආරක්ෂාවට භාර දුන් සාමාන්‍ය දරුවන් සහ ආර්ථික අපහසුතාවට මුහුණපාමින් සිටින පියා හෝ මවය.

මෙනයින් බලද්දි රැකියාව සඳහා විදේශගතවීම තුළින් එම පවුලේ අනෙක් අය සමාජ අනතුරකට භාජනය වීමට ඇති ඉඩකඩ සුළු කොට තැකිය නොහැකිය. මෙහි ප්‍රතිඵල භයානක විය හැකි ය. සමාජයේ බලපෑම් සහ කෙනෙහිලිකම්වලට මුහුණ දීමට සිදුවිය හැකිය. එය විශේෂයෙන් පාසල් දරුවන් කෙරෙහි බලපානු ඇත. ඇතැම්විට මෙය රහස් වහල් වෙළඳාමකට ද මගපෑදීමක් විය හැකිය. කිසියම් පවුලක සාමාජිකයකු රැකියාව සඳහා විදේශගතවන විට එම පවුලේ ඉතිරි අයගේ සුරක්ෂිත භාවය, අභිවෘද්ධිය, සදාචාරය සහ යහපැවැත්ම පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. විදේශගත වු එක් අයකු නිසා පවුලේ සෙසු අය පීඩාවට භාජනය විය යුතු නොවේ. ඉහත සඳහන් විවිධ ජනකොටස් වලට අයත් වුවන් මුහුණ පාන එදිනෙදා ප්‍රශ්න ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම අතිශයින්ම වැදගත් වේ. මෙම විපත්තිය පසුගිය වසර කිහිපයක් පුරා නොවිසඳුණු ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනු දැකිය හැකිය.

ශ්‍රමික සංක්‍රමණිකයන් තමන් පිළිගත් රටවල ආර්ථිකය නගා සිටුවීමට දායකවන්නා සේම ඒ අය විසින් එවනු ලබන මුදල් ඒ අය පාලනය කළ මුල් රටවල ආර්ථික අභිවෘද්ධිය සඳහා යොදන ආකාරය අපට දැක ගත හැකිය. ඒ අතර සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සමාජ සුරක්ෂිත භාවය පවතිනුයේ ඉතාම අවම මට්ටමකය. ඒ පමණකුදු නොව ඔහු නිතරම සූරාකෑමට සහ මිනිස් ශ්‍රම වෙළඳාමට ද ගොදුරු වන්නෝ ය. මෙහි දී පුහුණු ශ්‍රමිකයන් අයථා අන්දමින් සූරාකෑමට භාජනය වනුයේ අල්ප වශයෙනි. ඔවුන් සේවය අතහැර යාම නිසා ඇතිවන පුහුණු කම්කරු පුරප්පාඩු නිසා එම රටවල ආර්ථික සංවර්ධනයට ද ඇණහිටීම් හා තර්ජනවලටද ඔව්හු මුහුණ දී සිටිත්.

ශුද්ධෝත්තම පියතුමා පවසන අන්දමට "සංක්‍රමණික ශ්‍රමිකයන් සහ සරණාගාතයින්ගේ ප්‍රශ්න ගැන කතා කරද්දී ඒවා ගෝලීය මට්ටමින් සාකච්ඡා කළ යුතුය. සාධාරණ සහ පොදු මූල්‍ය හා ආර්ථික ක්‍රියාදාමයන්ට අනුකූල විය යුතුය. ඒ හැම දෙයකම අවසාන ප්‍රතිඵලය විය යුත්තේ, ලෝක සාමයට අවතීර්ණ වීමය. එය නිත්‍යනුකූළව පිළිගන්නා කොන්දේසියක්ද විය යුතුය. අද මිනිස් සමාජය තුළ පවත්නා බහු සංස්කෘතික පැවැත්ම නව ධර්මදානීය ක්‍රමවේදයන් අනුගමනය කිරීම සඳහා සභාව දිරි ගන්වන සුළුය. එමපමණකුදු නොව සංක්‍රමණික ශ්‍රමික ව්‍යාපාරය ජනතාව සහ විවිධ සංස්කෘතීන් අතර පවත්නා සාමකාමී සහජීවනයේ හා එකමුතුකමේ ව්‍යුහයක් ගොඩනැගීම සඳහා අප කැඳවා ඇති බවක් පෙන්නුම් කෙරේ. උද්ගතව ඇති විවිධ ප්‍රශ්ණ නිරාකරණය කර ගැනීම සඳහා හුදු බෙදීම්වලට පමණක් ගරු කිරීම ප්‍රමාණවත් නොවේ.

අද සංක්‍රමණිකයන් මුහුණ පාන නොයෙකුත් බාධක අවම කිරීම සදහා කතෝලික සභාවට දායක විය හැක්කේ මෙම තීරණාත්මක අවස්ථාවේහිදී ය. එම මැදිහත් වීම තුළින් අනාරක්ෂිතව සහ අස්ථාන බියකින් පසුවන, කෙනෙහිළිකම් හා කොන්කිරීම්වලට භාජනය වන ශ්‍රමිකයින්ට කිසියම් සහනයක් සැලසීමට සභාවට හැකිවනු ඇත. සහෝදරත්වයෙන් පිරි ලෝකයක් කරා පිය නගන මෙම විශ්ව ගමනේ දී විවිධ සංස්කෘතීන් පදනම් කොට ගෙන ඒ මත ගොඩනගන ලද එකිනෙකා මුහුණට මුහුණ ලා හමුවීමේ පොදු සංස්කෘතික ඒකග්‍රතාවයකට පිවිසීම සඳහා සභාව නිතරම සූදානමින් පසුවන බවද අවධාරණය කරමි.

**අති උතුම් හැරල්ඩ් ඇන්තනී**
කුරුණෑගල රදගුරු හිමි

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

පනස් වසරක .... 1 පිටුවෙන්

වර්ෂ 1964 ජුනි 15 වැනිදා කොළඹ කතෝලික මුද්‍රණාලයේ සේවාවට එක් වූ ඒ මහතා පුරා 50 වසරක අමිල සේවාවකින් පසු ඉකුත් දෙසැම්බරයේදී ආයතනයට සමු දුන්නේ ය.

ඉකුත් දෙසැම්බර් 20 වැනිදා කොළඹ කතෝලික මුද්‍රණාලයීය පරිශ්‍රයේදි පැවති වාර්ෂික නත්තල් සුහද හමුවේදි ඒ මහතාට සමුදීමේ අවස්ථාවද සිදුකැරිණ.

කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්‍ෂ ගරු මහේන්ද්‍ර ගුණතිලක, "ඥානාර්ථ ප්‍රදීපය" කර්තෘ ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි, "ඥානඔලි"කර්තෘ ගරු මනෝකුමාර නාගරත්නම් සහ කොළඹ කතෝලික මුද්‍රණාලයේ හිටපු අධ්‍යක්‍ෂ, වත්මන් සෙත්සරණ අධ්‍යක්‍ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමන් මේ අවස්ථාවට එක්විය.

පුරා දශක පහක් එකම පත්තර කන්තෝරුවක සේවය කිරීමේ විරල අවස්ථාව දෙවි සමිඳුන්ගෙන් ලද අමිල තිළිණයක් බැව් උත්සව සභාවේදී කියැවිණ. "පහන් ගෙදර" සේවාවෙන් සමුගත් කැමිලස් පෙරේරා මහතාට අපේ උණුසුම් සුපැතුම්!

## භාග්‍යවන්ත ජුසේ වාස් චරිතය රූපවාහිනියේ

භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන්ගේ ජීවිත අන්දරය ඇතුළත් අර්ධ වාර්තාමය රංගය 2015 ජනවාරි මස 11 ඉරුදින සවස 7.00 ජාතික රූපවාහිනියේ ජාතික වීරයන්, ධීරයන් සහ යුගකාරක පුරුෂයන් ගැන කථා කරන "මුල්" වැඩසටහන යටතේ විකාශය කෙරෙයි. තොඩුවාව, මට්ටකොටුව ප්‍රදේශ ආශ්‍රිතව රූගත කරන ලද මෙය "ශාලිකා රූ ශ්‍රී" නිෂ්පාදනයක් වන අතර එහි පිටපත අජිත් මෙන්ඩිස් ගෙනි.

## සරසවි සෙත් සෙවන ආයතනයේ සේවාවන් තවත් පුළුල් කෙරේ

බොහෝ සිසු දරුවන්ගේ ඉල්ලීම පරිදි කැලණිය විශ්ව විද්‍යාලයේ B.Com විශේෂ උපාධියට අමතරව B. B Managment උපාධියට ද ලියාපදිංචි වූ සිසු දරුවන්ට ද උපාධිය සමත් වන තුරු ඊට අදාළ සියලුම පාඨමාලාවන් මේ ආයතනයේ දී නොමිලේ හැදෑරීමට අවස්ථාව ඇත.

## කිතු රස වින්දන

දෙසතියකට වරක් ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය වන "කිතු රස වින්දන" වැඩසටහන "නව වසරට ගමනක්" ප්‍රවීන ගුවන් විදුලි නාට්‍ය රචක ලෙනාර්ඩ් කුරේ විසින් රචනා කොට 2015 ජනවාරි 4 දින (අද) රාත්‍රි 7.30 ට විකාශනය කැරේ.


## ඉංග්‍රීසි ඉගෙනීමට ආසා ඇති අයට පමණකි

ඉංග්‍රීසි භාෂාව කථාවට හා ලිවීමට උනන්දුව ඇති අයට කරන ඇරියුමකි. පුද්ගල සංවර්ධනය අලලා විනයානුකූලව පංති පැවැත්වේ.

### ත්‍රෛමාසික පාඨමාලාවකි

උසස් පෙළ විභාගයට මුහුණ දුන් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි ගැහැණු ළමුනට නේවාසික පහසුකම් සැපයේ පාඨමාලා සැපයේ.

**පිරිමි ළමුන්ට**

උදේ 8.30 සිට සවස 3.30 දක්වා දිනකට
පැය 5 1/2 ක් පංති පැවැත්වේ.
බ්‍රහස්පතින්දා හා ඉරිදා හැර අනෙක් දින 5 හේ
පන්ති පැවැත්වේ.
2015 ජනවාරි 12 වෙනි දින පංති අරඹන අතර
නේවාසික ඇරියන් 11 වන දා සවස 3 ත් 5 ත් අතර
පැමිණ ලියාපදිංචි විය යුතුය.

**හැකි ඉක්මනින් අයදුම් කරන්න.**

034-2222163
077-6862510

ගරු අධ්‍යක්‍ෂ පියතුමා
මැසනොද් යොවුන් පියස,
සා. වින්සෙන්ති නිවස, මග්ගොන


# භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන් ශුද්ධවරයට එසවීමට සූදානම් වීමේ නුවානය (ජනවාරි 5 - 13, 2015)

භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන් ශුද්ධවරයට එසවීමේ උතුම් පිළිවෙතට අපි සූදානම් වෙමින් සිටිමු. ඒ සඳහා සූදානම් වීමේ නුවානයේ දින නවයේ තේමාවන් "භා. ජුසේවාස් මුනිඳුන් සමඟ ප්‍රසාද නිධාන හත ඔස්සේ යන ආධ්‍යාත්මික ගමනක්" ලෙස දක්වා ඇත. මේ ශුද්ධවරයට එසවීම සමඟ අපිද ආධ්‍යාත්මිකව පිරිපුන් නව දිවි මඟක් අරඹමු.

**පළමු තේමාව (ජනවාරි 5, 2015)**
"ජුසේවාස් මුනිඳුන් දිවි මගෙන්, ප්‍රසාද ස්නාපනීය කැඳවීමට ප්‍රතිචාර දක්වමු...."
(ලූක් 3:21-22, 4:18-19)

**දෙවන තේමාව (ජනවාරි 6, 2015)**
"දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ සාංඝික වෙමින් සහා නවෝදයකට පිවිසෙමු අපි,
ජුසේ වාස් මුනිඳුන් සමඟින්...." (ජොහන් 6:50-51,56)

**තුන්වන තේමාව (ජනවාරි 7, 2015)**
"සමඟි සන්ධානය තුළ දෙවිඳුන් හා ඒකාබද්ධ අපි, අප මුනිවරයාණන් සේ...."
(ජොහන් 20:22-23)

**හතරවන තේමාව (ජනවාරි 8, 2015)**
"ශ්‍රී ලංකා අපෝස්තුළුවරයාණන්ගේ දිවි මඟ අනුසාරයෙන් සුභ වදනේ
සාක්ෂිකරුවෝ වෙමු...." (ජාකෝබ් 5:15-16)

**පස්වන තේමාව (ජනවාරි 9, 2015)**
"පවුල් දිවි මඟ තුළ මාංශගත වෙමු, අපි ජුසේවාස් මුනි මධ්‍යස්ථකමෙන්...."
(එපීසි 5:23-24)

**හයවන තේමාව (ජනවාරි 10, 2015)**
"එඬේරුන් වෙමු, අපි හෙළයේ මහා ධර්මධරයාණන් වූ ජුසේවාස් මුනිඳුන් මෙන්...."
(ජොහාන් 7:37-39, ගලාති 5:22-23)

**හත්වන තේමාව (ජනවාරි 11, 2015)**
"ගතින්, සිතින් රෝගීවූවන් සොයා යමු අපි ජුසේවාස් මුනිඳුන් සේ...." (මාක් 6:53-56)

**අටවන තේමාව (ජනවාරි 12, 2015)**
"දෙව් මව් බැතියට මුලපුරමු අපි, ජුසේවාස් මුනිඳුන් සේ...."
(ජොහාන් 19:27, ක්‍රියා 1:38)

**නමවන තේමාව (ජනවාරි 13, 2015)**
"සුදුතුම් පියාණන් හා සුදු සබය වෙනුවෙන් යදිනෙමු අපි සැම ජුසේවාස් පිය
සමඟින්...." (එපිසි 6:18-20, මතෙව් 16-18)

## "භක්ති ප්‍රබෝධන" සුහද හමුව - 2014

**නිර්මල මරිය නිකාය මඟින් ප්‍රකාශයට පත් කරන "භක්ති ප්‍රබෝධනය" මාසික කිතුනු සඟරාවේ ලේඛක ලේඛිකාවන්ගේ හා බෙදාහැරීමේ නියෝජිතයින්ගේ වාර්ෂික සුහද හමුව පසුගියදා මරදාන සමාජීය හා සාමයීය කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ.**



"භක්ති ප්‍රබෝධනය" සඟරාව නව මුහුණුවරකින් එළිදැක්වීම, ප්‍රබෝධන ප්‍රකාශන නිකුත් කිරීමේ වැඩපිළිවෙල යටතේ ප්‍රකාශයට පත් කෙරුනු ප්‍රථම කෘතිය වූ ගරු ඩේමියන් ප්‍රනාන්දු නි.ම.නි පියතුමන්ගේ "නසන්න එපා" ග්‍රන්ථය එළිදැක්වීමද මෙහිදී සිදුවිය.

නිර්මල මරිය නිකායේ ප්‍රාදේශීය ශ්‍රේෂ්ඨාධිපති අතිගරු රොහාන් සිල්වා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රවීන සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායකයන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම සුහද හමුවේ දිව්‍ය යාගය සඳහා ජාතික කතෝලික ජනසන්නිවේදන කේන්ද්‍රයේ අධ්‍යක්‍ෂ ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා ද හවුල් විය.

"භක්ති ප්‍රබෝධනය" සඟරාව නවතම මුහුණුවරකින් නව මුද්‍රණ කඩදාසියක කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණයක් ලෙසින් එළිදැක්වීම ද මෙදින විශේෂත්වයක් ගෙන තිබූ අතර මෙම අවස්ථාවට කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්‍ෂ ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා සමඟ "ඥානාර්ථ ප්‍රදීපය" සංස්කාරක ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි පියතුමන්ට සහභාගි වූහ.

මෙම සුහද හමුවට ප්‍රබෝධන ලේඛක ලේඛිකාවන් හා බෙදාහැරීමේ නියෝජිතයින් රැසක්ම සහභාගි වී සිටි අතර හමුව මෙහෙයවූයේ "සිරස" මාධ්‍ය ජාලයේ ප්‍රවීන නිවේදක ප්‍රියන්ත විජේසිංහ මහතා විසිනි. භක්ති ප්‍රබෝධන සංස්කාරක ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි. පියතුමා සමඟ සංස්කාරක මණ්ඩලය මෙම හමුව සංවිධානය කළහ. **(සේයා සටහන - ටී. සුනිල් ප්‍රනාන්දු)**



# රජෙක් උපන්නා!

**ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 04 ඉරිදා**

## නුවාන යාච්ඤාව

අති දයාබරිත දෙවි පියාණනි, ඔබවහන්සේ භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන් ශ්‍රී ලංකාවේ අපෝස්තුළු වරයාණන් වශයෙන් අපට දානය කිරීම වෙනුවෙන් ඔබවහන්සේට හෘදයංගම ස්තුති ප්‍රශංසා කරමු.


දරුණු පීඩන සමයකදී ශ්‍රී ලංකාවේ අප මුතුන් මිත්තන් වූ කතෝලික සැදැහැවතුන්ගේ විශ්වාස රැක දෙමින් ඔවුන් දහමින් පෝෂණය කළ ජුසේවාස් මුනිඳුන් ශුද්ධවරයට එසවීම තුළින් එතුමන් වඩාත් කැපවීමෙන් අනුගමනය කිරීමට අපට මඟ සලසනු මැනව. එතුමන්ගේ මැදහත් කමින් අපගේ විශ්වාසයේ ජීවිතයට එරෙහි වන සියලු අභියෝග වලින් අප රැකගත මැනව.

දෙවි සමිදාණනි, ඔබවහන්සේගේ පුතණුවන්වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟ ශුභාරංචිය ජනජීවිතයේ ජීවත් කරවනු සඳහා ඔබගේ දහම් සේවකයා වූ භා. ජුසේවාස් මුනිදුන් පියවර ගත්තේ අපට ආදර්ශයක් දෙමිනි.

එතුමා ශුභාරංචි වදන දේශනා කරමින්, රෝගින්ට සුවය ලබා දෙමින්, අසරණ අයට සරණය වෙමින්, පීඩිතවූවන්ට සහය ලබා දෙමින් ඔබවහන්සේගේ ප්‍රේමය හා බලය සාක්ෂි දැරීය. එතුමාගේ මධ්‍යස්ථකමින් අපගේ විශ්වාසය ශක්තිමත් කළ මැනව. රෝග වලින් සුවය දානය කළ මැනව, ජීවිතයේ දැවෙන ප්‍රශ්න වලදී අපට සහනය ලබා දුන මැනව. වියවුල් දුක්වේදනා වලදී අපට මඟ පෙන්වීම සහ සහනය ලබා දුන මැනව.


අපගේ මව්බිම සහ සභාව වෙනුවෙන් විශේෂයෙන් යාච්ඤා කරමු. ශ්‍රී ලංකා අපෝස්තුළුවරයාගේ මැදහත්කම තුළින් අපට සාමය, සහෝදරත්වය තුළ එකම ජනතාවක්සේ පූර්ණ වර්ධනයකට යාමට මග සැලසුව මැනව.


මේ කීදේ අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උදෙසාම අපට ලැබේවා. ආමේන්.



## ප්‍රැන්සිස් පෙරේරා ගුරු පියාණනි ඔබට සදා සාමය





සග සැපත් කැලණිය, දළුගම ප්‍රැන්සිස් පෙරේරා ගුරු පියාණනි, ඔබ සැබවින්ම ගුරු පියෙකි. නිහඬ සමාජ සේවියෙකි. උතුම් මිනිසෙකි. මිනිසත් බව උගන්වාලූ නිහතමානි යුග පුරුෂයකුම විණි. ඔබ ගුණ ගැයීමට අපට වදන් නැතත් මිනිසකු ලෙස ඔබ මනු ලොව තබා යන මිනිස්කම අපි සදා අගයමු.

බොරැල්ල සා. ඇලෝසියස් දෙව්සත්හලෙහි ආචාර්යවරයකු ලෙස පනස් වසරක් පුරා ඔබ කළ මෙහෙවර, කියා දුන් දහම, උතුරා යන මිනිස්කම එදා මෙන් අදත් නූතන කිතුනු ගුරු භවතුනට මෙන්ම අන් හැමටත් මා හැඟි ආදර්ශයකි.

ගුරු පියාණනි, ඔබගෙන් සිප් සතර හැදෑරූ පූජක සිසුන් අද කිතු දහම් නියමුවෝ වෙති. සමාජයේ විවිධ නිලතල දරන්නෝ ද වෙති. ඒ හැම ඔබට ණය ගැති වෙති.

ගුරු පියාණෙනි,
"පහනින් පහන් සිය ගණනක් ඇවිලුවද
ඒ පහන් සිළෙහි අළු අඩු නොව දිලෙන ලෙද " යනුවෙන් එදා සුභාෂිත කතුවරයා පැවසුයේ ඔබ වන් උතුම් මිනිසුන් ගැන නොවේ ද?

"ප්‍රදීපය" පාඨක අපිදු ඔබට සදා සාමය පතමු!

**සටහන - ලියෝ එෆ්. දිසානායක**

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55